## 2022/07/12 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව

2022/07/12 දින පෙ.ව. 09.00 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගී වූ**

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ | ගරු මන්ත්‍රී |
| 7. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 8. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 10. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 11. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 12. | එඩේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 13. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 14. | සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 15. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 16. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 17. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 18. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 19. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 20. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 21. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 22. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |
| 24. | ප්‍රියංගිකා දිල්රුක්ෂි ඒකනායක | ගරු මන්ත්‍රිනී |

**සහභාගී නොවූ**

| | | |
|---|---|---|
| 1. | එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 2. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 3. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |

**01. ආගම සිහි කිරීම**

2022.07.12 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කිරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

**02. මූලාසනයේ පිළිගැනීමේ කතාව**

සියලු දෙනාටම සුභ දවසක්. අද නාගොඩ ප්‍රාදේශීය සභා මහා සභා වාරය පටන් ගන්න මොහොතේ මොන බාධක තිබුනත්, ඒ අපහසුතාවන් මැද සහභාගි වෙලා ඉන්න උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය ඉතාම ගෞරවයෙන් පිළිගනු ලබනවා.

**(අ)01. 2022.06.21 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.**

**(අ)02. පසුගිය වාර්තාවේ සංශෝධන ඉදිරිපත් කිරීම**

වෙනත් කරුණු යටතේ ගරු මන්ත්‍රි චන්ද්‍ර සහබන්දු මහතාගේ කතාවේදී **"**විදේශීකයෝ ආවට පස්සෙ , ආයුබෝවන් කියලා මල් මාල දාලා, රටවැසියෝ සංතෝෂ වෙන්න ඕන වෙලාවෙ ජනතාව ගිහින් පිකටින් කරනවා. ප්‍රාදේශීය ලේකම්වරයට යන්න දුන්නෙත් නැහැ. මුදල් ඇමතිවරයාට යන්න දුන්නෙත් නැහැ."

මෙහි **ප්‍රාදේශීය ලේකම්වරයා** වෙනුවට **මුදල් අමාත්‍යාංශ ලේකම්** යනුවෙනුත්, **මුදල් ඇමතිවරයා** වෙනුවට **අග්‍රාමාත්‍යවරයා** යනුවෙනුත් නිවැරදි විය යුතුය.

ඒ අනුව ඉහත සංශෝධනයන්ට යටත්ව 2022.06.21 දින පැවති මහා සභාවේ සභා වාර්තාව සභාව පිළිගතයුතු සත්‍ය වාර්තාවක් ලෙස ගරු උපසභාපති එම්.කේ.ගාමිණී සුසන්ත මහතා විසින් යෝජනා කළ අතර, ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**(ආ). සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

**නැත.**

**(ඇ). සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම**

**(ඈ). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

නැත.

**(ඉ). (1) යථා පරිදි කල් දී ඇති යෝජනා**

01. තල්ගස්වල නගරය සඳහා වෙළඳ සංකීර්ණය ඉදිකිරීම අදියර 1 ව්‍යාපෘතියේ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු වන ඇල්පිටිය SNJK කන්ස්ට්‍රක්ෂන් ආයතනය හා සභාව සමඟ ඇති ගිවිසුම අවලංගු කිරීමටත් නැවත ප්‍රතිපාදන සපයා ගැනීමෙන් පසු ඉදිරිවැඩ කිරීමටත් යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**07. ඉදිරි ගෙවීම් වාර්තාව ඉදිරිපත් කිරීම**

<u>**2022.07.**12 වන දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම් වාර්තාව</u>

**01. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව, නාගොඩ**

I. 2022 ජුනි මස මන්ත්‍රීවරුන් සඳහා ඉන්ධන ලබා ගැනීමේ බිල්පත **- රු.81,000.00**

II. සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීම **- රු. 4,905.00**

III. සභාපතිතුමාගේ රාජකාරි අවශ්‍යතාවයක් සඳහා SPPF 7360 කැබ් රථය අධිවේගී මාර්ගයේ ගමන් කිරීම වෙනුවෙන් මුදල් ප්‍රතිපූර්ණය කිරීම **-රු. 1,350.00**

**02. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය, අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල**
හිඟ විගණන ගාස්තු ගෙවීම **- රු.10,000.00**

03. **නීතිඥ හේමන්ත පී. ඩබ්. විතාරණ මයා, අංක 24, ලේන්බනේ වීදිය, කොටුව, ගාල්ල.** **-රු.10,000.00**
2022.06.20 දින L- 36 නඩුවට අදාළව නීතිඥ ගාස්තු, පෙනී සිටීමේ ගාස්තු, මුද්දර ගාස්තු සඳහා වියදම

**04. එල්. එස්. ආර්. විජේතිලක, නාගොඩ, ගාල්ල** **- රු.6,000.00**
නාගොඩ කැකුලු පෙර පාසල පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල සඳහා 2022 ජූලි මස බදු කුලිය ගෙවීම

**05. එම්.ජේ. ජනිත් ඉරේෂ්, කුමාර, ජාගොඩ කේක් ඇන්ඩ් ස්වීට්ස්, ඉහළ ලේලවල, ගා/ වඳුරඹ** **-රු.12,854.00**
2022.06.**21** දින පැවති මහ සභා වාරය සඳහා සංග්‍රහ වියදම් බිල්පත පියවීම

**06. ජී.එල්. ලක්මාලි, සාරංග ෆුඩ් සිටි, ඇතුමලේ, මාපලගම** **-රු.2,450.00**
**2022.06.21** දින පැවති මහා සභා වාරය සඳහා වතුර බෝතල් මිලදී ගැනිමේ බිල්පත පියවීම

**07. ඒ.කේ නිලන්ති සජීවනී, ග්‍රාෆ්ටෙල් කොමියුනිකේෂන්, යටලමත්ත.** **-රු. 4,004.00**
**2002 ජුනි මස සභා වාර්තා පිටපත් 28ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් බිල්පත් පියවීම**

**08. ඒ.ඩී. කරුණාරත්න, සරත් ස්ටෝර්ස්, යටලමත්ත** **-රු.10,010.00**
**2022 ජුනි මාසය සඳහා නාගොඩ පුස්තකාලයට පුවත්පත් මිලදී ගැනීමේ බිල්පත පියවීම**

**09. එච්. එල්. කේ. ශ්‍රීනිත් රුක්ෂාන්, සමගිගම, උඩුගම දකුණ, ගා/උඩුගම**

2022 ජුනි මාසය තුළ දී උඩුගම මහජන පුස්තකාලයට පුවත්පත් සැපයීම වෙනුවෙන් බිල්පත් පියවීම **-රු.8,310.00**

**10. නානයක්කාර හාඩ්වෙයාර්, නාගොඩ, ගාල්ල**

ප්‍රධාන කාර්යාලයේ ජල නල පද්ධතිය අලුත්වැඩියා කිරීමට අවශ්‍ය උපාංග ලබා ගැනීමේ බිල්පත පියවීම. **-රු. 765.00**

**11. නිව් සදර්න් ඔටෝ එයාර්කන්ඩිෂන්, මොරිස් මාවත, අම්බලන්වත්ත, ගාල්ල.** **-රු. 22,800.00**

SPPF 7360 අංක දරණ කැබ් රථයේ වායු සමීකරණ පද්ධතිය අලුත්වැඩියා කිරීමේ බිල්පත පියවීම.

12. අබේනායක ඔටෝ සර්විස්, ගාල්ල **- රු.41,700.00**

PF 7360 අංක දරණ කැබ් රථය සේවා කිරීමේ බිල්පත පියවීම

**13. ලංකා තෙල් පිරවුම්හල, නාගොඩ**

නාගොඩ ප්‍රාදේශීය සභාවේ වාහන සහ අනෙකුත් අවශ්‍යතා සඳහා ඉන්ධන ලබා ගැනීමේ බිල්පත පියවීම **-රු.211,840.00**

| දිනය | වාහන අංකය | ඇණවුම් අංකය | වර්ගය | ප්‍රමාණය (l) | වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|
| 2022.05.04 | PF 7360 කැබ්රථය | 370270 | ඩීසල් | 51 | 14,739.00 |
| 2022.05.17 | | 370272 | | 69 | 19,941.00 |
| 2022.05.23 | | 370277 | | 50 | 14,450.00 |
| 2022.05.27 | | 370279 | | 52 | 20,800.00 |
| 2022.05.31 | | 370281 | | 55 | 22,000.00 |
| | | | **එකතුව** | **277** | **91,930.00** |
| 2022.05.28 | 252-6478 කැබ් රථය | 370280 | ඩීසල් | 30 | 12,000.00 |
| | | | **එකතුව** | **30** | **12,000.00** |
| 2022.05.28 | 252-6478 කැබ් රථය | 370280 | DS 40 ඔයිල් | 01 | 2,400.00 |
| | | | **එකතුව** | **01** | **2,400.00** |
| 2022.05.23 | LL 7650 කෘ කැබ් රථය | 370276 | ඩීසල් | 50 | 14,450.00 |
| | | | **එකතුව** | **50** | **14,450.00** |
| 2022.05.03 | LL 7366 ට්‍රක් ජල බවුසරය | 370268 | ඩීසල් | 50 | 14,450.00 |
| 2022.05.17 | | 370273 | | 50 | 14,450.00 |
| | | | **එකතුව** | **100** | **28,900.00** |
| 2022.05.05 | SPRA 8570 | 370271 | ඩීසල් | 35 | 10,115.00 |
| 2022.05.19 | | 370274 | | 45 | 13,005.00 |
| | | | **එකතුව** | **80** | **23,120.00** |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2022.05.20 | LL 7103 | 370275 | ඩීසල් | 100 | 28,900.00 |
| | | | **එකතුව** | **100** | **28,900.00** |
| 2022.05.23 | ගබඩා කර තබා ගැනීම සඳහා | 370278 | පෙට්‍රල් | 25 | 8,450.00 |
| | | | **එකතුව** | **25** | **8,450.00** |
| 2022.05.04 | මාසික මහා සභා වාර්තා බෙදා දීම සඳහා | 370269 | පෙට්‍රල් | 05 | 1,690.00 |
| | | | **එකතුව** | **05** | **1,690.00** |
| | | | **මුළු එකතුව** | **668** | **211,840.00** |

**2022.05.24 සිට සංශෝධිත මිල ක්‍රියාත්මක වේ.**

14. සවුත් නෙට් ටෙක්නොලජි ප්‍රයිවට් ලිමිටඩ්, වක්වැල්ල පාර, ගාල්ල. **- රු.9,800.00**
    HP 1005 ප්‍රින්ටරය අලුත්වැඩියා කිරීමේ බිල්පත පියවීම

15. ජෝන් කීල්ස් ඔෆිස් ඔටෝමේෂන් ප්‍රයිවට් ලිමිටඩ්, යූනියන් පෙදෙස, කොළඹ 02 **-රු.129,441.24**
    Toshiba ඡායා පිටපත් යන්ත්‍රයේ අලුත්වැඩියා සඳහා අවශ්‍යය උපාංග සපයා ගැනීමට අදාළ බිල්පත පියවීම.

16. යශෝධරා රශිනි නාගොඩවිතාන මිය, ආනන්දගිරි, නාගොඩ , ගාල්ල
    සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී දීමනාව ගෙවීම - **- රු.14500.00**

**17. <u>සේවක ණය</u>**

**පාපැදි ලබා ගැනීම සඳහා ණය මුදල**

| | | |
|---|---|---|
| අනුර දිසානායක | - රියදුරු | **-රු.6,000.00** |
| බී.ජී. පියතිලක | - රියදුරු | **-රු.6,000.00** |
| එම්.එම්.මහින්දදාස | - වැඩ ක්ෂේත්‍ර කම්කරු | **-රු.6,000.00** |
| ඩබ්.ජී. දයානන්ද | - වැඩ ක්ෂේත්‍ර කම්කරු | **-රු.6,000.00** |
| එම්. ඩබ්. හර්ෂ කුමාර | - සෞඛ්‍ය කම්කරු | **-රු.6,000.00** |

**18. <u>2022 ජුනි මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරින් සඳහා)</u>**

| | | | |
|---|---|---|---|
| I. | මානෙල් සුදර්ශනී මිය | - සංවර්ධන නිලධාරී | **- රු.4,690.00** |
| II. | කේ.ඩී.එස්.නිපුනිකා මිය | - සංවර්ධන නිලධාරී | **- රු.6,050.00** |
| III. | ඩබ්.ජේ.ඒ. ශානක මයා | - ආදායම් පරීක්ෂක | **-රු.4,000.00** |

**19. <u>2022 ජුනි මස ගමන් වියදම්</u>**
***<u>ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්</u>***

| | | | |
|---|---|---|---|
| I. | නිමල් වික්ටර් නාගොඩවිතාන මයා | - ගරු සභාපති | **- රු.3,000.00** |
| II. | කේ.ඩී.එස්.නිපුනිකා මිය | - සංවර්ධන නිලධාරී | **-රු.2,910.00** |
| III. | කේ.ජී.ඩී.ඩී සේනාරත්න මයා | - සංවර්ධන නිලධාරී | **- රු. 790.00** |
| IV. | එම්.ඒ.වසන්ත මයා | - රියදුරු | **- රු2,100.00** |

**20. <u>අතිකාල දීමනා ගෙවීම්</u>**

**<u>2022 ජුනි මස</u>**

| | | | |
|---|---|---|---|
| I. | එම්.ඒ.වසන්ත මයා | - රියදුරු | **- රු. 9,226.40** |
| II. | කේ.එච්.එම් කැලුම් චාමර | - රියදුරු | **- රු. 1,284.00** |
| III. | කේ. එච්.එම් නිශාන්ත ඉදුනිල් | - රියදුරු | **- රු. 6,662.36** |
| IV. | ඩී.ටී.ආර්.ඒ. ගුණරත්න මයා | - මුරකරු | **- රු. 4,280.00** |
| V. | යසරත්න විජේසේකර මයා | - මුරකරු | **- රු. 7,225.00** |
| VI. | ඩබ්.කේ. සම්පත් සංජීව මයා | - අනියම් රියදුරු | **- රු. 7,811.00** |
| VII. | එන්.එම්.රජිත් මයා | - අනියම් මුරකරු | **- රු. 4,747.00** |
| VIII. | ජී.එල්.උපුල් ධර්මසිරි මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | **- රු. 1,144.00** |
| IX. | අයි.කේ. ඉන්දික මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | **- රු.2,205.00** |
| X. | යූ.ජී.රංජිත් උදය කුමාර මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | **- රු.1,080.00** |
| XI. | කේ.ජී.හර්ෂ කුමාර මයා | - සෞඛ්‍ය කම්කරු | **-රු. 404.00** |
| XII. | එම්.ඩබ්ලිව්.හර්ෂ කුමාර මයා | - සෞඛ්‍ය කම්කරු | **- රු.1,605.00** |
| XIII. | ඩබ්. ජී. දයානන්ද | - සෞඛ්‍ය කම්කරු | **- රු 3,500.00** |

**ඒ අනුව ඉදිරි ගෙවීම් වාර්තාවේ සදහන් අංක 1 – 20 දක්වා ඇති ඉදිරි ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව ගරු සභාපතිතුමන් කල යෝජනාව ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**(ඉ) 2. රැස්වීම් රීති 11(8) යටතේ ඉදිරිපත් කරන යෝජනා.**

**01. ආදාහනාගාරයේ ඉතිරි වැඩ කටයුතු නිම කිරීම සඳහා දේශීය ණය අරමුදලින් ණය මුදලක් ලබා ගැනීමට යෝජනා කරමි.**

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**02. ආදාහනාගාරයේ කොන්ත්‍රාත් ගිවිසුම 2022.08.09 දිනෙන් අවසන් වන බැවින්, එය තව මාස 03 ක කාලයකට දීර්ඝ කර දෙන ලෙස යෝජනා කරමි.**

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**02.ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

01. Epson LQ 2090, jolimark DP 350, HP Laserjet 1536 ප්‍රින්ටර් සේවා කිරීමේ වාර්ෂික ගිවිසුම සඳහා ගෙවීම - රු. 18144.00

**ඉහත සඳහන් ඇස්තමේන්තු සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රීනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**03. මිළ ගණන් ඉදිරිපත් කිරීම**

**PF 7360 කැබ් රථය අළුත්වැඩියා කිරීම සදහා ලැබී ඇති මිළ ගණන්**

| අනු අංකය | විස්තරය | සේන මෝටර්ස්, ඇන්ඩ් සර්විස්, නාගොඩ | ග්‍රෑන්ඩ් මෝටර්ස්, වදුරඹ | ලාල් මෝටර්ස්, නාගොඩ |
|---|---|---|---|---|
| 01 | පිටුපස බපර් එකට සම්බන්ධ කර තිබූ පෝක් ලයිට් බැකට් රෙපෙයාර් කර පේන්ට් කිරීම | රු. 8000.00 | රු. 8500.00 | රු. 9500.00 |
| 02 | ඉදිරිපස එන්ජිමට සම්බන්ධ කර තිබූ ගාඩ් එක ගලවා සම්බන්ධ කර සකස් කර පේන්ට් කිරීම | රු. 4500.00 | රු. 6500.00 | රු. 7000.00 |
| 03 | ඉදිරිපස බපර් එක ගලවා පේන්ට් කිරීම | රු.2500.00 | රු. 2000.00 | රු. 1500.00 |
| 04 | ඉදිරිපස වැසිය සම්පූර්ණයෙන් පේන්ට් කිරීම | රු.5000.00 | රු. 7000.00 | රු. 7500.00 |

**PF 7360 කැබ් රථය අළුත්වැඩියා කිරීම සදහා ලැබී ඇති මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කල සේන මෝටර්ස්, ඇන්ඩ් සර්විස්, නාගොඩ** වෙතින් **PF 7360 කැබ් රථය අළුත්වැඩියා කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් යෝජනා කරනු ලදුව, ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඊ) කාරක සභා වාර්තා**

01.2022.07.01 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව

**(උ). ලැබීම් හා ගෙවීම් වාර්තා**

නැත.

**(ඌ) වෙනත් කරුණු**

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා**

ගරු සභාපතිතුමනි, නාගොඩ ප්‍රාදේශීය සභා, මාසික සභා රැස්වීමේදී, අද දවස මේ ප්‍රාදේශීය සභාවේ කතා කරන්න ලැබෙන අවසාන අවස්ථාව වෙයි කියලත් මම විශ්වාස කරනවා. ප්‍රජාතන්ත්‍රවාදය කුණු කූඩයට ගිහිල්ලා, අද අවනීතිය රජ වෙච්ච වෙලාවක, සම්පූර්ණයෙන් අපේ පත්වුනු කොන්ද පන නැති නායකයෝ මේවට වගකියන්න ඕන. ඒක මම මේ වෙලාවේ පළමුවෙන් සඳහන් කරනවා. මොකද අපි මේ රජය පිහිටුවන්න ඉතාම වෙහෙස මහන්සි වෙලා කටයුතු කරලා, 2/3 බලයක් අරන් දීලා, ඒ වගේම ප්‍රාදේශීය සභා බලය ලැබිලා, ජනාධිපතිවරණයේදී හැටනම ලක්ෂයක් ලබා දීලා, ඒ වගේම පාර්ලිමේන්තු මැතිවරණය 2/3 ට

එහා ගිහිපු බලයක් ලබාගෙන, රජයක් හැටියට අවුරුදු 2 1/2තුළ, මම හිතන්නේ රජයක් ලෙස සාර්ථක හෝ අසාර්ථක භාවය පිළිබඳව කතා කරන්න. අද මොකද එළිපිටම, එහි හෙලු තතු අද අපි සැමදෙනාටම අත්විඳින්න සිදුවෙලා තියෙනවා. එහි ඵලවිපාක විශේෂයෙන්ම ප්‍රාදේශීය පක්ෂ, විපක්ෂ අපි සියලු දෙනාම එක විදිහටම අද භුක්ති විඳිනවා. මොකද අපි මේ මැතිවරණයකට අද ඉදිරිපත් වුණේ අපි හැදෙන්නවත්, අපේ දේ වර්ධනය කර ගැනීමේ අරමුණෙන් නෙවෙයි. ගමට සේවාවක් කිරීමට තමයි අපි ප්‍රාදේශීය සභාවට පත් වුණේ. මම හිතන්නේ මේ නාගොඩ ප්‍රාදේශීය සභාවේ පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු විසි හත් දෙනාම ගත්තම, මම හිතන්නේ ඒ පරමාර්ථයෙන් තමයි හැමදෙනාම මැතිවරණයකට ඉදිරිපත් වෙලා ඒ තත්ත්වෙ උදා කරගත්තේ. ඒ නිසා එහෙම යන අතරතුරේ දී අපිත් කනගාටුවට පත් වෙනවා. මේ සිදුවන සිදුවීම් සම්බන්ධව. ඒ වගේම අපටත් මේකෙන් බැහැර වෙන්න බැහැ. ගම් වල නායකත්වය අරගෙන කටයුතු කිරීම සම්බන්ධයෙන් අපටත් කළකිරීමක් වගේම, යම් වූ ප්‍රශ්නකාරී අවස්ථාවක් උදාවෙලා තියෙනවා. ඉතින් ඒ නිසා ඇත්ත වශයෙන්ම මේ වෙලාවේ කවුරු මොන දේවල් මොන විදිහට කතා කළත්, මම හිතන්නේ මේ රටේ නොවිය යුතු සිදුවීම් මාලාවක් සිදු වෙමින් පවතින මේ අවස්ථාවේදී මම නම් විශ්වාස කරනවා. මේ විදිහට ගත වුනොතින් මම හිතන්නේ රටේ අනාගතය පිළිබඳව ලොකු ගැටළුවක් මතුවෙනවා. දීර්ඝ වශයෙන් කතා නොකළත්, ඇත්ත වශයෙන්ම රටේ මීට මාසෙකට කලින් මම හිතන්නේ ලංකාවේ ගෙවල් තුන්සිය ගානක් විනාශ කලා. ඒ විනාශ කිරීමෙන් මගේ හා සුභාෂි මන්ත්‍රීතුමියගේ නිවාස දෙකත් සම්පූර්ණයෙන් විනාශ වුණා. ඉතින් එහෙම කාලයක් තුළදී, අපි හිතුවා නිවැරදි මාවතකට ගමන් කරලා, නිවැරදිව කටයුතු කරයි කියලා. නමුත් අද රටේ ආරක්ෂක අංශ, නීතිය ආරක්ෂා කරන අය, රටේ නීතිය වෙනුවෙන් පෙනී සිටින අප සියලු දෙනා, අන්ධ වෙච්ච අවස්ථාවක් ලෙස දකිනවා. එවිට මේකෙ සාමාන්‍ය මිනිස්සු අද ගෙදර දොරේ ජීවත් වීමට පවා බැරි තත්ත්වයට පත් වෙලා. මොකද මේ රටේ කිසිම නීතියක් නැහැ. ව්‍යවස්ථාවක් නැහැ. එහෙමනම් අපි දකින්න ඕන. යම් දෙයකට කණ්ඩායමක් සූදානම් වෙනවා නම්, මම හිතන්නේ මම පසුගිය කාලේ අරගලයක් තිබුණා. මම දන්නැහැ. සාමකාමී අරගලය කියන්නේ මොකක්ද කියලා. නමුත් එක්තරා කණ්ඩායමක් බළල්ලු ලවා කොස් ඇට බැවීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා.

මේ වෙනකොට අපි නිදහස ලැබීමෙන් පසුව, අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට මරු පහරක් වැදුණු දවසක් ලෙස කියන්න පුළුවන්. 89 ජනතා විමුක්ති පෙරමුණ transformer කඩලා කළ විනාශයට වඩා වැඩි විනාශයක් අද මේ රටට කරලා තියෙනවා. මම හිතන්නේ ඇත්ත වශයෙන්ම සාමාන්‍ය ජනතාව තෙල් පෝලිමේ, ගෑස් පෝලිමේ, බඩුමුට්ටු ටික නැති වෙලාවක ඒකෙන් අයුතු ප්‍රයෝජනයක් ගත්තා කියල මම හිතනවා. ඒ වගේම අපේ පාලකයෝ අතින් හොඳ වගේම නරකත් සිද්ධ වුණා. කොරෝනා වසංගතය ආවහම, දියුණු හැම රටකම මිනී ගොඩවල් ගහනකොට, අපේ රටේ එහෙම තත්ත්වයක් උදා වුණේ නැහැ. කොහොමහරි ණයට බෙහෙත් ගෙනල්ල හරි සියලු දෙනා ශක්තිමත් වුණා. රට වහලා තිබුණා. ඒ වගේම ජාතියක් හැටියට හැමදෙනාම පිළිගන්න ඕන. ඊලඟ දවසෙ බඩු ටික අරගෙන නැව ලංකාවට එන්නේ නැත්නම්, අපට අපේ මූලික අවශ්‍යතාවය ඉටු කරගන්න බැරි වෙනවා. එනිසා බඩගින්නෙ ඉන්න සිදු වෙනවා. ඒ නිසා නිදහසෙන් පස්සේ පාලනය කළ අය වගේම, මේ රටේ ඉන්න රාජ්‍ය නිලධාරීන් පවා මේ වගකීමෙන් නිදහස් වෙන්න බැරි වෙනවා මොකද දේශපාලනඥයින් වගේම රාජ්‍ය නිලධාරීන් මේ කාර්යය තුළින් නිදහස් වෙන්න මිදෙන්න යම් කාර්යයක් ඉෂ්ට සිද්ධ කලේ නැහැ. රටේ අභාග්‍යසම්පන්න විදිහට තමයි වැඩ කළේ. අපිත් ඇත්තටම කණගාටු වෙනවා. මෙවැනි රාජ්‍ය නිලධාරීන් යටතේ මෙන්ම මෙවැනි දේශපාලනඥයින් යටතේ පුරවැසිභාවය ලබලා ජීවත් වෙන්න ලැබීම සම්බන්ධව. කොහොම වුනත් මේ වෙලාවෙදි කියන්න තියෙනවා. අද වන විට එදා 1948 නිදහස ලැබුනට පස්සේ ප්‍රජාතන්ත්‍රවාදීව ඒ රට පාලනය කරන, රජෙක් පහල වුනා නම්, ඒ පුද්ගලයාට හිමි වෙච්ච රජයේ රජගෙදර නොවිය යුතු දෙයක්, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු විදිහට ගෝඨාභය රාජපක්ෂ එළියට ඇදල දාන්න ඕන අපි. ජනාධිපතිව ඉදිද්දි, එක දවසක් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයකු ගෙන්වලා කතා කළේ නැහැ. 69 ලක්ෂයක් එකතු කරල දෙද්දි, අපි තමයි මුලින්ම මෙතුමාව එළියට ඇදලා දාන්න ඕන. එකේ පෙරමුණ හරි නම් අපි ගන්න ඕන. ඒක අද, මේ දේ වුන නිසා මම කියනවා නෙවෙයි. මෙතෙක් සිදුවූ සිදුවීම් මාලාව තුළදිම මම කිව්වා. ඇහුම්කන් නොදීම තමයි මෙහි පලවිපාක වුනේ. ඕනෑම පාසල් යන දරුවෙකුට පවා

මෙයින් ගත හැකි ආදර්ශය තමයි ඇහුම්කන් නොදීමේ ප්‍රතිවිපාක පිළිබඳ. ඉතින් ඒ නිසා මේ වෙලාවේ දී අරගලය කරලා යම් ජයග්‍රහණයක් ලබපු වෙලාවකදි, කිසිසේත් අනුමත කරන්න බැහැ. මේ රාජ්‍ය සම්පත් අයථා ලෙස පාවිච්චි කරමින් මේ වැරදි පූර්වාදර්ශයක් ලෝකයට ලබා දීම.

නිර්පාක්ෂික අරගලයේ ඉන්න පුද්ගලයන්ගේ පෞර්ෂයන් බිඳ දැමීමේ කාර්යය. ඒවගේම මේකෙ නායකත්වය ගන්න කට්ටිය ඉන්නවනම්, අද වන විට මේ රාජ්‍ය යාන්ත්‍රණය හෝ මේ රාජ්‍ය යාන්ත්‍රණය ශක්තිමත් කරන්න. ඊළඟට මේකේ මම කතාවේ සඳහන් කලා වගේම, ත්‍රිවිධ හමුදාව, පොලිසිය මේ කාර්යයන් සඳහා වගකියන්න ඕන. ඒ වගේම නීතිය ක්‍රියාත්මක කරන ආයතන, මේ සම්බන්ධයෙන් ඒගොල්ලොත් දිවුරුම් දීලා ඉන්නේ. ඒ කියන්නේ ගෝඨාභය රාජපක්ෂ මහත්තයාවත්, පාලකයෝවත් ආරක්ෂා කරන්න නෙවෙයි. ප්‍රජාතන්ත්‍රවාදීව මේ රජය ආරක්ෂා කරනවා කියන එක. ඒ අය ආරක්ෂා කරනවා කියලා නෙමෙයි රට ආරක්ෂා කරනවා කියලා. රටේ භෞමික අඛණ්ඩතාවය ආරක්ෂා කරනවා කියලා. මෙතනදි මරු පහරක් වැදිලා තියෙන්නේ. ඉතිහාසයේ මම හිතන්නේ නැහැ කවදාවත් නිවැරදි කරගන්න පුලුවන් වෙයි කියලා. ඒ වගේම මතක තියාගන්න. කොයි පක්ෂ පාට භේදයෙන් තොරව, සියලු දෙනාට දේශපාලනය කරන්න වෙන්නේ නැහැ ඉස්සරහට. දේශපාලනය කරන්න තියා ගෙදරකවත් ඉන්න වෙන්නේ නැහැ මේ තත්ත්වය උඩ. වහාම සංගායනාවක් කරලා මේක ඉතාම ඉක්මනින් සමථයකට පත් කර ගත්තේ නැත්නම්, අදටත් ත්‍රිවිධ හමුදාව මේ අරගල කරුවන් අත්පත් කරගත්ත ආයතන ටික සුරක්ෂිත කර ගත්තෙ නැත්නම්, මේකට පත් වෙන කෙනෙක් කවුරුත් කමක් නැහැ. පත්වෙන එක්කෙනෙකුටවත් ගිහිල්ලා වැඩක් කරගන්න හම්බ වෙන එකක් නැහැ. එහි තියෙන සම්පත් වලට මොනවද වෙන්නේ කියලා කවුරුවත් දන්නෙ නැහැ. එතන තිබුණු ලියකියවිලිවලට මොකද වෙන්නේ කවුරුවත් දන්නෙ නැහැ. පරිබාහිර කණ්ඩායමක් ඕක ඇතුලට ඇතුල් වෙලා. ඒකෙ එදා ඉඳලා තිබ්ච්ච රහස් තොරතුරු, සමහර වෙලාවට පත්වෙච්ච ජනාධිපතිවරයා දන්නෙත් නැහැ. එතන තිබෙන ඇතැම් ,ඒ පත්වෙච්ච ජනාධිපතිවරු පරිහරණය කරපු දේවල්, රටේ අනාගතය පිළිබඳව තිබෙන දේවල්, මේ සියලු දේවල් අද මහජන ගංගාවක් වගේ ගිහිල්ලා නරඹනවා. ඒක හරි වැරදියි. ඇත්ත වශයෙන්ම අපි අරගලයට විරුද්ධ නැහැ. අනිවාර්යෙන් එක ගැටළුවක් නැහැ. අපිත් එතන ඉන්නවා. නමුත් අද දවසේ මේ සිදුවන සිදුවීම් පිළිබඳව කිසිසේත්ම මේවා අනුමත කරන්න බැහැ. ඒ නිසා මේ වෙලාවේ මම පෞද්ගලිකවම කනගාටු වෙනවා. මම මේ ප්‍රාදේශීය සභාවේ ආපු කාලය තුළදී කිසිම කාලයක මෙවැනි ප්‍රාදේශීය දේශපාලනඥයෝ වගේම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් සමාජයේ ගණන් නොගන්න තත්ත්වයට පත්වෙලා තියෙනවා. අපි මන්ත්‍රීවරු ලෙස පත් වෙලා ඉන්නේ ගම නියෝජනය කරන්න. නමුත් අපි කොහේ හරි ආයතනයකට ගිහිල්ලා කතා කරද්දී, අපිව ගණන් ගන්නේ නැත්නම්, මොකද වෙලා තියෙන්නෙ? ප්‍රජාතන්ත්‍රවාදයට මරු පහරක් එල්ල වෙලා තියෙන්නේ. එ නිසා මේ වෙලාවේ ප්‍රශ්නයක් වෙලා තියෙන්නේ. මම හිතන්නේ නැහැ. මේ මොන කට්ටිය කතා කළත්, මේ ප්‍රශ්ණයෙන් මිදෙන්න බැහැ. අවසාන වශයෙන් කියන්න තියෙන්නේ, අපි දේශපාලන වශයෙන් හම්බ කරගත්තෙ නැහැ. කවුරුවත් මේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු විසි හත් දෙනාම අනිවාර්යෙන්ම පක්ෂ පාට භේදයකින් තොරව, කවුරු හෙට දවසේ මේ රට භාර ගත්තත්, මේ රට කරන්න හම්බ වෙන්නෑ ඉවසීම කියන එක නැති වුනොත් ඉතින් ඒ නිසා පාලකයින්ට මේවා කියන්න කියන්න, පාලකයෝ මේවා ඇහුවෙත් නෑ. ඒ නිසා ලොකු ප්‍රශ්ණයක් උදාවෙලා තියෙනවා. සුභාෂි මන්ත්‍රීතුමියටත් ඒ වගේම මටත් එදා අපට විශාල ප්‍රහාරයක් දියත් වුණා. අදට මාස දෙකක් ගත වුනත්, අපි හදපු ආණ්ඩු අපි කරපු දේශපාලනඥයෝ, අපේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු ටික ඇරෙන්න, ඒ වගේම දිස්ත්‍රික් නායක රමේෂ් පතිරණ මැතිතුමා, එතුමත් අසරණ තත්ත්වයක ඉන්නේ. ඒ අය කිහිප දෙනෙක් ඇරෙන්න අද වෙනකම් මේ සභාවේ මේ රටේ කවුරුවත් අපි වෙනුවෙන් සොයලා බැලුවේ නැහැ. ඒ නිසා අපි කියන්නෙ මට වගේම ඔබටත් හෙට දවසේ මේ දේ සිද්ධ වෙනවා. ඒ නිසා අපි ඉතාම කනගාටුවට පත් වෙනවා. මොන දේ තිබුණත් ප්‍රාදේශීය දේශපාලනඥයෝ මේ දිනවල ඉතාම අපහසුතාවයට පත් වෙලා තියෙනවා. ගෙදරින් එලියට බහින්න බැරි තත්වෙකට පත් වෙලා තියෙනවා. ඒ නිසා විශේෂයෙන්ම පසුගිය මැතිවරණ වලදී අපි මැතිවරණ වේදිකාවල කතාබහ කළා. ඒ සියලු දේවල් ඔස්සේ මම දන්නෙ නැහැ. අපට පාරට බහින්න බැරි තත්ත්වයක් උදාවෙලා තියෙන්නේ. මම විශ්වාස කරනවා අද

මධ්‍යම රාත්‍රියේ වුණත් කමක් නැහැ. ප්‍රාදේශීය සභා විසුරුවා හරිනවා නම් අත් දෙකම උස්සලා මගේ කැමැත්ත ප්‍රකාශ කරනවා. මොකද ඒ මොකක්වත් නෙවෙයි. ඒ කාර්යය කරනවා නම් හොඳයි කියන එක මගේ විශ්වාසය කියන එකයි මතක් කරමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

ගරු සභාපතිතුමන් ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. මම හිතන්නේ අවුරුදු 74 ක ශාපය නිම කරන්න යන මොහොතක් උදා වෙනවා. ගරු සභාපතිතුමනි, මට මුලින්ම කියන්න තියෙන්නේ මේ වංචා හා දූෂණ අතර යනකොට, මේක වංචාවක් ද කියලා තවම අපි දන්නෙ නැහැ. 252-6478 කැබ් රථය සඳහා ලක්ෂ හතක් ගිහිල්ලා තියෙනවා. ජ්ලේන් කරලා, වීදුරු ටික දාලා ඔය ටික කරන්න. තාම ටින්කරින් කරලා නැහැ. එකේ උඩ තියෙන මලකඩ ටික මතු වෙලා තියෙන්නෙ. එහා පැත්තට ගිහිල්ල බලන්න මොකක්ද වෙලා තියෙන්නෙ කියලා. ඇත්තටම කොහොම මෙවැනි ගානක් ගියාද කියල බලන්න. ඒ පිළිබඳව සලකා බලන්න. අහිංසක මිනිස්සුන්ගෙ සල්ලි ටික, අන්න ඒ ගැන ඇත්තටම අපට කණගාටුයි. සභාපතිතුමා, ඒ වගේම තමයි තල්ගස්වල වෙළඳ සංකීර්ණය සෑදීම සම්බන්ධයෙන්, ඇත්තටම එකේ වැඩ නවත්තලා තියෙන්නේ. අපි දන්නවා මිලමුදල් එක්ක ඒකෙ වැඩ කරන්න අමාරු තත්ත්වයක් තියෙන්නේ. ව්‍යාපාරිකයො දැන් අපිත් එක්ක කතා කරනවා. එතුමන්ලට ලබා දෙන්න. එවිට ඔය විදිහට හදාගන්න. ඒකටත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න.

ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, මෙන්න මේ ඉන්ධන ප්‍රශ්නෙදි මන්ත්‍රීවරු කිව්වා. අපට පෝලිමකට ගිහිල්ලා ඉන්න බැහැ කියලා. ඒක සත්‍ය කතාවක්. නමුත් මේකෙදි සිදුවෙන්නේ සෑම සෙඩ් එකකදීම තමන්ට හිතවත්, පාතාල වගේ මැර පිරිස දාගෙන තමයි තෙල් ගහන්නේ. ඇත්තටම සාමාන්‍ය අහිංසක මනුස්සයෙක් ගියොත්, පොලිසියෙන් පැත්තකට කරනවා. පුළුවන් මිනිහ තමයි තෙල්ටික් ගහගෙන යන්නේ. අපි දැක දැක ලීටර් 20 ක් ගහගෙන ගියා. අපේ ගයන් මන්ත්‍රීතුමාත් දන්නවා. ඇත්තටම අන්න ඒ වගේ තත්ත්වයක්. අපට වැඩක් නැහැ. අපේ ලක්රුවන් මන්ත්‍රීතුමා කිව්ව වගේ, මන්ත්‍රීවරයෙකුට කියලා එහෙම කිසිම දෙයක් නැහැ. අපට ආරංචියක් ආවා. උඩුගම ඩීසල් ගහන්නෙත් වෙනම ක්‍රමවේදයකට කියලා. අපේ පැත්තේ ඉන්නවා රබර් කිරි එකතු කරන හොඳ ව්‍යාපාරික මහත්තයෙක්. ඒ මහත්තයා ප්‍රාදේශීය ලේකම්ගෙ සීල් එක ගහගෙ ගිහිල්ලත් පිළිගෙන නැහැ. ඊට පස්සේ ගාල්ලෙ දිස්ත්‍රික් ලේකම් ගේ සීල් එක ගැහුවට පස්සේ තමයි එතුමාට තේරිලා තියෙන්නෙ. තෙල් දීලා තියෙන්නේ ඔන්න ඔය වගේ කිසිම නීතියක් නැහැ. ඇත්තටම කණගාටුයි. ඒ ගැන සභාපතිතුමනි, ඔබතුමන්ලට පුළුවන් නම්, රජයක් තියෙන නිසා, අපි කියන්නේ ක්‍රමවේදයක් හදන්න. ඒ වගේම ගරු සභාපතිතුමනි, අපේ ලක්රුවන් මන්ත්‍රීතුමා කිව්වා. එතුමන්ලා පත් කරපු නායකයන්ගේ කොන්ද පණ නැහැ කියලා, ඇත්තටම ඒක අපට තේරෙනවා. කොන්ද පණ තිබුනනං ඒ වගේ අරගලයකට යන්න වෙන්නෙ නැහැ. අපි ඇත්තටම හෙලා දකින්න ඕන කාරණාවක් තමයි. මාධ්‍යවේදීන්ට පහරදීම මාධ්‍යවේදී තරුණියකට අවුරුදු විසි තුනයි. වෙපන් එකකින් ඔලුවට ගහලා ඔලුව පලනවා. අනිත් මාධ්‍යවේදියා යනකොට බිම දාලා ඇදලා පහර දෙනවා. ඒ කාගේ නීතියක් ද? එහෙම නීති වලට සම්බන්ධ වෙච්ච කොටසකුත් ඉන්නවා. ඒවා හරිම මිලේච්ඡයි. ඇත්තටම අපට කණගාටුයි. ප්‍රභාකරන්ගේ කාලේ වත් ඔය වගේ වැඩ කළේ නැහැ. ඒකට කට්ටිය නොයෙක් නොයෙක් දේ කියාවි. මාධ්‍යවේදීන්ට පහර දීම අපි හෙළා දකිනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, අපේ මේ සභාවෙ වැඩ කරන නිලධාරීන්ට අර පාපැදි ගැනීම සම්බන්ධව. ඇත්තටම දැන් ඒ පාපැදියක් හය දාහකට ගන්න බැහැ. ඒක නිසා ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියනවා. බයිසිකල් චේන් එකක් රු.1800.00 යි. ශීට් එකක් රු. 3000.00යි. ඒ තත්ත්වයට පත් කළේ මේ රාජපක්ෂ ආණ්ඩුව. ඒකට තවත් සම්බන්ධ වුණා. සහබන්දු මහත්තයලගේ රනිල් මහත්තයා. ඔන්න ඔය වගේ දේවල් තමයි වුනේ. අපි කියන්නේ ගෝඨාභය මහත්තයා විතරක් නෙවෙයි රනිල් මහත්තයත් ඕකට සම්බන්ධ නිසා. රනිල් මහත්තයත් යන්න ඕන. ගෝඨා go home, රනිල් go home අනිවාර්යෙන්ම දෙන්නම අයින්

වෙන්න ඕන. ඇත්තටම ලක්රුවන් මන්ත්‍රීතුමා කිව්ව වගේ මේ දෙන්න විතරක් නෙවෙයි සියලු දෙනාම වගකියන්න ඕන.
ඒ වගේම තමයි, 09 වෙනිදා රනිල් මහත්තයාගේ නිවසට ගිනි තැබීමෙන් සිදු වුන හානිය ඇත්තටම අපි එක හෙළා දකිනවා. ඒවා හරි නැහැ. කලේ කවුද කියලා අපි දන්නේ නැහැ. ජනතා විමුක්ති පෙරමුණ හැටියට, ඒ සම්බන්ධව අපි කණගාටුව ප්‍රකාශ කරනවා. කවුරු කළත් ඒක වැරදියි. එහි තිබුණු පොත් පත් ගැන කණගාටු වෙනවා. ඇත්තටම අපි සියලු දෙනාටම ආරාධනා කරනවා. අලුතින් අපි මේ ගමන යමු. මේ තියෙන කෝඩකම්, කුහකකම් සියලුම දේ අයින් කරලා එක ගමනකට යමු කියලා ඉල්ලා සිටිමින්, ඔබ සියලු දෙනාට අලුත් රජයක් යටතේ, ඊළඟ සභාව තියන්න ශක්තිය ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා**

ගරු සභාපතිතුමනි, ප්‍රජාතන්ත්‍රවාදය අහෝසි වී ඇති අවස්ථාවක, රටම, මගක් නොපෙනෙන, එළියක් නොපෙනෙන, පතුලක් නොපෙනෙන, රට කඩාගෙන වැටෙන අවස්ථාවක, අනාගතයක් නොපෙනෙන, කතා කිරීමට අවස්ථාවක් නොමැති අවස්ථාවක, රටට නායකයෙක්, රටට ආණ්ඩුවක්, රටට පාලකයෙක් නැති අවස්ථාවක, මෙහෙම කතා කිරීමට අවස්ථාව ලැබීම සම්බන්ධව ඉතාම කනගාටුවට පත් වෙනවා. මම හිතන්නේ වසර 30ක මගේ ජීවිත කාලය පුරාවට අපි දැකපු අහපු දේවල් වලටත් වඩා දැකපු අරාජිකම මොහොතක් තමයි මේ කාලය. අපි අහල තිබුණා, 1977, 1988/89 මේ වගේ රට විනාශ වෙච්ච කාලවල්. අපි දැක්කා අද ඒ තරමටත් එහා ගිහිල්ලා, විශේෂයෙන්ම මම ගිය සභා වාරෙත් කිව්ව වගේ, ජනතා විමුක්ති පෙරමුණ, ජනතා විමුක්ති පෙරමුණේ 88-89 හිටපු සන්නද්ධ ඒකකය, දැන් පෙරටුගාමී අන්තරේ ප්‍රමුඛ පෙරටුගාමී ත්‍රස්තවාදී කල්ලිය 3% කුත් නැති ත්‍රස්තවාදී කල්ලිය, අද මේ වන විට රටේ ජනාධිපති ලේකම් කාර්යාලය, රටේ ජනාධිපති නිල නිවස ඇතුළු මේ මරමස්ථාන අත්පත් කරගෙන, විනාශ කරමින් දැඩි පිළිකුල් සහගත ලෙස හැසිරෙනවා. අපි දැක්කා ස්විමිං පූල් එකේ බැහැලා නානවා.
ඒ විතරක් නෙවෙයි ජනාධිපති මන්දිරයේ තිබෙන ඇඳවල් උඩ,පුටු උඩ නැඟලා ඉන්නවා. ජනාධිපති මන්දිරයේ චිත්‍ර ඉතිහාසයට ගියාම මේක යටත්විජිතවාදී යුගයේ ආණ්ඩුකාරවරුන්ගේ, නිල නිවාසයක් දක්වා අතීතයට යන දෙයක්. මේකේ තියෙන රහස් ස්ථාන, මේ සියල්ල අනාවරණය කරමින් ජනතාව පෝලිමේ ගිහිල්ලා, මේ දේවල් විනාශ කරමින්, මේ රටට කරන හානිය, ඇත්තටම තරුණයෙක් විදියට හිතට දැනෙන ආවේගය සහ දුක වේදනාව දරාගන්න බැරි තරම්. මම හිතන්නේ මේ සියල්ලටම වග කියන්න ඕන මේ ජනතා විමුක්ති පෙරමුණ. රාජපක්ෂ ආණ්ඩුවත් වගකියන්න ඕන. ජනතා විමුක්ති පෙරමුණේ මෙන්න මේ කල්ලිය කුඩුකාරයො, ගංජා කාරයෝ, මෙන්න මේ තැන්වලට රිංගද්දි ඒවා පාලනය කරන්න බැරි වෙච්ච එක රාජපක්ෂලාගේ වැරැද්දක්. මේ කුඩුකාරයන්ට, ගංජ කාරයන්ට මේ ජනතා විමුක්ති පෙරමුණ රට ගැන, සමාජය ගැන වෛරයෙන් ඉන්න, ත්‍රස්තවාදී කල්ලිය. මේවා මර්ධනය කරන්න බැරිවීම රාජපක්ෂ ආණ්ඩුවේ වැරැද්ද. මේ වෙනකොට ජනතා විමුක්ති පෙරමුණ නිර්මාණය කරන ලද අය, අද ඇතුළෙ මරාගන්නවා. AC කරපු කාමරයක් බෙදාගන්න බැරිව, මේ වගේ පිරිසකට රට බාර දුන්නොත් කොහොම බෙදා ගනීද කියලා, මම අපේ මන්ත්‍රීවරුන්ගේ අවධානය යොමු කරන්න කැමතියි. එතනින් ගියහම ගරු සභාපතිතුමා, මෙගොල්ලෝ පසුගිය නව වැනිදා අපේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමන්ගේ සහ මන්ත්‍රීතුමියගේ ඇතුළු ඇතුළු දිස්ත්‍රික් නායකතුමන්ගේ මොහාන් පීරිස් නියෝජ්‍ය නායකතුමාගේ, හිටපු සභාපති විජේපාල හෙට්ටිආරච්චි ගරු මන්ත්‍රීතුමන්ගේ, චන්දිම වීරක්කොඩි හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාගේ, නිවාස ගිනි තිබ්බා. ඒ විතරක් නෙවෙයි. මම මේ අවස්ථාවේදී කනගාටුව ප්‍රකාශ කරනවා. රාජකීය විද්‍යාලයේ දේපළක් බවට පත් කරන්න තිබුණු, විශාල දැනුම් සම්භාරයක් තිබුණු, යාපනය පුස්තකාලය හා සමාන දැනුම් සම්භාරයක් තිබුණු පුස්තකාලයකින් සමන්විත වූ ඒ රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යතුමාගේ නිවස මේ කාලකන්නි විසින් ගිනිබත් කළා. ඇත්තටම ජනතා විමුක්ති පෙරමුණ හරි ලේසියෙන් අත පිහිදා ගන්නවා. අපි දන්නෙත් නැහැ. අපි කලෙත් නැහැ කියලා. ගරු සභාපතිතුමනි, එදා

ප්‍රේමදාස මහත්තයා හැසුරුන විදිහට ගෝඨාභය රාජපක්ෂ මහත්තයා හැසිරුනා නම්, අද මම විශ්වාස කරනවා. ජයවීර මන්ත්‍රීතුමාට මේ පුටුවෙ වාඩිවෙලා ඉන්න හම්බ වෙන්නේ නැහැ. හැබැයි ගෝඨාභය රාජපක්ෂ මහත්තයාගේ වැරදි තියෙනවා. නැත්තෙ නැහැ. අපි පාලකයෙක් පත් කරගත්තෙ අපේ මූලික අවශ්‍යතා ටික සපුරගන්න. අපේ ආර්ථිකය පාලනය කරන්න. මොන අඩුපාඩුව තිබුනත්, මොන ප්‍රශ්නය තිබුනත්, ජනාධිපතිවරයාට එම වගකීමෙන් මිදෙන්න බැහැ. ඒ ආණ්ඩුවට ඒ වගකීමෙන් මිදෙන්න බැහැ. තෙල් ටික, ගෑස් ටික නැතිවෙන වගකීමෙන් මිදෙන්න බැහැ. අතීතය ගැන කතා කළහම, ප්‍රශ්න තිබෙන්න ඇති. මොන ක්‍රමයකින් හෝ මිනිස්සුන්ට අවශ්‍ය ගෑස් ටික, තෙල් ටික දීම රජයේ වගකීමක්. හැබැයි මේ දේ කරන්න බැරිනම් ඉවත් වීම හෝ මහ මැතිවරණයකට යාම හෝ වෙනත් කොටසකට බලය පැවරීම තමයි කරන්න තියෙන්නේ. පුළුවන් කෙනෙකුට තමයි දෙන්න තියෙන්නේ. නමුත් අද වෙලා තියෙන දේත් එක්ක, රට සහ ජනතාව සහ රටේ අනාගතය ඉතාම අවාසනාවන්ත තැනක තියෙන්නේ. ඊට පස්සේ තමයි අද වන විට සිංහල බෞද්ධයෝ එළියට බහින්න බය වෙලා තියෙනවා. මොකද ජනතා විමුක්ති පෙරමුණ ප්‍රමුඛ මේ කල්ලියේ භීෂණයට බයේ. අපි දන්නවා රජයක් ඉන්නේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන්. මැතිවරණයකින් බලය ලබාගන්න. එහෙම නැත්නම් යම්කිසි ක්‍රමවේදයක් තියෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් තියෙනවා. ව්‍යවස්ථාවට අනුකූලව බලය ලබා ගැනීම තමයි මේ රටේ සාමාන්‍ය ක්‍රමවේදය. අද ජනතා විමුක්ති පෙරමුණ ප්‍රමුඛ මේ ත්‍රස්තවාදී කල්ලිය, කවදාවත් ඔවුන්ට බලයට එන්න නොහැකි නිසා, ඔවුන් කරන අරගලය, ජනතා විමුක්ති පෙරමුණේ තියෙන්නේ, තියෙන කෙනා කෙරෙහි වෛරයෙන් බලපු අය. ඔවුන් නිතරම තියෙන කෙනාට විරුද්ධයි. කාල බීල ඇඳල ඉන්න කෙනාට විරුද්ධයි. හොඳට බලන්න ජනතා විමුක්ති පෙරමුණ කාරයෝ එහෙම නේද කියලා. සභාපතිතුමනි මේ සියල්ලටම වගකියන්න ඕන ජනතා විමුක්ති පෙරමුණ තමයි. ඊයේ ඔබතුමාලගේ පක්ෂ නායකයා බාරගත්තා අරගලය කරන්නේ කවුද කියලා ඔබතුමාට නෑ කියන්න බැහැ. අපි දැක්කා ජනාධිපතිතුමාගේ කෑම වේල් සම්බන්ධව මාධ්‍ය ඉස්සරහට ඇවිල්ල කතා කරනවා. ජනාධිපති අඳින ඇඳුම, නෝනා අඳින ඇඳුම පෙන්නනවා.

මෙතුමා කිව්ව කතාවට මම එකඟයි. හෙට වුණත් කමක් නැහැ. ප්‍රාදේශීය සභා විසුරුවනවා නම්, අත් දෙකම උස්සලා හරි, මම ඒකට එකඟ වෙනවා. නැවත නැවතත් කියා සිටින්නේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීමේ ක්‍රමවේදයක්, මේ තුප්පහි, කාලකන්නි ජනතා විමුක්ති පෙරමුණ හැර සියලු පක්ෂ එකතු වෙලා, අනිකුත් සියලු දෙනා එකතුවෙලා, ප්‍රජාතන්ත්‍රවාදය නැවත ස්ථාපිත කරන්න ක්‍රමවේදයක් හදනු ඇතැයි බලාපොරොත්තු වෙමින් මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. කොහොම වුනත් මේ වෙලාවෙදි මම දකින විදිහට රටේ ප්‍රජාතන්ත්‍රවාදයට, සහ අනාගත දරු පරපුරට කණකොකා හැඬු වෙලාවක්. ප්‍රජාතන්ත්‍රවාදයේ සහ අපේ නිදහසේ පසුගිය නව වැනිදා අපේ මළගම කියන්න පුළුවන්. මම මෙහෙම කියලා කාටවත් චෝදනාවක් එල්ල කරනවා නෙවෙයි. අපි හැමදෙනාටම තිබුනා ඒ තිබ්ච්ච දේ නැතිවුනහම තමයි තමුන්නාන්සේලාට දැනෙන්නේ. අරගලය කරන්න ඕන. මම ගිය සභාවෙත් කිව්වා. මට මේ නොතේරෙන වචනයක් තිබුණා. සාමකාමී අරගලය. සාමකාමී අරගලයක් කරන්න බැහැ. ඉඩම් ආරවුලක් තිබුණ නම්, එතනට ආයුධයක් ගෙනියන්නෙ නැහැ. උදාහරණ හැටියට අපි යනවා කිසිත් නැතුව. නමුත් එතන අරගලයක් සිදුවෙනවා. මොකුත් නැතිව, ඊට පස්සේ තමයි ආයුධය ගන්නේ. ඊට පස්සේ තමයි මිනී මැරුම් සිදු වෙන්නේ. මෙතන මායිම සම්බන්ධව අපි තේරුම් ගන්න ඕන. අරගලය ඇති වෙනකොට, මේ කුමන අරගලයක් සඳහා ද කියන එක සම්බන්ධව. අද මේ මොහොත වන විට ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රී තුමා කිව්වා 74 වසරක ශාපය කියලා. ඒ 74 වසරක ශාපය තමයි අපි මේ එළියෙ දකින්නේ. එදා ඩී එස් සේනානායක, ඩඩ්ලි සේනානායක, ජෝන් කොතලාවල, සිරිමාවෝ බණ්ඩාරනායක, චන්ද්‍රිකා බණ්ඩාරනායක, මහින්ද රාජපක්ෂ, රණසිංහ ප්‍රේමදාස, මෛත්‍රීපාල සිරිසේන අරගල කෙරුවා. ඒ 74 ශාපය ද? අද මේ විදුලි එළිය බලනවා. මේක විග්‍රහ කරන්න ගියොත් පැය ගානක් යනවා. නිදහස් අධ්‍යාපනය ලැබ්ච්ච නිසා, ඒකත් මේ 74 වසරක ශාපය ද? අපට මේ ලැබිලා

තියෙන යම්කිසි වරප්‍රසාදයක් සිංහලයො විදිහට භුක්ති විඳින්නේ. මේ 74 වසරක ශාපය ද? මේ වෙලාවේ මම කෙටියෙන් කිව්වේ. මන්ත්‍රීතුමා පාර්ලිමේන්තුවේ කිව්වා ගෑස් ටික එනවා, අහවල් දවසේ පෙට්‍රල් ටික, ඩීසල් ටික, පෝර ටික එනවා කියලා. ඒ වෙලාවේ ඇහුවා ඇත්තද ඔය කතාව කියලා. මේ මොහොත වන විට යූරියා ටික ඇවිල්ල බෙදනවා. ගෑස් නැව් දෙකක් ඇවිල්ල ඒව බෙදනවා. මේවා අරගලකරුවන්ද ගෙන්නුවේ කියලා මම ප්‍රශ්න කරනවා. මේක අද ඊයේ තිබ්බව ප්‍රශ්නයක් නෙවෙයි. ගෑස් පෝලිම ඉවර වෙනවා. පොහොර පෝලිම ඉවර වෙනවා. තව ටික දවසකින් තෙල් පෝලිමත් අවසාන වෙනවා. දේශපාලන නායකයෝ, විශේෂයෙන්ම මේ බංකොලොත් දේශපාලන නායකයෝ මොකක්ද කළේ. පෝලිමේ ඉන්න ජනතාව තමයි පෙළගස්වන්න පුළුවන්. මේ පෝලිම් නොතිබුණොත්, හෙට කොළඹට ඔය එක්කෙනෙක්වත් ගෙනියන්න පුළුවන් කමක් නැහැ. දැන් ගෑස් කිරිපිටි එනවා එක්කෙනෙකුටවත් ගෙනියන්න වෙන්නෙ නැහැ. ඒ කට්ටිය එයි ද? රටේ උද්ධමනයක් තියෙනවා. ඒක ඇත්ත. ඒක පිළිගන්න. අද මිනිස්සු බඩු ඉල්ලුවේ. ලබන මාසේ 10 -15 වන විට මේ පෝලිම් ටික මේ රටේ නැති වෙනවා. ඒ අය කල්පනා කෙරුවා. මේ ආණ්ඩුව මේ යන ගමන විනාශ කරන්න නම්, මෙන්න මේ පෝලිම් ටික තමයි කොළඹට ගෙනියන්න පුළුවන් කියලා. මට ලැජ්ජ හිතෙනවා ගරු සභාපතිතුමා. මේ අය මම හිතනවා ජේවීපී එකේ ඔය වගේ බංකොලොත් කාරයෝ නැහැ. සමගි ජන බලවේගයේ ඒවගේ බංකොලොත්කාරයො නැහැ. අපි පුංචි කාලේ මට මතක් වුනා. ටීවී එක දිහා බලාගෙන ඉන්නකොට අයියයි, මමයි, නංගියි. අවුරුදු හයයි වයස ඉස්සර අපි මොකක්ද කරන්නේ? ගෙදරින් පොල්කට්ටක් ගන්නවා. ඒකෙ අපි කෝට්ටක් ගහනවා. මයික් එක හදලා කතා කරනවා. අපි ඒ පුංචි ඇයෝ. අද බලන්න ජනාධිපති මන්දිරයට ඇතුළු වුණා. මේ වගේ වට සභා මේසයක් තියෙනවා. අර ගමේ ඉන්න පොඩි ඇයින් වගේ, රෑවුල වවාගත්ත, කොන්ඩෙ වවා ගත්තු අය. මං දන්නෙ නැහැ. මේ ගොල්ලන්ගෙ බුද්ධි මට්ටම කොතනද කියලා. මයික් එක මෙම නාගොඩ ප්‍රාදේශීය සභාවට ආවනම් අපි ඔවුන්ට ඉඩ දෙනවා. ඕතනටම යන්න ඕනි නැහැ. ඊළඟට මාධ්‍ය සාකච්ඡා තියනවා විනෝදයට. බුද්ධිමත් මිනිස්සු ආව නම් කවුරුත් නැති වෙලාවක ඒ වගේ කතා පවත්වන්න යයිද? කිසිම හැකියාවක් මෙන්ම හැදියාවක් නැති අය. එදා කතා පවත්වනවා ජනාධිපති මන්දිරයේ ඉඳන්. ගෝඨාභය රාජපක්ෂගේ, බැසිල්ගේ නෙවෙයි. මහින්දගේ නෙවෙයි. ජේ ආර්ගේ නෙවෙයි. විලියම් ගොපල්ලවගේ නෙවෙයි. රනිල් වික්‍රමසිංහගේ නෙවෙයි, ඒ ජනාධිපති මන්දිරය. ජනාධිපති මන්දිරයත්, අරලියගහ මන්දිරයත් අපි පුංචි කාලේ අධ්‍යාපන සවාරි යනකොට, ජනාධිපති මන්දිරය ආදී ඒව දකින විට ලොකු භක්තියක් දැනෙනවා. ඒක සුද්දට තිබුණේ. එවැනි යුගයක, ප්‍රතාපවත් ඉතාමත්ම සිංහල රටවැසියාගේ ආඩම්බරයක් ජනාධිපති මන්දිරය කියන එක. එය ගෝඨාභය රාජපක්ෂ මහත්තයාගේ නෙවෙයි. අරලියගහ මන්දිරයට බලන්න මේකට මංකොල්ලකාරයෝ ඇතුල් වුණා වගෙයි. සමහරු සල්ලි ගනිනවා. සාමකාමී අරගලයකදී සේප්පු කඩන්න පුලුවන්ද? ජනාධිපතිවරයාගේ ගෙදර තියෙන සල්ලි ජනාධිපතිගෙ ද? දැන් මේ සභාවේ තියෙන සල්ලි සභාපතිවරයාගේ ද? මම මේ සුදුහුණු ගානවා නෙවෙයි.

මට මේ වෙලාවේ මතක් වෙනවා තමුන්නාන්සේලාගේ නායකයාගේ පියා. ඒක නිසා මේ සේප්පුව කඩන්න අයිතියක් නැහැ. අර ඇඳන් උඩ ගිහිල්ලා පිලුම් ගහන්න අයිතියක් නැහැ. වැදගත් මිනිස්සු ඇතුල් වුනා නම් ඇදගත් විදියටයි හැසිරෙන්නේ. මම දැක්කේ අපි ගමේ ඉන්න මම ගමට අගෞරව කලා වෙනවා. නමුත් නිකම්ම නිකම්, කිසිම අධ්‍යාපන මට්ටමක් නැති, කියන දේ තේරෙන්නේ නැති, කියන දේ තේරුම් ගන්න බැරි පිරිසක් ඉන්නවා. අන්න ඒ වගේ තමයි මේ උදවිය අතරේ බුද්ධි මට්ටම තිබෙන අයත් මේකේ හිටියා. අපේ රටේ මර්මස්ථානය කුඩුපට්ටම් කරලා, ඓතිහාසික මධ්‍යස්ථානයක්. මංකොල්ලකාරයින් පිරිසක් පසුගිය නව වැනිදා ජනාධිපති මන්දිරය විනාශ කෙරුවා. ඒ විතරක් නෙවෙයි. අපේ නායකයගේ රනිල් වික්‍රමසිංහගේ ගෙය. එතුමා දෙකයි පනහේ නායකයෙක් නෙවෙයි. ඒකටත් කතා හදනවා. එතුම ගෙට ගිනි තියාගත්තලු. ඒක සිරස මාධ්‍යයේ කියනවා. මම දැක්කා පුන පුනා කිව්වා. වරෙල්ලා ඔතන නෙවෙයි තියෙන්නේ රනිල් වික්‍රමසිංහගේ ගෙදර ඉස්සරහ කියලා. රනිල් වික්‍රමසිංහ හරියට ඒ දේ කිව්වේ නැහැ. අස් වෙනවා ද නැද්ද කියලා. එතුමගේ මැතිණිය මේ රටේ ශ්‍රේෂ්ඨ කාන්තාවක්. කවදාක්වත් දේශපාලන භූමිකාවට එන්නේ නැහැ. රෝගී තත්ත්වයෙන් ඉන්නේ. මොකද මම ඒ දේ දන්න නිසා. එතන තිබුණු හූදලේ ජනතා විමුක්ති පෙරමුණේවත්, සමගි ජන බලවේගයේ

තමුන්නාන්සේලාගේ මචා ගත්ත ඉතිහාසයක් තියෙනවා. ඒ පුස්තකාලය ආරක්ෂා කළේ අනාගත පරපුර වෙනුවෙන්. තමන්ගෙ පුස්තකාලය අධ්‍යාපනය ලැබූ පාසලට පරිත්‍යාග කරල තිබුනේ. එතුමගේ නිවස පවා එම අධ්‍යාපනය ලැබූ පාසලට පරිත්‍යාග කරලා තිබුණේ. එතුමට මාලිගා තිබුණෙ නැහැ. පරම්පරාවෙන් ආපු මාලිගාව එච්චරයි. ඒකටත් ගිනි තිබ්බා. කොළඹට දරුවෝ එක් කරගෙන යනකොට හිතන්න ඕන. මේ දරුවෝ මොනවා කරයිද කියලා.
දෙමව්පියො දැනගන්න ඕන. එතන මංකොල්ලකාරයෝ, කුඩු කාරයෝ ඉන්නවනම්, එතනට නොයව ඉන්න ඕන තාප්පෙන් එහා පැත්තට ගිහිල්ල ගින්දර දානවා. මම නිර්භයව ප්‍රකාශ කරනවා. මේක. රනිල් වික්‍රමසිංහ මහතාගේ ගෙට ගිනි තැබීම දේශපාලන කුමන්ත්‍රණයක ප්‍රතිඵලයක්, ගෑස් තෙල් බෙහෙත් එනබව දැන ගත්ත නිසා එන්න කලියෙන් මේ දේවල් සිදුකලා .සතියක් හිටිය නම්, මේ දේවල් ආවම මෙහෙම ගහන්නේ නැහැ. කිසි කෙනෙක් කොළඹ යන්නේ නැහැ. මේක කුමන්ත්‍රණයක්. අපි බලමු තමුන්නාන්සේලා මොකද්ද කරන්නෙ කියලා. රටේ ව්‍යවස්ථාවක් තිබුණා. ප්‍රජාතන්ත්‍රවාදයත් තිබුණා. පාරේ යන මිනිස්සු මෙහෙට ඇවිල්ලා පත් කරන්න බැහැ. ඉදිරියේදී මෙම සභාවට වුණත් සාමකාමී අරගලයක් එන්න පුළුවන්. කට්ටිය යනවා හිරගෙදරට. රංජා ගන්න ඕන කියනවා. දැන් ඉතින් ඉවසුවා ඇති. රංජන් රාමනායක නිදහස් කර ගමු කියලා. කට්ටිය සාමකාමී අරගලයකින් මෙතනට ඇතුළුවෙනවා. සිටි කෙනෙක් අවිය තියාගෙන අවිය පත්තු කරනවා .පත්තු කරපු එකාට නඩුව වැටෙනවා .මෙම නිලධාරියාගේ දරු පවුලම බඩගින්නෙ. සාමකාමී අරගලයක නීතිය විග්‍රහ කරල තියෙන්නෙ. මොනවත් තහංචි දාන්න බැහැ කියන එක. සාමකාමී අරගලයකදී ගේට්ටු කඩන්න පුළුවන්. සේප්පු කඩන්න පුළුවන්. මිනිස්සු මරන්න පුළුවන්. රට අරාජික කරන්න පුළුවන්. ඕන එකකට ඉඩ තියෙනවා. හිර ගෙදරට යනවා ජයි රන්ජන් කියාගෙන. හිර ගෙදර විවෘත වෙනවා. සාමකාමී අරගලය, අපි බලනවා මොකක්ද වෙන්නේ කියලා. රටේ ව්‍යවස්තා වෙනස් කරලා, මේ රටේ ගමනක් යන්න බැහැ. ඔය මිනිස්සු ගියේ කුසගින්දර දරාගන්න බැරිවෙයි. මේ සභාව ලබන මාසේ නැතිවුනත් මම කැමැතියි. සභාවට දිගටම තියෙනකොට මොකද අපට මේ දේවල් දකින විට පීඩනය කොතනින් හරි පිට කරන්න ඕන. ඒක නිසා මේක තියෙන්න ඕන. තව මාසෙකින් දෙකකින් මිනිස්සු කතා කරනවා. ප්‍රජාතන්ත්‍රවාදය නැති වෙච්චදාට අපි නිර්භයව කියනවා. තමුන්නාන්සේලාට තව ටික දවසකින් බලාගන්න හැකි. මොකද අන්න ඒක නිසා මම එච්චරයි ප්‍රකාශ කරන්නේ මොකද අපි කණගාටු වෙනවා. අපේ පුංචි දරුවො අහනවා සාමකාමී අරගලය අර තරම්ම දරුණු ද කියලා. එනිසා තමුන්නාන්සේලා සියලු දෙනාගේ දේශපාලන ගමනක්, රනිල් වික්‍රමසිංහ ගියේ දේශපාලන ගමනක් නෙවෙයි. මේ රටේ ජනතාවගේ සුබසිද්ධිය උදෙසා.
ඊළඟට මම කියනවා ඔබතුමාලගේ නායකයා ගෝඨාභය රාජපක්ෂ එතුමා දුර්වල නායකයෙක්. විධායක ජනාධිපතිවරයෙකුට ගැහැණියෙක් පිරිමියෙක් කරන්න විතරයි බැහැ කියලා කිව්වේ එතරම්ම දරුණු ව්‍යවස්තාව මේ රටේ හදලා තිබුණා. ඇත්තටම හැටි නම ලක්ෂයක් දුන්නා. ජනතාවගේ බලය බහුතරයක් තිබුණා. මොකද ගිලිහුනේ කොතනින්ද කියලා අපට හිතාගන්න බැහැ. දුර්වල නායකයෙක් නිසා මේ දේ සිද්ධ වුණා. ඉවසුවා ඇති. කියන පණිවිඩය දුන්න නම් අද මේක වෙන්නේ නැහැ. තමුන්නාන්සේලාට ශක්තියක් දීලා තිබුනා. ඒක කළේ නැහැ. අරගලයේ උදවිය ගිහිල්ලා කරපු දේවල් වලින් ඔවුන්ගේ බුද්ධි මට්ටම ගැන හිතාගන්න පුළුවන්. ස්විමිංපුල් වල නානවා. ඇඳන් උඩ නිදා ගන්නවා. මීටින් තියෙනවා. ජනතා විමුක්ති පෙරමුණ බුද්ධි මට්ටම පහතට වැටෙනවා අපි මේක කරන්නේ කියලා කිව්වොත්
මාධ්‍යවේදීන් ගැනත් මතක් කරන්න ඕන. සාමකාමී අරගලයේ, සාමකාමී පා ගමනෙන් බලහත්කාරයෙන් රාජ්‍ය දේපල වලට ඇතුළු වෙමින්, දැන් අපි පළමුවෙන්ම බලන්න ඕන සාමකාමී කියලා බෝඩ් එකක් ගහගෙන, යම් තැනකට ඇතුල් වුනොත්, නීතිය මොකක්ද කියලා බලන්න. මාධ්‍යයට තෝරලා බේරලා ගහන්න බැහැ. ඒ වෙලාවේ රනිල් වික්‍රමසිංහ එතුමගේ මැතිනියත්... ගින්දර දාලා පුච්චන්න හැදුවේ. පොලිසිය ආවා. ඒ එන්න කලියෙන් සිරස මාධ්‍ය ජාලය පෙට්‍රල් අරගෙන දීලා. මේක ආරංචිය ආවා ආරක්ෂා හමුදා එස්ටීඑෆ් එකට තව කප් තප්පර ගානක් යන්න කලියෙන් රනිල් වික්‍රමසිංහගේ සහ එම මැතිනියගේ ගිනි ජාලාවකට කොටු කරනවා. ජාතියට හෙන ගහන සාමකාමී අරගලයක් පටන් ගන්න හැදුවේ.

මට පුදුමයි. තමුන්නාන්සේලාගේ නායකයා මොකක්ද මේ කරන්නේ කියලා. 69 ලක්ෂයක් තමුන්නාන්සේලාට බලය දුන්නා. දෙයියනේ මේ මොකද්ද වුණේ කියන එක අපට හිතාගන්න බැහැ. ඒ නිසා පැහැදිලිව මේ දේ කියන්න සිද්ධ වෙනවා. දුර්වල නායකයෙක් නැත්නම් කවදාවත්ම මේ දේ සිද්ධ වෙන්නේ නැහැ. මේ දේ සිද්ද වෙන්න ඉඩ අරින්නෙත් නැහැ. දුර්වල නායකයෙක් නිසා තමයි. ඉවසුවා ඇති කියන පණිවිඩය දුන්න නම් අද මේක වෙන්නෙත් නැහැ. තමුන්නාන්සේලට ශක්තියක් දීලා තිබුණා. අපි ගියේ නැහැ. මේ පුංචි කොල්ලො කුරුට්ටෝ ගිහිල්ලා මෙට්ටවල පිනුම් ගහන කොට මට හිතෙනවා, අනේ දෙයියනේ රටකට ගිය කලක් කියලා. කතා පවත්වන්න මාධ්‍ය සාකච්ඡා, එතකොට බුද්ධි මට්ටම හිතාගන්න. ඒක තමුන්නාන්සේලා බාර ගන්න යන්න එපා. එතකොට තමුන්නාන්සේලාගේ බුද්ධි මට්ටම හැල්ලුවට ලක්වෙනවා. තමුන්නාන්සේලාගේ නායකයාගේ බුද්ධි මට්ටම මම දන්නවා. ඒක නිසා එක ප්‍රශ්නයක් නැහැ. මේ වෙලාවේ ඒ පිළිබඳව මතක් කරමින්, මාධ්‍යවේදීන් ගැන කතා කළා. සාමකාමී අරගලයේ සාමකාමී පා ගමනෙ, බලහත්කාරයෙන් රාජ්‍ය දේපල වලට ඇතුළු වීම. දැන් ඉස්සෙල්ලා අපි බලන්න ඕන. චෝදනාවක් හදන්න පුලුවන්ද? සාමකාමී බෝඩ් එක ගහගෙන ගෙදරකට ඇතුළු වුනාම, අපට නඩු දාන්න පුළුවන් ද කියලා. ගෝල්ෆේස් එකේ අරගලකරුවන් බේරගන්න තමයි ඒ නිලධාරී කටයුතු කළේ.

ඒවගේම සභාපතිතුමා අපි පොළ ගැන කතා කළා නේද උප සභාපතිතුමා. පොලේ ආදායම් මට්ටම මොකද වෙලා තියෙන්නෙ කියලා. එතකොට හරිද වැරදි දෙයක්ද කියල බලන්න. ඒවා අපි කතා කෙරුවා. ඒව බැලුවා. ඊළඟ සතියේ ඒ වාර්තාව මෙතනට ගේන්නම ඕන. අපි කියන්නම ඕන නැහැ. ලබන සභාවේදි බලන්න එකේ ප්‍රතිඵල ඇවිල්ලද කියලා. ලේකම්තුමිය බලන්න, ඒවා ඇවිල්ලද කියලා. අනිවාර්යෙන් ආදායම වැඩි වෙන්න ඕන. සමහරවිට බැලන්ස් කලාද දන්නෙ නැහැ. ආදායම වැඩි වෙන්න ඕන. ඊට පස්සේ කැබ් රථය පිළිබඳව කතා කළා. මම ගිහිල්ලා බලලා ආවා. අඩුපාඩු ගොඩයි. පිටිපස්සට ජියර් බොක්ස් එක ගැලෙව්වද මම දන්නෙ නැහැ. ඒක බලන්න නම්, මට ෆයිල් එක මෙතනට ගෙන්න ගන්න ඕන. තීන්ත ටික තියෙනවා. මීට් ටික තියෙනවා. වීදුරුවක් උස්සන්න බැහැ. පාත් කරන්න බැහැ. ඒ හදපු බිල මට බලාගන්න ඕන. ඒ බිල බලාගන්න. හත් ලක්ෂ ගාණක වැඩ කෙරිලා නැහැ. එතකොට බඩුමිල නැහැ. මාසයකට වැඩිය ගැරේජ් එකේ තිබුණා. දැන් දෙන්නෙක් ඕන. ජියර් දාන්න බැරිලු. ජියර් මාරු කරන්න. ඒක නිසා මේකට ලක්ෂ හතක් වැය කරන මේකට සීට් කවරෙ විතරද? අර ගාපු තීන්ත ටික විතරද? කියලා. ගරු උප සභාපති තුමා, විශේෂයෙන් මේ ගැන අවධානය යොමු කරන්න කියලා තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේ මම වැඩිදුර කතා කරන්න යන්නේ නැහැ. අනාගතයේ නිදහස කියන එක දකින්න වෙන්නෙ කොහොමද? කොහොම වෙයිද කියන එක ගැන මම දන්නෙ නැහැ. එහෙම නම් කවුරු රට භාර ගත්තත්, ජනතාවගේ හදගැස්ම හඳුන ගන්න, ලැබිච්ච නිදහස ආරක්ෂා කරන්න, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්න, මේ රටේ පෝලිම ටික නැති කර ගෙන යන, තෙල් ටික, ගෑස් ටික සමගි අරගලය තුළින් ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින්, මා නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා**

ගරු සභාපතිතුමනි අවසරයි. පසුගිය සභා වාර දෙකේ මට සහභාගි වීමට හැකියාවක් ලැබුණේ නැහැ. එක වාරයක මගේ රාජකාරිමය ගැටලුවක් සහ දෙවැනි වර අසනීප තත්ත්වයක් හේතුවෙන්. මේ සභා වාර දෙකේදීම නිවාඩු අනුමත කිරීමට සහාය දුන් මගේ සහෝදර මන්ත්‍රීතුමන්ලාට, මන්ත්‍රීතුමියන්ගාට මාගේ කෘතවේදිත්වය පළමුවෙන්ම පිරිනමනවා. මම සභා වාර්තා දෙකම කියෙව්වා. මේ අවස්ථාවේ මට පුංචි පැහැදිලි කිරීමක් කරන්න ඕන. මගේ කොට්ඨාශයෙ යම් සිදුවීමක් පිළිබඳව කතා කරලා තිබුණා. ඒ පිළිබඳව සහෝදර මන්ත්‍රීවරුන්ට පුංචි පැහැදිලි කිරීමක් කරන්න මෙය අවස්ථාවක් කර ගන්නවා. සභාපතිතුමා යෝජනාවක් ඉදිරිපත් කරලා තිබුණා. ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත යම් මුදලක් ගෙවන්න. මාර්ග නම් කිරීම යන කාරණයක් සඳහා. ඒ වෙලාවේ එතුමා බොහොම අපහසුතාවයට පත්වෙලා තිබුණා. ඒ කාරණාව සම්බන්ධව හොඳටම දන්න පුද්ගලයා ලෙස මම සභාවෙ නොසිටීම පිළිබඳව මම

කනගාටු වෙනවා. පැහැදිලිවම පසුගිය අයවැයෙන් යෝජනා වෙච්ච යෝජනා අතර, අපේ මන්ත්‍රීවරු හැමෝම දන්නවා. මේ යෝජනාව ලබාගත්තේ ග්‍රාමීය කමිටුව හරහා. ඒ නිසා මගේ කොටසේ ග්‍රාමීය කමිටු හරහා යෝජනා ඉදිරිපත් කරන කොට, ඒ මන්ත්‍රීවරුන් වෙනුවෙන් වෙන් වුණ ලක්ෂ 40 ක මුදල සඳහා, අපට යම් යම් සීමාවල් දීලා තිබුනා. ඒ කාරණා වලට යොමු කරන්න ඒ සීමාවන් තිබුණේ. පරිසරය සම්බන්ධ කටයුතුවලට බොහොම පොඩි මුදලක්, ලක්ෂ දෙකක තුනක වගේ මුදලක් වෙන්කරලා තිබුනෙ. අපේ සමිතියෙ මේක නොගන්න සාකච්ඡා කරන කොට, කමිටුවෙන් ඉස්මතු වුණා. වීථි පහන් සවි කිරීම සහ මාර්ග නම් කිරීමේ බෝඩ් සවිකිරීම ගැන. ඒ නිසා මම මේ සභාවේ යෝජනා හැටියට මාර්ග නම් කිරීම සම්බන්ධවයෝජනාවක් ඉදිරිපත් කළා. ඒ මුදල් වලින් කොටසක් වීදි පහන් සවි කරන්නත්, අනෙක් කොටස මාර්ග නම් නොකල ප්‍රදේශවල මාර්ග නම් කරන්නත්. ඒ අනුව ප්‍රාදේශීය ලේකම්තුමා විසින් ප්‍රාදේශීය කමිටුවේ දී, එම යෝජනාව ලබාගෙන, අපේ සභාපතිවරයාට එම යෝජනාව ලබා දීල තිබුණා. මේ දෙකම සභාව සතු කාරණයක් නිසා, මාර්ග නම් කිරීමේ කටයුත්ත සභාව හරහා කරන්න මිල ගණන් කැඳවල සිදුකළා. ඒකෙ මුදල් අනිවාර්යයෙන්ම ප්‍රාදේශීය ලේකම් ප්‍රතිපූර්ණය කළ යුතු මුදලක්. ඒ නිසා එම කොන්ත්‍රාත්තුව කරපු අයගෙ දැඩි ඉල්ලීම මත තමයි සභාපතිතුමා, මේ ඉල්ලීම කරලා තිබුණේ. නමුත් ඒක අනුමත කිරීමේ ගැටලුවක් මතුවෙලා තිබුනා. නමුත් එහි සම්පූර්ණ වගකීම ප්‍රාදේශීය ලේකම්තුමාට සම්පූර්ණයෙන්ම තියෙනවා. ඒ මුදල් ලබාදීමේ වගකීම මම ගරු සභාපතිතුමාට ඉදිරිපත් කරනවා. ප්‍රාදේශීය ලේකම්තුමා හරහා එම මුදල් ලබාගැනීමට කටයුතු සූදානම් කරන්න කියලා මම සභාපතිතුමා ගෙන් ඉල්ලා සිටිනවා. ගැටලුව වෙලා තිබුනෙ, එක මාර්ගයක් නම් කිරීමේදී දොඩම්ගොඩ මාර්ගය නම් කිරීමේදී, එකම පාර දෙපැත්තට ගමන් කරන්නේ පාරවල් දෙකක් තියෙනවා. සමගිගම කියලා නම් කලා. ඒ පාරෙම ඉතිරි කොටස දොඩංගොඩ මාවත මාර්ගය කියන නිසා, එහෙම නම් කරලා, බෝඩ් සවි කරන්න කමිටුවේදී ගනිපු තීරණයක් ලෙස අපි නම් කළා. නමුත් මෙම මාර්ගය නම් කිරීමේදී ග්‍රාම නිලධාරීතුමිය එතන ඉන්නවා. එතුමියගෙන් කතා කරලා ඇහුවම, සමගි ගම කියලා දෙකක් තියෙනවා කිව්ව එවිට තමයි සමගිගම පාර, දොඩංගොඩ මාවත දෙකම ගැහුවෙ. කොහොම නමුත් ඒ දෙකෙන් එකක් වෙනස් කරල දාන්න අපට පුළුවන්කම තියෙනවා. දැනටමත් කැමැත්තක් නැත්නම්, මම ඒ කාරණය සිහිපත් කළේ මන්ත්‍රීවරුන්ගේ දැනගැනීම සඳහා. මේ සම්බන්ධව කිසිදු අකටයුත්තක් සිදුවෙලා නැතැයි කියන කාරණය තමයි පැහැදිලි කලේ. ඒ පිළිබඳව සිහිපත් කරමින්

මම විනාඩියක් දෙකක් විතර මෙම වෙලාවේ පුංචි අදහසක් ඉදිරිපත් කරන්න කැමතියි. අපේ මන්ත්‍රීවරුන්ගෙන් බහුතරයක් ඉන්නේ බෞද්ධ ආගම නියෝජනය කරන මන්ත්‍රීවරුන්. ආගම දහමට ගරු කරමින් ජීවත් වෙනවා. අපි හැමදාම උදේ හවස මල් පහන් පූජා කරලා ගාථාවන් කියනවා. පූජේමි බුද්ධං කුසුමේන නේන මේක ගාථාවක් වුනාට මේක භාවනාවක්. යථාර්ථය මොකද්ද? මේ සියල්ල අනියතයි. යම් දවසක විනාශ වෙනවායි කියන කාරණය මම ඒක සිහිපත් කළේ. ඔබට මතකයි අපි මේ රටේ පාලනය භාර ගන්න, බැසිල් මහත්තයා හැදුවා පක්ෂයක්. ලකුණ පොහොට්ටුව. හැබැයි මම අර කියපු විදිහට පොහොට්ටුව පිළිබඳ විවිධ විග්‍රහයන් ඉදිරිපත් වුණා. මේ පොහොට්ටුව විකසිතවෙන්නේ උදේට සූර්ය රශ්මියෙන්. ඒ වගේම වෙන ද කවදාවත්ම නැති විදිහට, ජනතාවගේ රශ්මියෙන් පොහොට්ටුව කියන පක්ෂය විකසිත වුණා. සුවඳ විහිදෙව්වා. අර කියපු සැබෑ යථාර්ථයට අනුව, පරවීම සිද්ධ වෙන්න පටන් ගත්තා. ඒ පරවීමේ උපරිම අවස්තාවට පැමිණිලා තියෙනවා අද. ඒ සියලු දෙයින් අපි සියලු දෙනා යථාර්ථය අවබෝධ කරගත යුතුයි. අපි බෞද්ධයො විදිහට, මොකක්ද බෞද්ධයෙකුට ඇරෙන්න වෙන කෙනෙකුට රටේ නායකත්වය දැරීමේ හැකියාවක් නැහැ. ඒ නායකයා විතරක් නෙවෙයි හැම නායකයෙක්ම මේක තේරුම් ගත යුතුයි. එදා විකසිත වෙච්ච පොහොට්ටුව සුවඳ වෙනුවට අපට ගන්ධය විහිදුවන පුෂ්පයක් බවට පත්වෙලා තියෙනවා. අපේ හිටපු සභාපතිතුමා කතා කළ විදිහට, අද මේ රටේ ඉතාම බැරෑරුම් ප්‍රශ්නයක් බවට පත්වෙලා තියෙනවා. මේක රටේ අවාසනාව. මම දකින්නේ, අපි සියලු දෙනාට වඩා, අපේ රටේ මතු අනාගතයේ විනාශය දක්වා යන ගමනක් බවට පත්වීම ගැන ඉතාම දැඩි කණගාටුවක් තියෙනවා. ඒකට හේතුව මේ තත්ත්වය උඩ ළමා මනස පිළිබඳ සලකා බලපුවම, අද ඔබ කල්පනා කරල බැලුවම, පසුගිය 09 වෙනිදා ටීවී එකේ උදේ ඉඳලම හැන්දෑ වෙනකම්ම මොනවද ගියේ කියලා කල්පනා කරලා බලන්න. අරගලය, අරගලය.

මේක පුංචි දරුවන්ගේ මනසට විශාල ලෙස බලපෑවා. එදා ඉදල නෙවෙයි පෙර ඉදලම එහෙමයි. උදාහරණයක් විදිහට, එක්තරා විද්‍යාලයකට යන්න පුංචි ළමයි කණ්ඩායමක් එනවා. නමුත් ඔවුන් ගැහැනු හා පිරිමි වශයෙන් දෙපැත්තට බෙදිලා, එක කොටසක් අපේ ගමන අපි යනවා, බැසිල් බැසිල් කපුටු කාක් කියලා ප්‍රකාශ කරනවා. මේ අලුත අපි නිවසකට ගියා. එහි සිටියා බහතෝරනා ළමයෙක්. බහ තෝරන්නත් බැහැ. බැසිල් කපුටු ඇත්තටම සිංදුවක් වශයෙන් කියනවා. බහ තෝරන්න බැරි ළමයි එහෙම කියනවා. මේවා දරුවන්ගේ මනසට ගියහම, අපි දරුවෝ හදන ගුරුවරු හැටියට, හරි කණගාටුවෙන් කියන්නේ. දරුවන්ගෙ මනස හදන්න තියෙන්නෙ. කොහොමත් මහා දරුණු විදිහට, අධ්‍යාපනය බිඳ වැටිල තියෙන්නෙ. අපේ හිටපු සභාපතිතුමා කතා කළ විදියට, අපේ ජේ.ආර්. මහත්තයා හදපු විධායක බලතල පිළිබඳ මොනතරම් පුරසාරම් දෙඩෙව්වත්, අද මොකද මේ වෙලා තියෙන්නේ. අද මේ රටේ විධායකය විනාශයි. විධායකයක් නැහැ. හිටියට වැඩක් නැහැ. කොහේද ඉන්නේ කියලා දන්නේ නැහැ කවුරුවත්. විධායක බලය අන්ත පිරිහීමට පත් වෙලා. හැබැයි ජේ. ආර්. මහත්තයා කිසිවිටෙකත් හිතුවේ නැහැ. ගැහැණියෙක් පිරිමියෙක් කරන්න බැරි ඒ බලයට, මෙහෙම වෙයි කියලා. අද කෝ ඒ බලය? කොහෙද තියෙන්නේ? නැත්තටම නැතිවෙලා. ඊලග එක, ව්‍යවස්ථාදායකය. අද ඔය කියන 225ම එපා කියන මට්ටමට ව්‍යවස්ථාදායකය පත්වෙලා. අද එක අගමැතිවරයෙක් හෙට කවුරු වෙයිද දන්නෙ නැහැ. අන්න ඒ පිළිබඳ සිහිපත් කරමින්, ඒ විනාශය සිදුවෙලා හමාරයි. ඒ සියල්ලටම කලින්, මේ දෙකම විනාශ වුණත්, අධිකරණය ආරක්ෂා වුණා නම්, මෙවැනි ගැටලුවකට මුහුණ දෙන්න සිද්ද වෙන්න නැහැ. ඒ නිසා ඔබ දන්නවා අරගලය පටන්ගත්තේ හැමෝම හරිම නිර්මාණශීලී කියලා. හැබැයි නිර්මාණශීලී තරුණ තරුණියෝ පටන් ගත්තෙම go home ගෝඨා කියලා. මේක සිංහල සංස්කෘතිය අනුව නිර්මාණශීලීත්වයක් ද? ගෝඨාභය පල ගෙදර කිව්ව නම් ඒකත් වටිනවා. අපේ සිංහල සංස්කෘතිය හැටියට, අපේ ආගමේ හැටියට, ගෝඨා ගෝ, රනිල් ගෝ මයිනා ගෝ. හැම එකක් පිටුපසට දැම්මෙ ඉංග්‍රීසි කෑලි. අපේ කෑල්ලක් නැහැ. නිර්මාණශීලීත්වය මේක ද කියන එක අපි සිහිපත් කළ යුතුව තිබෙනවා. විධායකය/ ව්‍යවස්ථාදායකය/ අධිකරණය යන තුනම බිඳ වැටුනහම, රටකට යන කල මොකක්ද කියන එක ප්‍රශ්නයක්. මේ සියල්ල මේ සියල්ල කැඩෙන විට, අපේ පැරණි නායකයෝ, ආගමික නායකයෝ අතීතයේදී නිර්මාණශීලී දෙයක් කළා. නමුත් අද අපේ ආගමික නායකයොත්, ඒ අරගල කරුවන් හා එක්වෙලා ආගමේ තියෙන සත්‍යය පවා විකෘති කරමින්, ආගම අවභාවිතා කරන්න පටන් ගත්තා. මම දැක්කා අරගල භූමියේ එකපැත්තක පිරිත් කියනවා. අනිත් පැත්තෙන් පරුෂ වචන කියමින්, අරගල කරනවා. පිරිත් කියන්නේ මෛත්‍රිය පතුරුවන්න. අනෙක් පැත්තෙන් වෛරය පතුරවනවා. මේක අවභාවිතා කිරීමක් නොවෙයිද? තවත් කනගාටුවක් තියෙනවා. මෙහි පෙරමුණ ගත් බෞද්ධ ආගමික නායකයෝ වෛරය වපුරන්නෙ නැති විදිහට, මේක නිර්මාණශීලී දෙයක් කලා නම්, අපි සතුටු වෙනවා.

අනෙක් කාරණය තමයි, යම් වැඩක් සඵල වෙන්න නම්, යම් නායකත්වයක් තියෙන්න ඕන. මේ වෙලාවේ ඔය නායකත්වය තියෙන්නෙ කොහෙද කියන එක අපට ප්‍රශ්නයක්. විවිධ චෝදනා කරනවා. අකටයුතුකම් සිදු වෙනවා කියලා කවුද නායකත්වය ගන්නේ. කවුරුවත් ඉදිරිපත් වෙන්නේ නැහැ. නායකයෙක් නැහැ. මෙහි වගකීම බාරදෙන්න තිබුන නායකත්වයක් නැති තත්ත්වයට රට පත් වුණා. ආගමික නායකයොත් හරි දේ තේරුම් ගැනීමට උත්සාහ ගන්නේ නැහැ. මේ සියල්ල එක්ක, රටේ විනාශය දකින්නේ. ඔබතුමාලා කතා කරපු දේවල් ගත්තම, මේ රටේ ජාතියේ අවාසනාව. තවදුරටත් මේ රටේ තියෙන නීතිය නිවැරදිව ක්‍රියාත්මක වුණේ නැත්නම්, මේ රටට කුමන නායකයා ආවත්, පාලනය කරන්නේ කොහොමද කියන ප්‍රශ්නය මතුවෙනවා. මේ සමහර නායකයෝ කතා කරන විදිහට අපට පුළුවන්කම තියෙන්න ඕන. මේ රටට, කිසිම රටක පිළිසරණක් නැතිව, තනිව ජීවත් වෙන්න පුළුවන් වෙන්න ඕන. ඒවගේ කිසිම රටක් කොහෙවත් නැහැ. ඒ නිසා අපි බලාගෙන ඉන්නවා කණගාටුවෙන්. මේ රටේ අනාගතය බාරගන්න ඉන්න පිරිස්, මේ තත්වෙන් රට මුදාගෙන, ඉදිරියේදී පාලනය කරන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන්. ඒ අයත් අර මම කියපු යථාර්තය තේරුම් ගන්න ඕන. නැත්නම් මිනිස්සු හිතන තත්ත්වයට ඔබ වෙනස් වෙන්න වේවි. එසේ නොවුන හොත් හිටපු නායකයන්ගෙ තත්වයක් ඔබට උදාවේවි. ඒක හිතේ තියාගෙන මෙම නායකයින්ට කටයුතු කරන්න කියලා

සිහිපත් කරමින්, ඔබ සියලු දෙනාට යහපත් අනාගතයක් උදා වේවා කියා පතමින්, මා නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

සියලු දෙනාගෙන් අවසරයි. මම පළමුවෙන්ම දැඩි වේදනාවට පත් වෙනවා. රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ නිවස රටක් ලෝකයක් වටින පුස්තකාලයට ගිනි තැබීම සම්බන්ධව. සභාපතිතුමනි, ඇත්තටම මමත් එම අවස්ථාවේ අරගල භූමියෙ තමයි හිටියේ. හැබැයි ඒ වෙලාවේ රාත්‍රි 11 ට විතර තමයි ඔය ආරංචිය ලැබුනම දරාගන්න බැරි වුණා. මම ඒ වෙලාවෙම එම අරගල භූමියෙන් පිටව ගියා. හැබැයි මම හිතනවා. විවිධ කණ්ඩායම්, විවිධ ප්‍රදේශවලින්, මෙම අරගල භූමියට ආවා. විශේෂයෙන් නුවර, අනුරාධපුර කෝච්චිවලින් තමයි ආවෙ. මාධ්‍යවලින් දකින්න ඇති. ඔබතුමාලා එතනට එන ඒ අරගල භූමියේ ඉන්න කට්ටියවත්, මේ ප්‍රදේශවලින් යන කට්ටියවත්, අතර සම්බන්ධතාවයක් නැහැ. එතැන විවිධ ප්‍රදේශවලින්, රටේ පීඩනයත් එක්ක, තරුණයො විතරක් නෙවෙයි. විවිධ වයස් මට්ටම් වල මිනිස්සු ආවා. බොහොම අමාරුවෙන් (වයෝවෘද්ධ) අරගල භූමියට ආපු කට්ටිය හිටියා. එතන ගෝඨාභය රාජපක්ෂ මහත්මයා ඇතුළු මේ කණ්ඩායම මේ කට්ටිය අත්කර දීපු, මේ ආර්ථික දරිද්‍රතාවය තුළ, මිනිස්සු ඇත්තටම අපහසුතාවයට පත් වෙලා. අපේ ගම්වල මිනිස්සු අහනවා. ඔබතුමාලා මේ පිළිබඳව සම්බන්ධ වෙන්නෙ නැද්ද කියලා. ඔබතුමාලා මේකට මැදිහත් වෙලා නිරාකරණය කර දෙන්නේ නැද්ද කියලා. ගමෙනුත් දැඩි පීඩනයක් අපට දෙනවා. ඇත්තටම මම තීරණය කළා. මේ අරගල භූමියට ගිහිල්ලා, අපෙනුත් සහයෝගය දීලා, මේ ප්‍රශ්නය මොකක් හරි බේරුමක් කරගන්න. අරගලයේ හිටිය කට්ටිය ගෙවල් ගිනි තියන්න, ගෙවල් කඩන්න, මංකොල්ල කන්න යන පිරිසක් නෙවෙයි. සමහර විට ඔය කණ්ඩායම ඇතුලේ, එහෙම බලාපොරොත්තු වෙන පිරිසකුත් ඉන්න ඇති. නමුත් මම දන්නවා. අවංකවම මේ පිරිස ඇතුලේ, අරගල භූමියෙ යම් කඩාකප්පල්කාරී පිරිසකුත් ඉන්න ඇති. අපි මේ රාජපක්ෂ ආණ්ඩුවට කිහිප අවස්ථාවකදීම යන්න කියලා උද්ඝෝෂණය කරල... මේ තනතුරු අතහැරලා, කරන්න පුළුවන් කෙනෙකුට කරන්න දෙන්න කියලා ඉල්ලීම් කලා. ඇහුන්කම් දුන්නෙ නැහැ. හැබැයි මොකද වුනේ, මහින්ද මහත්තයා අයින් වෙන්න මොහොතකට පෙර, අරගල භූමියට කඩා වැදිලා, පිට පිට පහර දුන්නා. මේ කට්ටිය මේ අරගලය ඉදිරියට යන්න හේතුවුණේ, මේ මහින්ද මහත්තයාගේ කඩාකප්පල්කාරී ක්‍රියාදාමය. තමුන්නාන්සේලා ඉන්නවා. පොහොට්ටුවේ මන්ත්‍රීවරු. ඒකට ගිහිපු නැතැයි කියන්න බැහැ. ඒ ගිහිපු කට්ටිය තමයි පහර දුන්නේ. නිර්පාක්ශික අරගලයට ඔලුව පැලුවා. හට් කැඩුවා. ඇත්තටම මම කියාගෙන ආවේ මේ දේශපාලන අරගලයේ ලේබල් ගහන්න කටයුතු කරනවා නම්, ඒක වැරදියි. අරගලය කිව්වට, මම මේ දැකපු දෙයක් තමයි උප සභාපතිතුමා. මේ අරගල භූමියෙ විවිධ වයස් කාණ්ඩවල පුද්ගලයන් හිටියා. ඒ වගේම විවිධ මත දරන අය හිටියා. වැරදිලා මමත් මන්ත්‍රීවරයෙක් කිව්ව නම් මටත් ගහන සයිස් එකට හිටියා. මම දැක්කනෙ රාජිත මහත්තයටත් එලව එලවා ගැහුවා. මම එතන හිටියෙ අරගලයේ කෙනෙක් විදියටම. ඇත්තටම සභාපතිතුමනි, මේ මිනිස්සු ඉතාම අමාරුකම් මැද ජීවත් වෙන්නේ. ඇත්තටම අපට වුනත් පුද්ගලිකව පේනවා. අපට වුණත් තුන්වේල කාලා ජීවත් වෙන්න බැරි තත්ත්වයක් තියෙන්නේ. දරුවන්ට උගන්නන්න පවා බැරි තත්ත්වයකට පත් වෙලා තියෙන්නේ. අපි හැමදාම නිහඬව ඉන්නවා කියන්නේ, ගම් වල මිනිස්සු අපි ගැන බලන්නේ කුමන කෝණයකින් ද? අන්තිමට ගමේ කට්ටිය කිහිපදෙනෙක් මාත් එක්ක එන්න ඇහුවම, මම එපා කිව්වා. මොකද මට බෑ ඔයගොල්ලන්ගේ ජීවිත වලට වන්දි ගෙවන්න කියලා. ජීවිත හානියක් වුණොත් ඒ දරු පවුල් වලට වගකියන්න බැහැ. මම කට්ටියට කිව්වා. මම යනවා කවුරුවත් එන්න එපා කියලා. ඇත්තටම මම බැලුවෙ, මගේ නෝනා රස්සාවක් කරනවා. මම මැරුණත්, ඒ දරුවන්ව එතුමිය බලයි. නමුත් මගේ ගමේ අය නියෝජනය කරන්න ගියා. ඔය ජනාධිපති මන්දිරයේ මම හිටපු අවස්ථාවෙදි නම්, එවැනි දේවල් වුණේ නැහැ. ඇත්තටම මම මේ අරගල කරපු කොටසට ගෞරව කරනවා. මොකද මේ රටේ යම් වෙනසක් කරන්න, අද ජනතාවට ඒ දේ ලැබිලා තියෙනවා. මෙතුමා කිව්ව වගේ, ව්‍යවස්ථාදායකය, විධායකය ඉන්න කණ්ඩායම, අද කුලල් කාගන්න තත්ත්වයට පත්වෙලා තියෙන්නෙ. රටේ විශාල පිරිසක් පාරට බැහැලා, විශාල වෙනසක් කරල දුන්නා. නව පාලනයක්

උදාකර ගනීය කියල. මේ තත්ත්වය උදා කරලා දුන්නත්, අද විධායකයෙ කට්ටිය තනතුරු වලට කුලල් කාගන්න තත්ත්වයට පත්වෙලා තියෙනවා. එච්චර හොඳ තත්ත්වයක් නෙවෙයි. සභාපතිතුමනි, ඉක්මන් විසඳුම් ලබා ගන්න තමයි, සර්ව පාක්ෂික ආණ්ඩුවක් තනන්න, අරගලවල කට්ටිය සූදානම් වුණේ. නමුත් තවම එසේ වුණේ නැහැ. පුළුවන් කෙනෙක් ඉදිරිපත් වෙලා, එයාට සහයෝගය දෙන්න ඕන. නුදුරු කාලයේ දී මිනිසුන් හිතන පතන ආකාරයට, ආණ්ඩුවත් ඇති වෙලා, රට නිවැරදි මගකට ගමන් කරවයි කියලා.
ඒ වගේම මම ඉල්ලීමක් කරනවා. ගරු සභාපතිතුමනි, තල්ගස්වල වත්ත ඇතුළු වතු සමාගම් ගරු සභාවට අයත් මාර්ග භාවිතා කරනවා. වතු සමාගම්වලින් දැන් බොහෝ කලක සිට නඩත්තු කටයුතු කරන්නේ නැහැ. සභාපතිතුමනි, තල්ගස්වල වත්තෙ වන ජීවත්වන ජනතාව, මා දැනුවත් කළා. පයින්වත් යන්න බැරි තත්ත්වයට එම පාරවල් පත්වෙලා කියලා, මම ඉල්ලීමක් කරනවා. වතු සමාගම්වල දැනුවත් කරන්න කියලා. මේ සම්බන්ධයෙන් මොකද අධික ලාභ ලබන වතු සමාගම් වුනාට පාරවල් නඩත්තු කටයුතු නිසි ලෙස ඉටු නොවන නිසා, එය ආශ්‍රිත මිනිසුන් දැඩි අපහසුතාවයට පත්ව ඇති නිසාත්.
ඒ වගේම අපේ සභාවෙ තියෙන පෙර පාසල් පිළිබඳ ගැටලුවක් තියෙනවා. මොකද ඒව ඉන්ධන ප්‍රශ්න නිසා, පවත්වාගෙන යාමේ දැඩි අපහසුවක් ඇති වෙලා තියෙනවා. ඒ නිසා ගම්වල මිනිස්සුන්ගේ දරුවන්ට එතරම් එය බලපාන්නේ නැහැ. මොකද පෙර පාසල ආශ්‍රිත දරුවො තමයි වැඩි දෙනෙක් ඉන්නේ. ඒ නිසා එම පෙර පාසල් පවත්වාගෙන යාම ගැටලු සහගත නොවන බව තමයි දෙමව්පියන් ගේ අදහස වී තියෙන්නෙ. ඒ නිසා ඒවා පවත්වාගෙන යන්න උපදෙස් දෙන්න. ගරු සභාපතිතුමනි, පෙර පාසල් පාලිකාවන් තමයි ඔය නිවාඩු ඉල්ලලා තියෙන්නේ. ඒක නිසා තමයි නිවාඩු ලබා දුන්නේ.
නීතිය හා සාමය පිළිබඳ ගොඩක් මන්ත්‍රීවරු කතා කළා. ගරු සභාපතිතුමනි, නීතිය වල් වැදුනෙ මේ ගෝඨාභය රාජපක්ෂ මහත්තයා, ජනාධිපති වුණාට පස්සේ. අපි දැක්කා බැසිල් රාජපක්ෂ නඩු කිහිපයකින් නිදොස් කොට, නිදහස් වුණා. අධිකරණය බලාගෙන සිටියා. දේශපාලන ඇඟිලි ගැසීම් තුළදී, ඒ නිසා අද නීතිය අවනීතිය බවට පත් වුනා. අද ගමේ පොලිසියටත් එහෙම වෙලා. අද අපේ රටේ මේ විදේශීය ඩොලර් ප්‍රශ්නයටත් වග කියන්න ඕන. බැසිල් රාජපක්ෂ මම දැක්කා උණ්ඩියල් ක්‍රමයට මුදල් හුවමාරුව. (අජිත් නිවාඩ් කබ්රාල් පාර්ලිමේන්තුවෙ ඉඳලා මහ බැංකුවට ගිහිල්ලා මුදල් අච්චු ගහන මැෂිමක් ගෙනැල්ලා විදේශිකයාගේ මුදල් ගෙන්වලා, බියගම මුදල් ගහන තැනින් මුදල් ගහලා, බැසිල් මහත්තයාගේ ගිණුමට යනවා.
බැසිල් මහත්තයා මේ රටට ඇවිල්ලා රාජපක්ෂවරු කෑවා වගේම, මේ රටත් කෑවා. මේ කරපු හැම විනාශයකටම වගකියන්න ඕන රාජපක්ෂවරුන්. අද දරුවන්ට කන්න බොන්නෙ නැහැ. මේ මූලික මිනිස් අයිතිවාසිකම් ටිකවත් ඉටුකරගන්න බැරි තත්ත්වයට මිනිස්සු පත් කළේ ඔවුන් විසින්.
කොතරම් නැව් ආවත් මේ ප්‍රශ්නයට විසඳුම් නැහැ. මේ රටේ තමයි පසුගිය කාලයේ යූරියා නිෂ්පාදනය කරන මැෂිම තිබුනේ. මේ පාලකයින් ඒක පරණ යකඩ වලට විකුණලා දැම්මා. අරාබියෙ ඕනතරම් යූරියා තියෙනවා. අද පිටරටින් යූරියා එනකම් කට ඇරගෙන බලන් ඉන්නවා. තියෙන සම්පත් විනාශ කරලා, ඒ වගේම් අනාගතයේ මොන ආණ්ඩුව ආවත්, මිනිසුන් මේ දැවෙන ප්‍රශ්න වලට ඔවුන් විසඳුම් ඉදිරිපත් කරන්න ඕන. එසේ නොවුණහොත්, මේ වගේ අරගල තව තවත් කරනවා. ඒ වගේම අපේ දරුවෝ උසස් අධ්‍යාපනය ලබන්නෙ ගෙදර තියාගන්න නෙවෙයි. ඔවුන්ට හොඳ අනාගතයක් උදාකර දෙන්නයි අපට ඕන. එනිසා පත්වන කුමන ආණ්ඩුව හරි, අනාගත සුභ සිද්ධිය වෙනුවෙන් කැපවුණු ආණ්ඩුවක් වෙන්න ඕන. ඒ වගේම අපේ රටේ අනාගතය වෙනුවෙන් ගන්න පුළුවන් ඕනම තීරණයක් ගන්න, අපි පසුබට නොවන බව පවසමින්, සියලු දෙනාට සුභ දවසක් පතමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. ඇත්තටම මම බලාපොරොත්තු වුණා ගෝඨාභය ජනාධිපතිතුමා රට හොඳ තැනකට ගෙන ඒවි කියලා. අපේ සහබන්දු හිටපු සභාපතිතුමා, අජිත් මැතිතුමා, නන්දන මන්ත්‍රීතුමා උප සභාපතිතුමාලා වගේ කෙනෙක්

ජනාධිපති වුණත්, මීට වඩා රටට හොඳක් වෙයි කියලා, අපි නවක මන්ත්‍රීවරු වෙලා ආවම, අපිට හිතුනා, ලොකු බලයක් තිබිලා තමයි ජනාධිපතිවරයෙක් පත් වෙන්නේ කියලා. ජනාධිපතිවරයාගේ වගකීමක් තියෙනවා. රටේ ජනතාව ආරක්ෂා කරන එක ගැන. සියලු දේ කරන ගමන් එතුමාගේ යුතුකමක් තියෙනවා මහජනතාව ආරක්ෂා කරන්න. නමුත් අරගලය පටන් ගැනීමේදී දවසක් දෙකක් යනකොට, ගරු සභාපතිතුමනි, සාකච්ඡා මාර්ගයෙන් හෝ වෙනත් විසඳුමක් දෙන්න හැකි අවස්ථාවක් ජනාධිපතිතුමා නැති කරගත්තා. ඒ වගේම ගරු සභාපතිතුමනි, අපේ වනමල් මන්ත්‍රීතුමාගේ කතාවේදී අපට මතක් වෙනවා එක දෙයක්. අරගලයට වනමල් මන්ත්‍රීතුමා වගේ දහයක් දොළහක් ගියානම්, ඒ අහිංසක කොල්ලෝ, කෙල්ලෝ මුලා කරන්න ඇති. ඔවුන් කුපිත වන ලෙස කතා කරලා, මෙතන කතා කිරීමේදී මට සමාවෙන්න, මන්ත්‍රීතුමා මම ඔබට ගරු කරනවා. ජ්‍යේෂ්ඨ මන්ත්‍රීවරයෙක් විදිහටත්, අපට වඩා වැඩිමල් කෙනෙක් හැටියටත්, මේ සභාව තුළ ගරුත්වයක් ඇතිව කතා කරන්න කටයුතු කළේ නැහැ. අපි කනගාටු වෙනවා. අපේ ආණ්ඩුවක් තිබුණේ. නමුත් අපි ගරු කරනවා අපේ මහින්ද රාජපක්ෂ මැතිතුමාට, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට. ඒ අපේ නායකයෝ. නමුත් වැරදි තියෙන්න ඇති. අපි අරගළයට ගරු කරනවා. අරගලය සාමකාමී වෙන්න ඕන. අරගලයට 9 වැනිදා ගිහින් ගැහුව නම්, ඒකත් වැරදියි. ඒක අනුමත කරන්නේ නැහැ. නමුත් මේ 9 වෙනිදා කරන අරගලය, ගේට්ටු කඩාගෙන, ජනාධිපති මන්දිරයට ඇතුළු වෙනවා නම්, අග්‍රාමාත්‍ය කාර්යාලයට කඩා වැදිලා, අරලියගහ මන්දිරයට කඩා වැදිලා, යට ඇඳුම් පවා ප්‍රදර්ශනය කරනවා. අපි දැක්කා. අපි ඒවා හොඳ දේවල් ලෙස දකින්නේ නැහැ. නමුත් අපි දන්නවා. දුප්පත් මිනිස්සු මේ පෝලිම් වල දුක් විඳිනවා. ඇත්තටම රටේ ප්‍රශ්නයක් තියෙනවා. අපි මෙතැනට ඇවිල්ලා, ඒ මිනිස්සුන්ගෙ වැරැද්දක් දකිනවා නම්, ඒ වැරදි වලට උල්පන්දම් දෙන්නෙ නැහැ. අපි ඉල්ලීමක් කරනවා. රට හොඳ තැනකට ගේන්න ඕන නම්, පක්ෂ භේදයකින් තොරව සියලු දෙනාම කටයුතු කරන්න ඕන. අපි කවදත් දකින්නේ නැහැ. මේ රටේ හොඳ ගමනක් යයි. අපට දැන් අවුරුදු තිස් පහක් හතළිහක් වෙනවා. කාලය ගෙවිලා තියෙන්නේ. නමුත් තව පුංචි කාලයකින් අපි මියයයි. නමුත් මේ හැදෙන අහිංසක පරපුරට රටක් නැති වෙනවා. ඉදිරි කාලයේදී අපි දකිනවා එක දෙයක්. රනිල් වික්‍රමසිංහ කියන්නේ කාටවත් වරදක් කරන්නෙ නැති, කිසි කෙනෙකුට මාධ්‍ය සාකච්ඡාවක දී වත්, අපහාසයක් නොකරන, ඉතාමත් හොඳ නායකයෙක්. නමුත් මෙතුමාගේ නිවස ගිනි තැබීම සම්බන්ධව අපිත් කම්පනයට පත්වෙනවා. මොකද කාටවත් අගෞරව කරන නායකයෙක් නෙවෙයි. ඔහු ඒකට බැරි නිසා තමයි වනමල් මන්ත්‍රිතුමා, සජිත් මහත්තයා ගාව හිට ගත්තේ. එතුමා කැමැති නෑ කාටවත් අපහස කරනවට. ඇත්තටම අපි හැමෝම සෑහෙන්න අපහසුතාවයටත්, දුකටත් පත් වෙනවා. ඒ වගේ හොඳ නායකයෙක්ගේ නිවසත් ගිනි තැබීම සම්බන්ධව අප කනගාටුවට පත් වෙනවා.

ඒ සම්බන්ධයෙන් මතක් කරමින්, ඔබතුමාගෙන් අපි ඉල්ලීමක් කරන්නේ, ඇත්තටම මේ වෙලාවේ රට බාර ගන්න, අනුර කුමාර මහත්තයා, සජිත් මහත්තයා, අපට පක්ෂ බේදයක් නැහැ. හරි තැන හිට ගන්නවනම්, පක්ෂ පාට භේදයකින් තොරව අපි සහයෝගය දෙනවා. අපි විවේචනය කරන්නේ නැහැ. නමුත් බාරගන්න කියද්දි, අනුර කුමාර මහත්තයා, සජිත් මහත්තයා බැරිය කියද්දී, ඒ යන කෝච්චියට බෙල්ල තියන්න හරි, ඉදිරිපත් වුණේ, රනිල් වික්‍රමසිංහ මහත්තයා. නමුත් මාසයක් දෙකක් යන්න කලින් මෙතුමා ජනාධිපතිතුමත් සමග සැලැස්ම ගහගෙන එනකොට, මේගොල්ලන්ට බලන් ඉන්න බැරි වුණා. ඩීසල් නැව් ටික, පෙට්‍රල් නැව් ටික ලංකාවට එනවා කිව්වම, මේ අයට බලන් ඉන්න බැරි වුණා. ඇත්තටම ලැජ්ජ වෙන්න ඕන. කාලයක් දෙන්න ඕන. මේ මාස හය හත ඇතුලත යමක් කරන්න ඕන. නැත්නම් පාරට බැහැලා මේ දේවල් කරනවා කියලා, ඇත්තටම එහෙම මොනවත් නොකියා, රනිල් වික්‍රමසිංහ මහතා එතුමාගේ නුවණ පාවිච්චි කරලා ජනාධිපතිතුමත් එක්ක එකතු වෙලා, යමක් කරන්න හදද්දිම, ඒ දේ විනාශ කළා.

අපේ සහබන්දු මැතිතුමා කිව්වේ වගේම ,නැව ටික ඒවි මාසයක් දෙකක් යද්දී. ඒ දේවල් නවතීවි. අගමැති කවුරු උනත් කමක් නැහැ. රටට හොඳ දේවල් වෙනවා නම්. ජයවීර මන්ත්‍රිතුමා, අපි ඕගොල්ලොත් එක්ක හිට ගනීවි. වනමල් මන්ත්‍රිතුමා අපි ඕගොල්ලන් එක්ක හිට ගනීවි. අපි ඔබතුමාලා විවේචනය කරන්නේ නැහැ. නමුත් අපේ නාගොඩ ප්‍රාදේශීය සභාව තුළ ඉන්නේ බොහොම අහිංසක මිනිස්සු ටිකක්. අපේ ලක්රුවන් මන්ත්‍රීතුමාගේ ගේත් ගිනි තිබ්බා.

කවදාවත්ම වෙන්නැති වැඩක්. මේ සභාවට ගල් ගැහුවා. අපි කවදාවත් ප්‍රාදේශීය සභාවට ඡන්දය ඉල්ලන එකක් නෑ. අපි හිතන විදිහට නමුත් මේ සභාවට, පත් වෙන කාට වුනත්, වැඩක් කරන්න බැරි විදිහට, මේ ප්‍රදේශ පත් කරන්න එපා. ඔබලාටත්, ජයවීර මන්ත්‍රීතුමා ඔය අසුනේ ඉඳ ගන්න පුළුවන්. වනමල් මන්ත්‍රීතුමා ඔය අසුනේ හිඳ ගන්නත් පුළුවන්. ඒ නිසා අපි ප්‍රාර්ථනා කරනවා. මේ දැනට මම ජයවීර මන්ත්‍රීතුමාට අපහාස කරන්නේ නැහැ. ඔබතුමා පෙළඹීම් කලා කියන්නෙත් නැහැ. නමුත් මහජන නියෝජිතයන් විදිහට මහජනතාව කුපිත කරගෙන ගිහිල්ලා, ඒකෙන් සතුටක් ලබනවා නම්, ඒක කාලකන්නි සතුටක් වෙනවා.

ඒකත් මතක් කරමින් ජනාධිපතිතුමාටත්, අගමැතිතුමාටත්, යම් කාලයක් දීලා, මේ දේ කලා නම්, මීට වඩා හොඳයි කියලා කියන ගමන්ම, ජනාධිපතිතුමාගේ එකම දුර්වලකම. සහබන්දු උප සභාපතිතුමා, මේකට උත්තරයක් සාකච්ඡා මාර්ගයෙන් නොගත්ත එක තමයි මේකට ප්‍රශ්නය. අපි කල්පනා කරන්නේ, අපේ ජනාධිපතිවරයාගේ, අපේ සභාපතිතුමා වගේ. ඒක තමයි ඇත්ත කතාව. අපට සද්ද දාලා, අපේ කතාව නවත්තලා අපිත් සමග හිනාවෙලා කතා කළාම, අපට සියලු දේ අමතකයි. ඇත්තටම ජනාධිපතිතුමා පව්. මොකද වැඩක් කරන්න හදනකොටම හොරා හොරා කියලා කෑගැහුවට, රාජපක්ෂවරු හොරු වෙන්න ඇති. අපි දන්නේ නැහැ. නමුත් ගෝඨාභය රාජපක්ෂ මහත්තයට හොරකම් කරන්න කාලයක් තිබුණෙ නැහැ. මේ සහගහන කතා කියන එක වැරදියි. ඒක නිසා පිස්සෙක් වගේ කියන එක වැරදියි. එතුමන් ජනාධිපතිකම පටන් ගද්දිම, කොරෝනා වසංගතය ව්‍යාප්ත වුණා. ඒකට විසඳුම් සොයද්දී, ඒ වගේ ලොකු ලොකු දේවල් ටිකක් කරන්න කටයුතු කළා. අඩුපාඩු නැති මිනිස්සු නැහැ. නමුත් පටු දේශපාලන අරමුණු තියෙන තාක් මේ රට සංවර්ධනය කරා යන්නත් බැහැ. මේ රට ගොඩගන්නත් බැහැ. මේ අහිංසක පුංචි දරුවන්ට රටක් නැති වෙනවා. එක තමයි තියෙන්නෙ. ඒකත් මතක් කරමින්, අපි තවම කලබල නොවී ඉමු. පොහොට්ටුවේ එක පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්වත්, අගමැතිකමවත් පාර්ලාමේන්තු මන්ත්‍රී කමවත් කෑදරකමට ගන්නෙ නැතුව, ජනාධිපතිකම්, අගමැතිකම් සියලු දේ බාර දීලා අයින් වෙන්න ඕන. අපේ රංජිත් ජයවීර මැතිතුමාගේ පක්ෂයේ, සජිත් මහත්තයාගේ පක්ෂයේ, කට්ටිය මේවට පත් කරලා, මාස 6 ,7 යන කොට, බලමු මොනවද වෙන්නේ කියලා. එතනදී ඔබතුමාලා විවෘතව ආරාධනා කරන්න. සමන් මන්ත්‍රීතුමා මෙන්න සංවර්ධනය කරා රට ලඟා වෙනවා. අවුරුදු 1ක් ඇතුළත ඔබතුමාලත් එහෙම කරනවා නම් අපි ඔබතුමාලත් එක්ක අපි හිටගන්නවා. ඒ ගැනත් මතක් කරමින් රට අරාජික කරන වැඩපිළිවෙලකට,පෙළ ගැහෙන්න එපා. ඒවට උඩගෙඩි දෙන්න එපා, කියලා මතක් කරමින්, ඔබ සැමට සුභ දවසක් ප්‍රාර්ථනා කරමින්, නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. ඇත්තටම මම හිතන්නේ කතා කරන්න නෙවෙයි හිටියේ. නමුත් අවසාන කථාවාරය වෙව්ද දන්නේ නැහැ. නමුත් අපි හිතුවේ නැහැ ගෝඨාභය මහත්තයට යන්න වෙයි කියලා. රනිල් මහත්තයාට මේ වගේ දෙයක් උදාවෙයි කියලාවත්. ගරු සභාපතිතුමනි, මම සභාවට ආව මුල් දවස්වල ඉඳලා, මම බලාපොරොත්තු වුණේ, ආණ්ඩුවක් හැටියට පත් වෙලා, ගමේ මන්ත්‍රීවරයෙක් විදිහට ඇවිල්ලා, ගමට සේවයක් කරන්න. නමුත් මම හිතුවා. ගෝඨාභය රාජපක්ෂ මහත්තයා දක්ෂ නිලධාරියෙක් හැටියට.

ඒ වගේම ගරු සභාපතිතුමනි, අපි සභාවක් හැටියට වෙන සභාවන් වල ආදායම් උත්පාදනය කරන්න යම් යම් ක්‍රියාමාර්ග අරගෙන තියෙනවා. නමුත් මේ සභාවටත් විශාල සම්පත් ප්‍රමාණයක් තියෙනවා. නාගොඩ ගත්තත් මේ සභාවේ ආදායම් උත්පාදන ක්‍රමවේදයක් හදන්න තිබුණා. මහ උදවිය ඇවිල්ලා මේ ප්‍රශ්න වලට ක්‍රමවේදයක් හැදුවේ නැහැ වගේ, අපේ සභාවටත්, රජයෙන් ආධාරයක් නැතුව, පත්වන ඕනෑම පාලක පක්ෂයකට මේක කරගෙන යන්න බැරි වෙලා තියෙනවා. යම්තාක් දුරකට කරලා තියෙනවා. ඒක හරියට කරල නැහැ කියලා මම දැඩිව විශ්වාස කරනවා. රටට වුනත් ක්‍රමවේදයක් එදා ඉඳල හදලා තිබුණ නම්, මෙහෙම වෙන්නේ නැහැ. ඒ වගේම තමයි, අපට බල්බ් එකක් දාන්න කාගෙන් හරි සල්ලි හම්බ වෙනකම් ඉන්නවා. ඒ කාලය තුළත් වුණේ නැහැ. මම මේ පත්වෙච්ච කාලය තුලත් සිදු වුණේ නැහැ. කවුරු නායකයා විදිහට පත්වෙලා ආවත්, මේ සභාව නඩත්තු කරන්න, මේ සභාව කරගෙන යන්න පුළුවන් ආර්ථික පිළිවෙලක් හදන්න ඔබතුමාලට ශක්තිය ධෛර්යය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින්, ඒ වගේම

තමයි අපට 9 වෙනිදා, ලක්රුවන්, සුභාෂි ඇතුළු පිරිසට ලොකු අලාභ හානියක් වෙලා තියෙනවා. එතුමන්ලට තවම සාධාරණයක් ඉටුවෙලා නැහැ. දැන් ජේන විදිහට එතුමන්ලට සාධාරණයක් වෙන්නෙත් නැහැ. මන්ත්‍රීවරු විදිහට එකතු වෙලා යමක් කරන්න පුළුවන් නම් ඒක වටිනවා. ඒ වගේම, අපේ ලක්රුවන් මන්ත්‍රීතුමාට වැඩට යන්න පවා අපහසුතාවයකට පත්වෙලා ඉන්නේ. ඉතින් ඒ වගේ තත්ත්වයක් උඩ ජීවත් වෙන්නේ. ඔහුට අපි එකතුවෙලා හෝ යම් දෙයක් මේ සභාව  වෙනුවෙන් ඉටු කරන්න පුලුවන් නම් වටිනවා. ඉදිරි දින කිහිපයේ හෝ මේ සභාව හොඳ සභා වාරයක් කරගෙන යාමට, මේ සභා වාර්තාව ඉදිරිපිට තියෙන්නෙත්, හොඳම ප්‍රාදේශීය සභාව බවට පත් වෙනවා කියන අරමුණ. එය කවදා හෝ සැබෑ වේවායි ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා**

මූලාසනාරූඪ ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. අරාජික වෙච්ච රටක අද තියෙන තත්ත්වයත් එක්ක, ඇත්තටම අපි මෙතන සභා වාර්තාව පුරවලා, හැමදාම කතා කරලා යනවා විතරයි. කොහොම වුණත්, ගරු සභාපතිතුමනි, ඔබතුමා හැමදාම මේ සභාවෙ මූලාසන කතාවක් කරනවා. මම හිතන්නේ මමත් විවිධ සමිති සමාගම්වල ඉඳල තියෙනවා. හැබැයි මූලාසන කතාවෙ අර්ථය මොකක්ද කියලාවත්, ඔබතුමා දන්නේ නැතුව ඇති. මූලාසන කතාවක් කියන්නේ මම දන්න තරමින් සභාවේ කටයුතු එකිනෙක පෙලගසමින් ගරු මන්ත්‍රීවරු යෝජනා කරපු, කතා කරපු දේවල් වලට නියමිත උත්තර දීලා, ඒ වැඩසටහන් ක්‍රියාත්මක කරලා, ලබන සභාවාරයේදීවත් ක්‍රියාත්මක කරන ආකාරය පැහැදිලි කිරීම තමයි මූලාසන කතාවක ගැබ්වෙලා තියෙන්නේ ඕන. මම හිතන්නේ අවුරුදු 4 ½ කට කිට්ටු වෙන ප්‍රමාණයක් අපි මෙතනට ඇවිල්ලා, තේ එක බීලා, පැකට් එක අරගෙන, ඔබතුමා තෙල් ටික ගහගෙන, සියලු වරප්‍රසාද භුක්ති විඳලා, මේ සභාවට කරපු දෙයක් නැහැ කියලා තමයි මගේ නම් කල්පනාව. ගිය සභා වාරයේදී ඔබතුමාට මම පෙන්නලා දුන්නා. අපේ ඇප්තාප්වත්තේ පොහොර ගබඩාවේ කුරුඳු පැල හත්දාහක් ගෙනැල්ලා ගාල් කරලා තියෙනවා.  ඒක සභාපතිතුමා මේ සභා වාරය වන විට මොන තත්ත්වයක්ද තියෙන්නේ. මම ගියා. සාධනීය  වැඩ ප්‍රමාණයක් කෙරිලා තියෙන්නෙ කියලා මට දැනගන්න ලැබුණා. කුරුඳු පැළ1000 ක්  සිටුවලා තියෙන්නෙ. 6000 ක ප්‍රමාණයක් සිටුවන්න තියෙනවා. තව මාස 6 කට වත් ඒ කුරුඳු පැළ 6000 සිටුවන්න බැරි වෙයි කියන එකයි මගේ නම් විශ්වාසය. ඉතාම ඉක්මනින් මේ වැඩ ඉවර කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ වගේම තමයි, ගරු සභාපතිතුමනි මේ සභා වාරයේදී නිවැරදි කර ගන්න, අපි මේ සභාවේ දියුණු කරන්න කොතෙකුත් යෝජනා ඉදිරිපත් කළත්, ඒ කිසිම දෙයක් මේ දක්වා ඉටුවෙලා නැහැ. සභාපතිතුමනි, ඒක ඔබතුමා වගේම මේක අපටත් ප්‍රශ්නයක්. මේ සභාවේ තියෙන ආදායමින් තමයි නඩත්තු වෙලා යන්නේ. මම දන්න තරමින් ඔබතුමාට බැරි වෙලා තියෙනවා, අවුරුදු 2 ක් යනකන්වත් ලේකම්තුමියගේ ඉඳන් කම්කරුවා දක්වා වත්, එකතු කරල අවුරුද්දක රැස්වීමක් ගන්න. මෙහෙ මොනවද තියෙන පරිපාලන ගැටලු, සේවකයන්ගේ මොනවද තියෙන ගැටලු, මේවට උත්තර ලබා දෙන්න පුළුවන් ක්‍රමවේදයක් ඔබතුමා ක්‍රියාත්මක කරලා නැහැ. මේවා තමයි මේ පරිපාලනය බිඳ වැටෙන්න ප්‍රධාන සාධකය වෙන්නේ. මේකේ හිටපු පළපුරුදු සභාපතිවරයකුට හරි, මේකේ අන්තිම දවසට හරි, විධිමත් සභාවක් දැකලා යන්න අපි බලාපොරොත්තු වෙච්ච වැඩ කොටස සභාව තුළින් වත්, අපි ආණ්ඩුවක් පත් කරලා වත්, අක්‍රමවත්, අදූරදර්ශී පාලනයක් නිසා තමයි හැමදාම මේ රටට මෙහෙම වෙලා තියෙන්නෙ. අපි ආණ්ඩුවක් ගෙනැල්ලා, අපේ ජනතාවට අපේ වැඩ කොටස් ගම් මට්ටමින් කරන්න බලාපොරොත්තු වුණා. අදූරදර්ශී පාලනය නිසා තමයි මේ රටට මෙහෙම වෙලා තියෙන්නේ. අවුරුදු 74 තුළ ගත්තා වූ ආර්ථික ප්‍රතිපත්ති දුර්වල වීම තුළින් ආර්ථික කළමනාකරණය රටේ දේශීය ආර්ථිකය නංවන්නට, කාර්මික විප්ලවයක් කරමින්, රටේ කෘෂිකර්මාන්තය නංවන්නට , ක්‍රම ක්‍රමයෙන් රටට විදේශ විනිමය උපයන්න, ක්‍රමෝපායන් ඇති කරන්න, මේ සියලු රජයන් වගකියන්න ඕන. ඒ වගේම, මේ දේශපාලනඥයින්ට බැනවදිමින් සිටින උදවිය දන්නෙ නැහැ. දේශපාලනඥයින් පිටුපස ඉන්න මහා කුමන්ත්‍රණකාරී රාජ්‍ය නිලධාරීන්, මේ රටේ සියලු දේට වගකියන්න ඕන. මේක කාටත් ජේන්නෙ නැහැ. හැංගිලා තියෙන්නේ. මුවා වෙලා තියෙන්නේ.

ආයතනවල වංචා දූෂණ සිදුවෙලා තියෙනවා නම්, අනිවාර්යෙන් රාජ්‍ය සේවකයන් සම්බන්ධ වෙන්න ඕන. මේ ක්‍රමවත් ඵලදායිතාවය තුලින් තමයි යහපත් රටක් නිර්මාණය වෙන්නේ. අද අර්බුදය අරගලයක් බවට පත් කරමින්, තව තවත් රට අගාධයට පත්වෙන්නේ. මේ උත්සාහ කරන්නේ මහජනතාව පොළොවෙන් පහළ තත්ත්වයට පත් වෙන එක තමයි වෙන්නේ. මම හිතන්නේ ඔය අරගල කරුවන්, මම කියන්නේ නැහැ මේ රට වෙනස් විය යුතු තැන් මොනවද, එය කළ යුත්තේ කොහොමද, මේ 225 එදත් හිටියා. අදත් ඉන්නවා. මම නම් දන්නෙ නැහැ. මේ 225 ට මේ අර්බුදයෙන් ගොඩ එන්න පුළුවන් ක්‍රමෝපායක් තියෙනවද කියලා. ඉතින් ඒක නිසා ගරු සභාපතිතුමනි, අපිත් කැමතියි අපේ රටේ පුරවැසියන් විදිහට රට දියුණු වෙලා තිබෙනවා දකින්න. අපේ ළමයින්ගේ අධ්‍යාපන ක්ෂේත්‍රය ඉහළ නංවමින්, අපේ ළමයින්ගේ අනාගතය යහපත් අධ්‍යාපන ක්‍රමයක් තුළින්, මේ රටේ යහපත් පුරවැසියන් බිහි වීමේ අධ්‍යාපන ක්‍රමයට මුල්තැන දෙන්න බැරිවෙලා තියෙනවා. මොනම රජයකට අධ්‍යාපනය ක්‍රමය සම්පූර්ණයෙන් බිඳ වැටිලා, ළමයි අනාථ වෙලා ඉන්න මොහොතක, මම හිතන්නේ ඉදිරියේදී නූගත් පරපුරක අභිමානයක් තමයි, ඉදිරියේදී දකින්න ලැබෙන්නේ. මේ නිසා උගතුන් බිහි කරන අධ්‍යාපන ක්‍රමයකට මුහුණ දෙන්න හැම රජයක්ම බලාපොරොත්තු වුණා. ඒ කිසිදු වැඩපිළිවෙලක් ක්‍රියාත්මක වෙන්න දුන්නේ නැහැ. ඊට හේතුව මෙය පිටුපස සිටින අක්‍රමවත් රාජ්‍ය නිලධාරීන් කොට්ඨාශයක් නිසයි. මම වගකීමෙන් කියනවා. අද ඇතිවී තිබෙන තත්වය පිළිබඳ ඔබතුමාට ලොකු වගකීමක් තියෙනවා.

අද උඩුගම මූලික රෝහල දැඩි අවදානමක තියෙන්නෙ. සියළු වෛද්‍යවරු සහ කාර්ය මණ්ඩලයට තෙල් නොමැතිවීම නිසා සේවයට වාර්තා කිරීම නැතිවෙලා තියෙන්නේ. ඒ තුළින් රෝගියාට දැවැන්ත පාඩුවක් සහ ලොකු ව්‍යසනයක් වෙලා තියෙනවා. ඔබතුමාට වගකීමක් තියෙනවා. ඒ බව සොයා බලන්න. ඔබතුමා රෝහලේ තත්ත්වෙ මොකක්ද කියලවත් දන්නවද දන්නේ නැහැ. පුළුවන්නම් ගිහිල්ලා කතාබහ කරලා, දිස්ත්‍රික් ලේකම් තුමා මේ කාරණය පිළිබඳ දැනුවත් කරලා, ඔබතුමාට හැකියාව තියෙනවා. ඒ අවශ්‍ය නිලධාරීන් දැනුවත් කරලා, වැඩසටහනක් තියන්න. ඉතින් ඒක නිසා අඩුම තරමින්, අපි බලාපොරොත්තු වෙච්ච වැඩකොටස වත් කරන්න මම හිතන්නේ ඔබතුමාට තාම කාලය තියෙනවා. මේ පිරිස් කළමනාකරණය කරමින්, විධිමත් සභාවක් විදිහට, මම හිතන්නේ ඔබතුමාට පරිපාලනය පිළිබඳ, අපේ ජේෂ්ඨ මන්ත්‍රීවරු, හිටපු සභාපතිවරුන් අපට දැනෙන දේවල් කොතෙකුත් කිව්වත්, තවම ඔබතුමා තවමත් ක්‍රියාත්මක වෙලා නැහැ. ඉතින් ඒ නිසා කොහොම වුණත් ඉදිරියේදී බිහිවන සර්වපාක්ෂික ආණ්ඩුවක් ගැන අපි හැම දෙනාම බලාගෙන ඉන්නවා. මිනිස්සු බලාපොරොත්තු වන දේ ඉෂ්ඨ කරගන්න හැකිනම් හොඳයි. නමුත් රටේ මිනිස්සු බලාපොරොත්තු වන වෙනස මේ සර්වපාක්ෂික ආණ්ඩුවට තව මාස හයක් වත් යාවි. මේ අර්බුදය ඉවර කරලා, හිටපු තැනට යන්න නම් ලැබෙන්නේ නැහැ කියන එක තමයි මගේ විශ්වාසය. අපේ රටේ ආර්ථිකය බින්දුවට වැටිලා, නිෂ්පාදනයක් නැහැ. කාර්මික නිෂ්පාදනයක් නැහැ. අපේ රටේ ඩොලර් උපද්දවා ගන්න, විදේශ සංචිත වැඩි කරගන්න, ක්‍රමෝපායන් නැහැ. මේ දේශපාලනඥයෝ රටේ සියලු දෙනාට යුතුකමක් තියෙනවා. රට වෙනුවෙන් යම් කාර්යභාරයක් ඉටුකිරීමට. තමන්ගේ රට වෙනුවෙන් දැවැන්ත නැගිටීමක්, මේක මහා දැවැන්ත අරගලයක් තුළින් නැවත හොඳ රටක් කරන්න, ඒ සඳහා පෙළගැසෙන්න ඕන. අලුත් ක්‍රමෝපායන් ගොඩනංවමින්, රටේ කෘෂිකර්මාන්තය නංවමින්, කාර්මික විප්ලවයක් ඇති කරමින්, රට යහපත් ස්ථානයකට ගේන්න අපි කාටත් යුතුකමක් තියෙනවා. ඒවගේම අද වෙද්දී අපේ උඩුගම තියෙන බහු කාර්ය ගොඩනැගිල්ල ඉතාමත්ම අබලන් තත්වයකට පත්වෙලා තියෙන්නේ. අපි හැමදාමත් කිව්වා. එකේ ගේට්ටුව දාන්න කියලා. අවුරුදු හතරක් යනකම් තවමත් නැහැ. තාප්පය ගහන්න. සිවිලිං දිරලා. පරවියා ලැගලා, ඉදිරියේදීවත් රැකගන්න විධිමත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා යෝජනා කරමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි ගයාන් මන්ත්‍රීතුමා කිව්වා මම ලයිස්තු හදලා දුන්න කියලා මම විතරක් නෙවෙයි. සියලු මන්ත්‍රීවරු ලයිස්තු හදලා දුන්නා. රාජ්‍ය නිලධාරීන්ට ඒ වගේම ගයාන් මන්ත්‍රිතුමා කිව්ව. මට මොකුත් දුන්න කියලා චෝදනාවක් කලා කියලා ගමෙන්

තෝරාගත් පිරිසකට රජයෙන් දීපු කුරුඳු පැළ යම් යම් දේවල් බෙදුවා එතුමා ගෙන් ගන්න තරම් වත් සාමාජික වශයෙන් ආර්ථික මම දුර්වල වෙලා නැහැ වත් අපි ලයිස්තු හදලා දුන්න කියල එතුමා විතරක් නෙවෙයි මන්ත්‍රීවරු ලයිස්තු හදලා දුන්නා රාජ්‍ය සේවා අයට එක තමයි ඇත්ත ඔබතුමා අද ප්‍රජාතන්ත්‍රවාදය ගැන සැලකුවද යම් අගතියක් උනාම කතා කරනවා රජාතන්ත්‍රවාදය ගැන සමාජ සාධාරණය ඒ වගේම එතුම කිව්ව අපි ලැයිස්තු හදල දුන්න කියල එතුම වගේම මෙතන ඉන්න සියලු මන්ත්‍රීවරැ ලැයිස්තුව හදල දුන්න රාජ්‍ය සේවයේ අයට අද මෙතන ප්‍රජාතන්ත්‍ර වාදය ගැන කතා කරනව ගමේ ඔය කියන පජාතන්ත්‍ර වාදය තිබ්බෙ නෑ ඔබ තුමා ලගවත් ඔය කියන ප්‍රජාතන්ත්‍රවාදය තිබ්බෙ නෑ අපි මන්ත්‍රීවරු කීදෙනාටද එකවගේ සැලකුවෙ ,කෙගෙසුනාම කතා කරනව ප්‍රජාතන්ත්‍රවාදය ගැන.ඔබතුමාලගෙ ලිෂ්ට් වලට තමයි දුන්නෙ , ඔබතුමා රාජපක්ෂලට වැරදුනහම කතා කරනව ප්‍රජාතන්ත්‍රවාදය ගැන දැන් ගොඩක් කලක් තිස්සෙ වැලලිලා තිබුනු ප්‍රජාතන්ත්‍රවාදය ඒවා මොනවත් තිබුනෙ නෑ .ඔබතුමා නිලධාරීන් කීදෙනෙකුට කතා කරල තියෙනවද පෝලිමෙන් පිට පැනල සහයෝගය ලබා දෙන්න කියල , රජයේ බෙහෙත් ශාලාවකට ගියහම පෝලිමෙන් පිට පැනල බෙහෙත් අරන් දීල නැද්ද ? දැන් සෙඩ් එකේ පොම්පෙන් ඇදේ අරින්න හදනව. පොම්පෙ පාතාලෙ අය අරගෙන තියෙන්නෙ තෙල් දෙන්නෙ අසාදාරන ලෙස කියල මුල ඉදන්ම අග දක්වාම රටේ ප්‍රජාතන්ත්‍රවාදය නැත්තටම නැති කරල ඔය ගෝඨාභය මහත්තයම කිව්ව එක්තරා මාධ්‍යකට ඇවිල්ල මගේ වචන තමයි ව්‍යවස්ථාව නීතිය ගැසට් එක කියල. අපි එදත් කිව්ව එතුමා දුර්වල නායකයෙක් කියලා. එදත් කිව්ව අදත් කියනව ලක්රුවන් මන්ත්‍රුතුමාගෙත් සුභාෂි මන්ත්‍රී තුමියගෙත් ගෙවල් බේරගන්නෙ කොහොමද? එතුමගෙ නිල නිවසවත් බේරගන්න බැරි වුනානම් එතුමට රටේ ගෙවල් ගිනි තියන තත්ත්වයට පත්කලේ ඔබතුමාලගෙ නායකයො ජේලිම් දිග්ගස්සල කරන්න පුළුවන් හැම අගති දෙයක්ම කරල මම කියන්නෑ ජේ.වී.පී එකට ඇගිල්ල දික්කරන්නෑ 3% කියනව එතනට පත්කරල 3% තියෙන්නෙ කියල බනිනව ජනාදිපති මන්දිරය කඩාගෙන යන විදිහට කටයුතු කරල එතනට යන්න පුළුවන්ද භාරපන්දහසක් ආරක්ෂාව තියෙද්දි ,මිනිස්සු එතනට එන තත්ත්වයට අගතිගාමී ලෙස කටයුතු කරල දැන් කියනව මෝඩයෝ ඇදන් වුඩ පිලුම් ගහනව බුද්ධියෙන් හීන මිනිස්සු ගියහම පිලුම් ගහනව තමයි අපි කියන්නෑ හැමෝම භුද්ධියෙන් තොරයි කියල අපේ සහබන්දු මහත්තයට වැරදිලා වෙන්න ඇති කියවුනේ කොන්ඩෙයි රැවුලයි වවා ගත්ත පලියට මෝඩයො වත් සමාජ අසාධාරණයෙන් යුත් පුද්ගලයොවත් වෙන්නෑ කොන්ඩෙයි රැවුලයි වවා ගත්ත මහාචාර්ය වරු පවා ඉන්නව.වැදගත් මිනිස්සු පවා ඉන්නව ඒ ටයිප්එක එතන තියෙනව .නමුත් ඒ තත්ත්වයට රට ගෙනාවෙ කවුද? දැන් මොනවත් කවුරුත් කියන්නෙ නෑ දැන් 3% බනිනව කට්ටියම 3% පැත්තට අපි යන්නෙ නෑ නමුත් 3% 25% දක්වා රට බේදනීය තත්ත්වයට පත්කලේ කවුද? ඔබ අපි කවුරුත් මන්ත්‍රවරු කැමති නෑ රට රට විෂම වෙනවට නමුත් අනියම්න්හරි ඔබ ඒවට සහයෝගය දුන්න නම් අද දේශපාලන වශයෙන් මොන පක්ෂය වුවත් තෙල් පෝලිමක ගිහිල්ල ඉන්න බෑ .අපට ඔබට ගිහින් ඉන්න පුළුවන් නමුත් මෙතන ඉන්න මන්ත්‍රී වරුන්ට බෑ. මන් ත්‍රී කියන කොටම ගහල ඉවරයි.ඒ තත්ත්වයට සමාජය කුජීත කලේ ඔබතුමාලගෙ නායකයො පෙර සිරිත නම් විවාහයක් තීන්දු කරන්න යද්දි මවාලියගෙ ගේ පිටුපසත් නිරීක්ෂණය කරන එක මොකද අතන්ගු කැලි හෙම තියෙනවවම් ඒ විවාහය සිද්ද වෙන්නෙ නෑ මොකද පස්පව් කරන මිනිස්සුන්ට දූ දෙන්නෑ .ඔබතුමාල ඔබතුමාලගෙ නායකයො වෙනුවෙන් කඩේ ගනව වම් ඔබතුමාල බගන්න ඕන එතුමලගෙ දර්ශනය මොකක්ද කියල .වනමල් මන්ත්‍රීතුමා කිව්ව අපි හිට ගත්තෙ ජනතාවගෙ පැත්තෙ කියල .නමුත් ජනතාව අන්ධවෙලා නම් අපි ඒ පැත්තෙ හිටගත්තට වැඩක් තියෙනවද?එහෙම ඕනෙ නෑ .මම ඔබතුමාට විරුද්ධ නෑ. මන්ත්‍රී වරුනි මේ මගේ මතය ඉදිරිපත් කලේ .දැන් ජනතාව 69 ලක්ෂයක් ඡන්දය දුන්නත් වැඩක් නෑ නායකය දුර්වල නම් එහෙම නායකයොත් එක්ක හිටගන්න එපා. පැරදිලා ගෙදර යන්න එදාට මැරුනත් ගෞරවණීයයි. මොකද වැරදි කරලා නැහැ. මෙතන ලොකු දේවල් කරලා, පොරවල් වෙලා අද අම්මා, තාත්තගේ සොහොන්වත් බේරගන්න බැරිවුණා. අද පෝලිම්වල මිනිස්සු මැරිලා වැටෙනවා. මේ සමාජයට මෙවැනි නායකයන්ට නැවත නැවත කඩේ යනවනම්, ග්‍රාමීය වශයෙන් ඔබේ නායකත්වයත් දුර්වලයි. ජනතාවගෙන් පැරදුනාට කමක් නැහැ. නමුත් හෘද සාක්ෂියෙන් පරදින්න එපා. අපි ගෙදර ගියත් ජීවත් වෙන්න ඕන අපේ හෘද සාක්ෂියත් එක්ක. ඒ නිසා අපි දන්න තරමින් රනිල් වික්‍රමසිංහ මහත්තයා ව්‍යවස්ථානුකූලව ජනාධිපති

වෙන්න ඕන කියලා මම කියන්නෙ නැහැ. මම කියන්නෙ මේ මිනිස්සු ඉල්ලනවා වගේ අනුර කුමාර මහත්තයා මේ රටේ ජනාධිපති වෙන්න ඕන. මිනිස්සු කැමති නම්, සජිත් මහත්තයටත් දෙන්න ඕන. හරියට මම දන්නෙ නැහැ. කවුරු ඒවිද කියලා. නමුත් මේ වෙලාවෙ රනිල් මහත්තයත් මේ රට භාරගන්න ඕන නැහැ. මොකද මේ ආර්ථිකය දන්නෙ නැති මුදල් ඇමතිකෙනෙක් ඇවිල්ලා, රට විනාශ කළා.
ඒ වගේම ආදාහනාගාරය සම්බන්ධයෙන්, මගේ පෞද්ගලික මතය සභාව ණය වෙලා හරි ආදාහනාගාරය හදලා ඉවර කරන්න ඕන. ඔබතුමාගේ කාලෙදිම. මොකද තව කල් ගියොත් තව කොට් ගානක් යාවි. මීට අවුරුද්දකට දෙකකට කලින් ආදාහනාගාරය හදන්න හැකි වුනා නම්, එම මුදල් ටිකත් ඉතුරු කර ගන්න තිබුණා. අපි ණයක් ගත්තත්, තව ඉදිරියට මුදල් බාල්දු වෙන තරමට ඉතුරු වැඩ කටයුතු කරගන්න හැකි වෙනෙකක් නැහැ. ඒ නිසා ණය මුදලක් ගත්තත්, කමක් නැහැ. මොකද එතරම් මුදලක් ගෙවන්න වෙන එකක් නැහැ. සභාපතිතුමනි, ණයක් වෙලා හරි මේ දේ කරන්න. එහෙම නොවුනොත් කොහෙත්තම බැරිවේවි මුදල් අවප්‍රමාණය වන තරමට.
ඒවගේම තල්ගස්වල වෙළඳ සංකීර්ණය සම්බන්ධව කතා කරනවානම්, ඒකට මම හිතන්නෙ ණක් ගන්න අවශ්‍ය වෙන එකක් නැහැ. ඒකට මේ තියෙන සභාවෙම මන්ත්‍රීවරුන්ට පුළුවන් යම් එකඟතාවයකට ඇවිල්ලා විවෘත ටෙන්ඩර් කරලා, ඒ මාර්ගයෙන් වෙළඳ සංකීර්ණය ගොඩනගලා, බදු මුදලකට ව්‍යාපාරිකයන්ට ලබා දෙන්න. නැවතත් ඒ සම්බන්ධව අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටිමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී අජිත් එඬේර ආරච්චි මහතා**
ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, දීර්ඝ කරුණු කාරණා සාකච්ඡා වෙච්ච මොහොතක්. අපේ ගමේ මගේ සහෝදර මන්ත්‍රී, චන්ද්‍රසිරි මැතිතුමාගේ යෝජනාවත් සම්බන්ධව කියන්න කැමතියි. ඒකෙ නාම පුවරු සඳහා මුදල් ගෙවන්න කියන කාරණය සම්බන්ධව, එය ගෙවිය හැකි නම්, චන්ද්‍රසිරි මන්ත්‍රීතුමාත්, ඒ සම්බන්ධව දීර්ඝව කරුණු පැහැදිලි කළ නිසා, මම හිතන්නේ එතුමා නොමැති වීම නිසා, යම් කොන්දේසි වලට යටත්ව ගෙවීම් කළ හැකි නම්, ගෙවන්න කියලා යෝජනාව ස්ථිර කරනවා. ඒ වගේම එතුමා ප්‍රකාශ කළා. සමගිගම පාරවල් දෙකක් සම්බන්ධයෙන්. එතුමා නැති නිසා, මම ගිය සභා වාරයේදී මේ සම්බන්ධව උත්තරයක් දෙන්න ගියේ නැහැ. ඒකෙ තියෙන්නෙ පැහැදිලිවම, ඒ මාර්ගය අමරසිරි දොඩංගොඩ මාර්ගය, සමගිගම මාවත කියලා. එතුමට ඕන නම් පුළුවන් සමගිගම කියන බෝඩ් එක ඉවත් කරලා, අමරසිරි දොඩංගොඩ මාවත කියලා තමයි ගැසට් කරලා තියෙන්නේ. ඒක සමගිගම වුනේ, කවල්ගම නම හොඳ නැති නිසා තමයි, ගමේ හිටපු අයත් එක්ක සාකච්ඡා කරලා, සමගිගම වුනේ. මොකද විප්ලවයකින් අල්ලගත්ත ගමක් නිසා තමයි, කවල්ගම වුනේ. ඒ නිසා ගම, සමගිගම මාර්ගය, අමරසිරි දොඩංගොඩ මාවත, ඒක දිනා ගැනීම සඳහා දායක වුණු, ජනතා නියෝජිතයන් අමරසිරි මැතිතුමා සිහිවීම සඳහා තමයි ඒ අමරසිරි දොඩංගොඩ මාවත කියලා ඒ නම නම් කළේ. අමරසිරි දොඩංගොඩ මාවත කියලා නම් කළා නම්, ඒ ගැටලුව විසඳෙයි. තවම බෝඩ් දෙකම තියෙනවා. කවුරුත් මුකුත් කරලා නෑ. නමුත් පිටින් කව්රුහරි ආවම, හරි නැති නිසා එතුමත් කිව්වා වගේ, මේ බෝඩ් එක වෙනස් කළා නම්, ගැටලුවක් නැහැ. ඒ සම්බන්ධව වැඩිය කරුණු ප්‍රකාශ කරන්නෙ නැහැ.
අනෙක් කාරණය, සභාව සම්බන්ධයෙන් ආදාහනාගාරය සහ වෙළඳ සංකීර්ණය සම්බන්ධව. මමත් කැමතියි අවසානයක් දකින්න. නන්දන මන්ත්‍රීතුමා කිව්වා වගේ, මොකද ඉතාම වැදගත් කාරණයක් සම්බන්ධයෙන්, සභාව පැත්තෙන් මොනම හෝ අදහස් එකක් දෙකක් කතා කරලා, නිවැරදි තීරණයකට නොඑළඹීලා යන නිසා තමයි මේ දේ මෙතෙක්, කල් යන්න හේතුව. නැත්නම් ඔය ණය මුදලක් හරි අරගෙන, දැනටමත් මේ ආදාහනාගාරයේ වැඩ අවසන් කරලා. වැඩේ කරන්න කාලය තියෙනවා. නමුත් කෝටි 5ක් විතර වෙන කාරණයක්. කෝටි 5ක් ගැවසෙන කාරණයකට අපි මූලිකත්වයක් දුන්නේ නැහැ. මොකද විශේෂ කාරණයක්. ඉතා විශාල මුදල් ප්‍රමාණයක් ගැවසෙන කාරණයකට මූලිකත්වයක් දුන්නේ නැහැ. ඒකයි මේ ප්‍රමාදයට හේතුව. එනිසා මම අදත් කියන්නේ, අපට දෙන්න පොරොන්දු වෙලා, ටෙන්ඩර

කැඳවලා, ගිවිසුම් අත්සන් කරලා, මේ සියලු කාරණා නීත්‍යානුකූල විදිහට, වැඩ පටන් ගෙන තියෙනවා. පළවෙනි බිලත් ගෙවලා, ඇයි ඉතුරු සල්ලි දෙන්න බැරි කියන කාරණය, අපට ආරම්භ කරන්න තිබුන වැඩක් නෙවෙයි මේ නැවැතුණේ. රට අපහසුතාවයට පත් වෙලයි කියලා, රටේ ප්‍රශ්න තිබුණ කියලා, ආරම්භ කරපු දෙයක් නවත්තන්න කිසිම ආකාරයකට පුළුවන් කමක් නැහැ. අධිකරණ ක්‍රියාමාර්ගයකට වුනත් ඇත්ත වශයෙන්ම අපට යන්න පුළුවන්. මෙතුමා කැමති වුනා. ණයක් හරි අරගෙන, ආදාහනාගාරයේ වැඩ කටයුතු නිම කරන්න. හැබැයි මන්ත්‍රීවරුන් එකට අනුමැතිය දුන්නා. ඒක කරන්න සුදුසුයි කියලා. නමුත් මම ඒක ගැන හිතන්නේ මෙහෙමයි. කෝටි 4 ක ණය මුදලක් ගන්න වෙනවා. ලක්ෂ 500 ක් ඇස්තමේන්තු කළේ. සිමෙන්ති කොට්ටය රු. 875.00 ට තියෙද්දි. යකඩ කූරු වැනි ඒ සඳහා අවශ්‍ය ද්‍රව්‍යවල මිළ අඩුවෙන් තියෙද්දි. දැන් භාණ්ඩවල මිළ ගණන් බලද්දි, ඇස්තමේන්තුව කෝටි අටත් පනිනවා. හරිනම් 12 කෝටියක් වගේ. දේශීය අරමුදලෙන් දෙන්නෙත්, IMF එකේ වගේ. අඩුම පොලීයට තමයි ණය දෙන්නේ. දේශීය ණය මුදල රඳාපවතින්නේ, පළාත් පාලනය යටතේ. ඒක තමයි කාර්තු වශයෙන් දෙන්නෙ. කාර්තුවකට ගෙවන්න පුළුවන් මුදල කොපමණද කියලා බලනවා. සභාවේ පොදු අරමුදලින් තමයි ගෙවන්න වෙන්නේ. ලක්ෂ 25 කට කිට්ටු ණය වාරිකයක් එනවා. කෝ ඒ ණය වාරිකය පියවන්න සල්ලි. ඒ නිසා මේ ණය මුදල දෙනවා නම්, ඒගොල්ලොත් බලනවා, ඒ දේවල්. ඒ වගේම මේ ණය ගන්නේ, ඒගොල්ලො වැඩ නතර කරපු තැන ඉඳලා. ඉතුරු වැඩ ටික කරන්න. ඒ ණයට කෝටි අටකට වැඩිය ගන්නවා. ගෙවන මුදලත් විශාලයි. ඒ මුදල් පිය වන ආකාරය ගැන සොයන්න. කොහොම හරි ගත්තත් ගෙවන්න ඕන. මේකෙ ආදේශක වැටුප් ගෙවන්න ඕන. පරිපාලන වියදම් වලට යන වැටුප් ගෙවන්න ඕන. මාසෙකට මන්ත්‍රීවරුන්ගේ කාඩ් දීමනා, ස්ථිර සේවකයන්ගෙ වැටුප්, විගනන, දුම්රිය, මේ සියලු සේවක කාරණා වලට ගෙවන්න ඕන පොදු අරමුදලින්. වෙනත් මන්ත්‍රීවරයෙකුගේ ප්‍රදේශවල පාරක් සුද්ද කරන්න යන්නෙත් මුදල් යන්නෙ මේ අරමුදලින්. මුළු අවුරුද්ද පුරාවටම ගෙවන්නේ මේ පොදු අරමුදලින්. මේ මහා ණය කන්දරාවක්, අඩු වාරිකයකින් ගෙවන්න පුළුවන්කම තියෙනවා නම්, සභාපතිතුමා ප්‍රශ්නයක් නැහැ. මෙතුමා කියපු කාරණයට මම එකගයි. මොකද මම කැමතියි. මේ අපි පටන් ගත්ත කාරණය අවසන් කරන්න පුළුවන් නම්. මොකද විවිධ බාධක මැද කරපු දෙයක්. අවුරුදු 30ක් වෙලත් කරගන්න බැරි වෙච්ච කාරණයක්. කොහොමහරි හදලා මේක අවසන් කරන්න බැරි වෙච්ච එක තමයි කණගාටුව. නමුත් ඔබතුමාගේ කාලේදි මේක පටන්ගෙන ඔබතුමාගේ කාලෙදිම එකේ වැඩ අවසන් කරන්න පුළුවන් නම් තමයි අපිත් බොහොම කැමති. ණය අරගෙන කරන්න පුළුවන් නම්, අපිත් සහයෝගය දෙනවා. නඩුමගට වුණත් බහින්න පුළුවන්කම තියෙනවා. මේ සම්බන්ධව දිගින් දිගටම සාකච්ඡා කරනවා නම්, ඒ කාරණා සම්බන්ධවත් කරුණු පැහැදිලි කරන්න මම කැමතියි.

ඊළඟ කාරණය, ගොඩක් වෙලාවට අපේ දේ බලනවට වඩා, අපි බලන්නෙ අනුන්ගෙ වැඩ ගැන. මේ සභාවෙ දහසකුත් වැඩ තියෙනවා. පටන් ගනිපු වැඩ, පටන් ගන්න තියෙන වැඩ, අතරමග නැවතිච්ච වැඩ තියෙනවා. ඒ විවිධ කාරණා නිසා අපට කරගන්න බැරි වෙච්ච වැඩ ගොඩක් තියෙනවා. නමුත් ඔබතුමාට පමණක් මම චෝදනා කරන්නේ නැහැ. ඒකට විවිධ කාරණා තියෙනවා. දරාගන්න බැරි මන්ත්‍රී මණ්ඩලයක් පත් කළා. ඒවට විශාල වියදම් යනවා. කල්පනා කරල බැලුවම, 13 දෙනා 27 දෙනෙක් කරලා, එකකට එකක් වැඩි කරලා, ඊටත් වඩා එකක් වැඩි කරලා, පොදු අරමුදලෙනුත් අපි නොදන්නවා වුණාට, මේ අය වෙනුවෙන් වැය වෙනවා ඇති. දුරකථන කාඩ් 1000 සහ ඉන්ධන 3000.00 යි. පොඩි පොඩි දේවල් වල ඉඳලා, සභාව ගත්තම වතුර බෝතලේ සිට බෝතල් විසි හතක්. අපට කණ්ඩායමක් හැටියට තව උනන්දු වුණා නම්, තව කරන්න තිබිච්ච වැඩ බොහෝ තියෙනවා. ග්‍රාම නිලධාරි වසම් පනස් තුනක්, කොතනින් ගිහින් ඇහුවත් සභාව ගැන තෘප්තිමත් නැහැ. ඒක මේ ඔබතුමාට කරන චෝදනාවක් නෙවෙයි. ගරු සභාපතිතුමනි, කොට්ඨාස මන්ත්‍රීවරුන්ට බනින්නෙ. කොට්ඨාස මල ගෙදරකට ගියහම, සමිති සමාගමකට ගියහම, ඒ අවස්ථාවේදී බනින ඒවා දරාගන්න බැරිව, පීඩනය තමයි මෙතන ඇවිල්ල ඒ මන්ත්‍රීවරු කෑ ගහන්නේ. එහෙම ප්‍රශ්න රාශියක් කොට්ඨාස තුළ ඇතිවෙලා තියෙනවා. දැන් වෙරංග මන්තීතුමා වේවා, සමන් මන්ත්‍රීතුමා හෝ වේවා, අනිත් මන්ත්‍රීවරුන්ට කියනවා. ඔබතුමාලා මේ අවුරුදු හතරක් තිස්සේ කරපු දෙයක් ගැන ඇහුවොත්, උත්තරයක් නැහැ. ඒ වගේම තමයි ජනාධිපතිවරයෙක් හිටියා. අගමැති හිටියා, මැති ඇමතිවරු හිටියා. පළාත් සභාවල

නම්, ආණ්ඩුකාරවරයෙක් හිටියා. මේ සියල්ල හිටියත්, යමක් කරගන්න බැරි තත්ත්වයකට පත් වුණා. මැසිවිලි මේ හැම මන්ත්‍රීවරයෙකුටම තියෙනවා කියන කාරණය අපි අමතක කරන්නේ නැහැ. මේ ක්‍රමවේදය තුළ අපට ගොඩක් අපහසුකම් ඇති වුනා.

ඒ වගේම සභාපතිතුමනි, වර්තමාන දේශපාලන තත්ත්වය පිළිබඳව, මේ සභාවෙදිත් කතා වුණා. සභාවේ දී කතා වුණා. විශේෂයෙන්ම අපටත් එය නොසලකා ඉන්න බැහැ. අපි පුරවැසියෝ විදිහට, රටේ අද දවසේ, හෙට දවසේ වෙන්නේ මොකක්ද? හෙට ක්‍රියාමාර්ග ගැන අපි සියලු දෙනාම අවදියෙන් ඉන්න ඕන. ඒ වගේම පොදුවේ කනගාටුවෙනවා වගේම, මම කඩා බිඳ දැමීම් වලට, ගිනි තැබීම් වලට, දේපළවලට, මිනිස්සුන්ට හිංසා කිරීම් වලට, එදා ඉදලම විරුද්ධයි. කවුරුන් හෝ සතුරෙක් ගේ හෝ ජීවිතවලට හානි දේපළ විනාශ වෙනවා නම්, අපි කැමති නැහැ අපේ සභාවේ මන්ත්‍රීවරුන්ගේ දේපළ හානි වුණා. එදා නම වෙනිදා ඒව අපි හෙළා දකිනවා. පුස්තකාලෙ විනාශ කළා. ඒ වගේම රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ ගේ ගිනිතියලා, අති විශාල හානියක් කළා වගේම, අපේ අහිංසක ලක්රුවන් මන්ත්‍රීතුමාගේ ගේ විනාශ කරලා, කඩා බිඳ දමලා, දරුවන්ගේ පොත් පත් ඇඳුම් විනාශ කරලා දැමීමත් අරට සාපේක්ෂව ප්‍රමාණය අඩු වුනාට, එතුමගේ මට්ටමින් එතුමට එය විශාල හානියක්. අර හානියට සමානයි. සියලු හානි සමස්තයක් ලෙස හෙළා දකිනවා. රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ ගෙය විනාශ කිරීම නම් කිසිසේත්ම අනුමත කළ නොහැකි, සාධාරණීකරණය කළ නොහැකි කාරණයක් බව අවධාරණය කරනවා. තව පොඩ්ඩෙන් මෛත්‍රී වික්‍රමසිංහ මැතිනියත් ගිනිබත් වෙනවා. එතුමිය රෝගාතුරව ඉන්නෙ. මේ මොහොතේ ගිනි ගැනීම සිද්ධ වුණා නම්, පරම්පරා තුන හතරක, පෞරාණික ගෙවල් දොරවල් ගිනි තැබීම සම්බන්ධයෙන් අපි අපේ කනගාටුව ප්‍රකාශ කරනවා. මේ කවුරු කළත් තරයේ හෙළා දකිනවා කියන කාරණය මේ අවස්ථාවේදී මේ රටේ පුරවැසියන් විදිහට මතක් කරන්න කැමතියි.

ඒ වගේම සියලු දෙනාගේ මුවින් පිටවුනේ ගෝඨාභය රාජපක්ෂ මහත්තයා ඉතාම දුර්වල පාලකයෙක් කියන එක. මම එහෙම කියන්න කැමති නැහැ. එතුමට ඉතාමත්ම දුර්වලයි කියලා, විශේෂයෙන්ම එතුමා පාලනය පටන් ගද්දිම කොරෝන වසංගත තත්ත්වයකට මුහුණ දෙන්න සිදුවුණා. එවැනි ව්‍යසනයකට ජන නායකයෙකු පත් වුණා නම් පත්වුණේ ප්‍රේමදාස මහත්තයා. භීෂණය පමණයි. මේ වෙලාවේ ගෝඨාභය මහත්තයට සාර්ථකව වසංගත උවදුරට මුහුණ දීලා, රටේ ආර්ථිකය විශාල වශයෙන් කඩා වැටිච්ච මොහොතක, කරන්නම බැරි තත්වයට රට පත් වුණා. හැබැයි එතුමා ගත් දුර්වල තීන්දු තීරණ 1 - 2 ක් නිසාත්, විශේෂයෙන්ම කියන්න කැමතියි. හැබැයි මම එතුමාට ගරු කරන්න කැමතියි. මේ අසීරු අවස්ථාවේදීත් ධූරය අතහැර යන්න ගත්ත තීන්දුව පිළිබඳව එතුමාට ගරු කරනවා. කිසිම කෙනෙක් බලය අත් හරින්න කැමති නැහැ. අන්තිම තත්පරය දක්වාම සටන් වදින ලෝකයක් තියෙන්නේ. බලය වෙනුවෙන් මේ වෙලාවේ පසුගිය නම වෙනිදා එතුමා අයින් වෙනවා කියලා ප්‍රකාශ කිරීමම, එතුමට විධායක බලය තියෙද්දිත්, විශේෂයෙන් එතුමාට ස්තුතිය පුද කරන්න කැමතියි. තවත් රට අස්ථාවර වෙන්න නොදී, මහජන ආරක්ෂාව වෙනුවෙන් එතුමා ගත්ත මේ තීරණය, ගොඩක් අයට කරන්න බැරි දෙයක් කියන එක මම දකින්නේ. 13 අයින් වෙනවා කියලා මම හිතන්නේ නැහැ. එතුමා තවදුරටත් ඉන්න තරම් සදාචාරය කෙළෙස ගන්න එකක් නැහැ කියලා මගේ නම් විශ්වාසය.

මේ කාරණය පිළිබඳව එකින් එක වෙච්ච සිද්ධි දාමය අපි කවුරුත් දන්නවා. ඒවා එකින් එක කතා කරලා වැඩක් නැහැ. අපි කවුරුත් දන්න කාරණා. විශාල දරිද්‍රතාවයක් රටේ තියෙනවා. පාසල් පද්ධතිය වැහිලා, වෙරංග මන්ත්‍රීතුමා කිව්ව වගේ, උඩුගම රෝහලට පමණක් නෙවෙයි. මුළු සෞඛ්‍ය පද්ධතියටම තෙල් ප්‍රශ්නය බලපාල තියෙනවා. සියලු රාජ්‍ය සේවකයන්ට මේ ප්‍රශ්නය බලපාල තියෙනවා. දැන් අපට තියෙන්නේ ගෝඨාභය මහත්තයා යනව නම් මේ ස්ථානයට කවුද පත් වෙන්නේ කියන කාරණය. ඒ වගේම රනිල් මහත්තයා යනවනම් අගමැති ධූරයට පත් වෙන්නේ කවුද කියන එක අපට තියෙන්නෙ. ඒක අපට ඉතා වැදගත් වෙනවා. අලුත් කණ්ඩායමක් පත් වෙනවා නම්, සියලු කණ්ඩායම් වලට දැන් හිතිල තියෙන්නේ, අලුත් කට්ටියක් එන්න ඕන කියලා. නමුත් එය වෙනස් විය යුත්තේ ඡන්දයකින්. ඡන්දයක් තියන්න මේ වෙලාව නෙවෙයි. ඒ නිසා මම කැමතියි. ඒ පොට පාදගන්නකන් ලෝක සම්ප්‍රදායක් තියෙනවා. ඊළඟට ජනාධිපති හෝ අගමැති විය යුත්තේ විපක්ෂයයි කියලා. එහෙම නම් ඒකට හොඳම සජිත් මහත්තයයි, අනුර කුමාර මහත්තයයි, ජනාධිපතිකම්, අගමැතිකම් අරගෙන, මේ රට කාලයක්

කරන්න ඕන. කාලයක් කරන්න දෙනවනම්, මම හිතන්නේ වඩා හොඳයි. මාස තුනකට දැනට ඇනවුම් කරපු බඩු තියෙනවා. ගෑස් ඩීසල් පෙට්රල් මේ මාසෙ අවසන් වෙන කොට අවසන් වෙනවා. නැව් දහයකට වැඩිය එන්න තියෙනවා. මාස තුනකට වැඩි කාලයකට ගෑස් පෙට්‍රල් ඩීසල් තියෙනවා. ප්‍රශ්නය තියෙන්නෙ එතැන නෙවෙයි. පුද්ගලයෝ වෙනස් වෙන විදිහට, මේ මුහුණු වෙනස් වෙනකොට එතන ඒ බඩු ටික සම්පාදනය කරන්නේ කොහොමද කියන කාරණය, ගෑස් ටික දෙන්න ඕන, පාසල් පද්ධතිය ආරම්භ කරන්න ඕන. පෝලිම් නැති කරන්න ඕන. සාමාන්‍ය මනුස්සයෙකුට අතට කීයක් හරි එන විදිහේ වැඩපිළිවෙළක් හදන්න කියලා. ඒ නිසා රටේ මේ විදියට අවි නීතිය රජ කරන, අරාජික තත්වයට පත්වෙලා තියෙනකොට, සංචාරකයෙක් රටට එනවද? සංචාරක ව්‍යාපාරයෙන් බිලියන 6 ක ප්‍රමාණයක් අපි ඉදිරියේ දී හොයාගත්තෙ නැත්නම්, ඉදිරියේදී රට මුහුණ දෙන්නෙ කොහොමද? IMF එකෙන් හරි ගන්න ණය ගෙවන්නේ කොහොමද? රට ස්ථාවර වෙන්න ඕන කොහොමද? ඉස්සෙල්ලා රට සාමකාමී වෙන්න ඕන. ඉස්සෙල්ලා පෝර ටික එන්න ඕන. අස්වැන්න වැඩි කර ගන්න, ආදායම හදාගන්න ඕන. අද ආයෝජකයා රට හැර යනවා. ඇඟලුම් කර්මාන්ත බිඳවැටීම, ඒ නිසා මේ ටික හරියට හැදෙනකම්, රට කවුරු ආවත් ස්ථාවර වෙන්නේ නැහැ. අවුරුදු 74 ක් මේක වින්ද මිනිස්සුන්ට, අවුරුදු හතරක් ඇයි, කවුරුහරි යනකම් බලන් ඉන්න බැරි. අපට පුළුවන් බලන් ඉන්න. ඒත් හරියට නොගියොත්, මේ අරගලයේ මිනිස්සුන්ට, ගෙවල් වලට ගිහිල්ලා, ගම්වල මිනිස්සු එළව එළවා පහර දෙන තත්ත්වයට පත් වේවි. ගන්න කට්ටියත් හරියට කරන්න ඕන. මමත් නන්දන මන්ත්‍රීතුමාගේ කතාවට එකඟයි. ඇයි රනිල් මහත්තයා ඉන්නේ. කරන්න පුළුවන් කෙනෙකුට දීලා එතුමාත් යන්න ඕන. gota go, ranil go මේ කියනව නම් මේ කාණ්ඩෙට කරන්න දීලා යන්න ඕන. කරන විදිහක් බලාගෙන ඉන්න. මේ විදිහ තව තවත් අවුල් කළොත්, මේ රට තව තවත් බරපතළ වෙනවා. පාසල් පද්ධතිය විවෘත කරන්න බැරි වුනොත්, මැට්ටො පිරිසක් රටේ හැදෙනවා. විභාග එක දිගට තියන්න බැරුව, පෙළගැසෙනවා. ගුරුවරුන්ට උගන්නන්න යන්න විදිහක් නැතිවෙනවා. මේක වහාම සමනය වෙනවා. නැවත ඇවිලෙනවා. පෝලිම් පාරවල් වල, මේ ප්‍රශ්න නිවාගෙන යන්න පුළුවන් වෙන්න ඕන. එහෙම නොවුණොත් මේක අවුලවන ජනතා විමුක්ති පෙරමුණ, පෙරටුගාමී සමගි ජන බලවේගය මේ කාට වුනත් අරගලය කොයි අතටද ගිහින් තියෙන්නෙ. කමක් නැහැ. අරගලය කරන සියලු දෙනාම රටට ආදරෙයි කියනවා. එහෙම කිය කිය, ගෝඨාබය මහත්තයාගේ කිය, කිය, ජනපති මැදුර තියෙන දේවල් විනාශ කරනවා. ඒව එතුමගේ සල්ලි වලින් ගනිපු දේවල්ද? අර මහජනතාවගේ සල්ලි විනාශ කරන්නේ. ජාත්‍යන්තර සබඳතා තිබෙන, අන්තර්ජාල පහසුකම් විනාශ කරලා දාලා, ඕනම කෙනෙකුට රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා පවත්වන්න තියෙන ස්ථාන විනාශ කරන්නෙ. රටට ලැබිච්ච විශේෂ දායාද, ලැබුනු තෑගි පවා විනාශ කරලා තියෙන්නේ. කවුද මේවා කරවන්නෙ. කවුරුවක්වත් වගකීම බාර ගන්න කැමැති නැහැ. එහි නායකත්වය ගන්නෙ කවුද? මේ විනාශ වෙච්ච දේපලට වග කියන්නේ කවුද? අරගලය ප්‍රශ්නයක් නැහැ. උසාවියත් කියන්නෙ මූලික අයිතිවාසිකම් විදිහට අරගලය නතර කරන්න බැහැ කියලා. එම නිසා මන්දිර ඇතුලෙ ඉන්න එක සම්බන්ධව පැමිණිලි කරන්නවත්, කවුරුවත් පෙනී සිටින්නේ නැහැ. ඒක හරියට අනුන්ගේ ගෙදරක බලෙන් පදිංචි වෙලා ඉන්නවා වගේ කාරණයක්. මේ කාටත් නීතිය ක්‍රියාත්මක වෙන්නේ කොහොමද කියලවත් බලන්න, කවුරුවත් ඉදිරිපත් වෙලා පැමිණිල්ලක් දාන්න කෙනෙක් නැහැ. රාජ්‍ය දේපල වලට හානිකරනවා. උසාවි වල ඉන්න අය හරි දකිනවානෙ මේ දේවල්. එයාලා හරි මේ තොරතුරු වාර්තා කළ යුතු වෙනවා. රජයක් නැහැ. නිලධාරියෙක් නැහැ. ආණ්ඩුව පැත්තෙනුත්, මේ දවස් වල මෙම නීතිය ඕන විදිහට යන්න ඇරලා බලාගෙන ඉන්නවා නේ. මෙහෙම තත්ත්වයක් නිර්මාණය වීම සම්බන්ධව අපි දුක් වෙනවා. රටේ පැවතුණු අර්බුදකාරී වාතාවරනය තුල අරගලයක් නිර්මාණය වීම සම්බන්ධව අපි දුක් වෙන්නේ නැහැ. අයහපත් පරිපාලනය නිසා තමයි එච්චර පිරිසක් අවදානමක් දරාගෙන, දුම්රිය මගින් කොළඹට ආවේ. අපි ඒක ලඝු කොට සලකන්නේ නැහැ. බඩුමුට්ටු සොරකම් කිරීම හා විනාශ කිරීම වෙනත් කණ්ඩායමක්, සැබෑ අරගලය තව කණ්ඩායමක්. සොරකම් කරන කණ්ඩායම වෙන ප්‍රශ්නයක්. කවුද මේ විනාශය කරන්නේ. වගකීම ගන්න කවුරුවත් නැහැ. අයාලේ යනවා.

අවසාන වශයෙන් පිලිපීනෙ මාකෝස් රටින් නෙරපුවා. මුළු පවුල පිටින්ම. නමුත් නැවතත් පවුලෙ දූලා පුතාලා ඇවිල්ලා, ආණ්ඩුකාරවරු වෙලා, පසුව පුතා ජනාධිපති වුනා. මිලියන

ගාණක වැඩි ඡන්ද වලින් ජය ගත්තෙ. අවුරුදු හයකට සැරයක් දෙවෙනි මාසේ මැයි මාසේ දෙවැනි සතියේ සඳුදා ජනාධිපතිවරණය තියෙන බව එම රටවල අය ප්‍රකාශයට පත් කරලා තියෙනවා. මේ අපේ රටේ වගේ නෙවෙයි. ඒ නිසා අපේ මන්ත්‍රීවරු කළකිරෙන්න උවමනා නැහැ. මොකද අපි එහෙම කලකිරුනොත් අපේ ඡන්දදායකයෝ මොනතරම් කළකිරෙයිද? දේශපාලනය කරනවා නම් කලකිරෙන්න එපා. මීට වඩා කර්කශ තීන්දු ගන්න වෙනවා. මාර්කොස්ගෙ පුතා ජනාධිපති වෙනවා නම්, මහින්ද මහත්තයාගේ පුතා තව කාලෙකින් ජනාධිපති වෙන්නත් පුළුවන්. එහෙම වෙනවා නම් හොඳයි කියන එක නෙවෙයි. අද හොඳ මිනිස්සු, හෙට විරුද්ධකාරයො වෙනවා. එදා හිටපු විරුද්ධකාරයො අද හොඳ වෙනවා. ඒක තමයි දේශපාලනයේ ස්වභාවය. අපි අපේ පැලේ පැළ කර, පුළුවන් විදියට ඒ සමාජ දේශපාලන වටපිටාව සකසා ගමුයි කියන එක මතක් කරනවා. අනිත් කාරණය ශීංශෝ බේ කියන්නේ ජපානෙ හිටපු ශ්‍රේෂ්ඨ අගමැතිවරයෙක්. ඇයි ඔහුට වෙඩි තියලා මරන්න හේතුව. මේ රටේ වගේ ප්‍රශ්න නෙවෙයි. මම වෙඩි තිබ්බෙ එයාගේ කතාව අල්ලන්නෙ නැති නිසා කියලා වෙඩි තියපු කෙනා කියනවා. එහෙමයි ලෝකෙ දේශපාලනය සාතන සිද්ධ වෙන්නේ. මම කාටවත් දොස් කියන්නේ නැහැ. මේ අරුම පුදුම දේශපාලන වටපිටාව ඇතිවුණේ 1978 න් පස්සෙ. මේකෙදි තමයි නීතිය තුන්වැනි තැනට ගෙනැල්ලා කටයුතු කරන්න නීති සම්පාදනය කළේ. විධායකය/ ව්‍යවස්ථාදායකය/ අධිකරණය කියලා සියලු දෙනාම නීතිය එකයි කියලා කටයුතු කලා නම්, මේ දේවල් මේ විදියට වෙන්නේ නෑ කියන එක තමයි ඇත්ත වශයෙන්ම මතක් කරන්න තියෙන්නේ.

හැබැයි සභාපතිතුමනි, ශ්‍රී ලංකාවට නම් විධායක ජනාධිපති ධුරය අහෝසි කරන්න ගත්ත තීන්දුව ඉතාම අමනෝඥ තීන්දුවක් හැටියටයි මම දකින්නේ. මේක මගේ පෞද්ගලික මතය. මම විධායක ජනාධිපති ධුරය අහෝසි කරනවට විරුද්ධයි. මොකද මේ රට ගැන දන්න කියන කෙනෙක් විදියට, වාර්ගික අර්බුදයක් තිබ්ච්ච රටක් විදිහට, රටේ එදා ඉඳලා පැවැත්ම පිළිබඳ අවබෝධයක් තියෙන කෙනෙක් ඉන්නවනම්, මතක් වෙයි. එම විධායක ජනාධිපති ධුරය අහෝසි කරලා, අනෙත් අතට 13 වන ව්‍යවස්ථා සංශෝධනයත් අහෝසි වෙනවා. දහතුන්වන ව්‍යවස්තාව නිසා තමයි ඉඩම් හා පොලිස් බලතල පවර ගන්න නොදී වැකිය තියෙන්නෙ. ඒකෙ වාර්ගික ප්‍රශ්න තියෙන රටක් විදිහට, ඉන්දියාවේ ඉන්දිරා ගාන්ධි මැරුවෙ සුවිස් ජාතිකයෝ. හැබැයි ඉන්දියාවේ මිනිස්සු කලබල වුණේ නැහැ. සුවිස් කාරයෙක් අගමැති කළා. නාමමාත්‍රික ජනාධිපති සහ විධායක අගමැති තමයි ඉන්දියාවෙ තියෙන්නේ මංමෝහන් සිං. ඒ රටේ තියෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක්. ඒ ප්‍රතිපත්තීන් එක එක අයට වෙනස් කරන්න බැහැ. ඒ නිසා කුල, ජාති, ආගම්, ප්‍රශ්න අධික රටක්. නමුත් ප්‍රශ්නයක් නැතිව පාලනය වන රටක ලබන සභාවාරයේ මොන තත්ත්වයක් යටතේ එන්න ලැබේවිද දන්නේ නැහැ. හැබැයි සුබවාදී තත්ත්වයක් යටතේ එන්න ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින්, මම මීට වඩා දීර්ඝ අදහස් ප්‍රකාශ කරන්නේ නැහැ. එහෙම නම් මගේ කතාව අවසන් කරනවා. බොහොම ස්තූතියි.

**ගරු උප සභාපති එම්. කේ. ගාමිණී සුසන්ත මහතා**

වෙනත් කරුණු යටතේ ලෝක දේශපාලනය ගැන, රටේ දේශපාලනය ගැන බොහෝ කරුණු කාරණා ගැන කියවුනා. ඉතින් මටත් සිදුවෙන්නේ, සම්ප්‍රදායෙන් බැහැර වෙලා, සභාවේ සංවර්ධනය පිළිබඳ කතා කරන්න නෙවෙයි. ඒ පිළිබඳව මගෙත් අදහස් ප්‍රකාශ කරලා කරුණු දක්වන්න.

මුලින්ම මම කතා කරන්නම්, අපේ අජිත් මන්ත්‍රීතුමාගේ කතාවෙන්, දේශපාලනය කරන්න ආවා නම්, රටේ ලෝකෙ තියෙන දේශපාලන ගැටලු වලට, ගමේ තියෙන දේශපාලන ගැටලු වලට, කිසිම දේකට සැලෙන්නේ නැතුව, තමන්ගේ දේශපාලන පක්ෂයේ ප්‍රතිපත්ති ආරක්ෂා කරමින්, කටයුතු කරන්න ඕන. මම හිතන්නේ අපේ මේ සභාවේත් මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා කිහිප දෙනෙක් ඉන්නවා. පක්ෂ දේශපාලන කටයුතුවලදී ඉදිරියේදී සක්‍රියව සහභාගී නොවී, කොට්ඨාස දේශපාලන කටයුතුවල නියැළෙන්න, තීන්දු තීරණ අරගෙන, යම් යම් මතවල ඉන්නවා. අපට පේනවා. හදිසියේ ඇතිවන, රටේ පවතින, ආණ්ඩුවේ ඇතිවන විවිධ දේශපාලන ගැටලු නිසා, මේ දෙයින් ඉවත් වෙනවා නම්, මුලින්ම මේකට සම්බන්ධ වීම විශාල වැරැද්දක්. මෙතන ඉන්න දීර්ඝකාලීන දේශපාලනයේ නියැලී සිටින මන්ත්‍රීවරුන්ගේ අත්දැකීම් දිහා බැලුවම, 1991 ආරම්භ

කල ප්‍රාදේශීය සභාව සමඟ එතුමන්ලා ප්‍රාදේශීය සභා මැතිවරණයට ඉදිරිපත් වෙලා, ඒවා ජයග්‍රහණය කරලා, රටේ පවතින අනෙකුත් මැතිවරණ වලට සම්බන්ධ වෙලා, ඒවත් අනුගමනය කරලා, දායකත්වය ලබාදීලා, යම් යම් කාලවලදී පවතින දේශපාලන ගැටලු වලට මුහුණ දෙන්න බැරි වුණා නම්, මම හිතන්නේ අද මේ කට්ටියත් නැතුව ඇති. බලන්න ඒ වගේ ආදර්ශමත් නායකයන් කිහිප දෙනෙක් මේ සභාවෙත් ඉන්නවා. එතුමන්ලගෙ අවංකත්වය සහ රටේ ලෝකෙ ආණ්ඩුවල, ප්‍රාදේශීය සභා වල, යම් යම් මතිමතාන්තර දැරුවත්, ගමේ ජීවත් වීමේදී, ගමේ මිනිස්සුන්ගේ දුක සැප බලමින්, තම කොට්ඨාස සංවර්ධනය දකිමින්, ඒවට සාධාරණ විසඳුම් සොයන, නිවැරදි, සාධාරණ දේශපාලනඥයකුට ගමේදී ගැටලුවක් වෙන්නේ නැහැ. මම හිතන්නේ අපිත් මල ගෙදර ගියාම විවිධාකාරයේ දෝෂාරෝපණය කරනවා, එක ආණ්ඩුවටත් පළාත් සභාවට, ජනාධිපතිට, අගමැතිට ඕනම කෙනෙකුට වෙන්න පුළුවන්. නමුත් ඒවට අපි අනුකූලවම කටයුතු කරනවා. මගෙන් ඇහුවම මම නං කියන්නේ ඇත්ත. රටේ ආර්ථික අර්බුදයක් තියෙද්දි, මිනිස්සු ජීවත් වන දිහා බැලුවාම, යන්තම් තේ  ආදායමේ ප්‍රගතියක් තිබෙන නිසාත්, ඒ වගේම ගෑස් ප්‍රශ්නය එතරම් අපට බලපාන්නේ නැති නිසාත්,  ගමේ මනුෂ්‍යයට යම් විසඳුමක් තිබෙන නිසා, පයින් යාම හෝ අපි ගමේ මිනිස්සුත් එක්ක සුහදව කටයුතු කරන නිසා, ගමෙන් අපට එතරම් බලපෑමක් නැහැ. අපි ගම්වල මිනිස්සුත් එක්ක ජීවත් වන නිසා, ගම්වල මිනිස්සු අපිත් එක්ක එතරම් ගැටලුවක් නැහැ. ඉතින් අපි, අපේ අජිත් මන්ත්‍රීතුමා කිව්ව වගේ පළාත් සභා නියෝජිතයන් වශයෙන්, තව මෑතකදී මැතිවරණයක් පේන්නෙ නැහැ. ව්‍යවස්ථාවත් වෙනස් කරලා, ආණ්ඩුවේ මැතිවරණ ක්‍රමයත් වෙනස් කරලා, මෑත යුගයේ දී පළාත් පාලන මැතිවරණයකට යන්න හැකියාවක් ලැබෙන්නේ නැහැ. අපට ඉදිරිපත් වෙන්න හැකියාවක් ලැබෙන්නෙත් නැහැ. මේක තමයි ප්‍රශ්නය. ඒ නිසා මේකත් එක්ක, පළාත් සභා මැතිවරණය ගැන කතා කළත්, මන්ත්‍රීවරු ගුටි කනවා. ඒක නිසා මේ රටේ සංවිධාන, අපි ඒවා විසුරුවා ගියත්, ගමේ මිනිස්සුත් එක්ක එකට ඉන්නවා. මැතිවරණයක් ආවත්, ඔබතුමාලාගේ මතිමතාන්තර අමතක කරලා දාලා, ඉදිරිපත් වී කටයුතු කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

ඊළඟට අපි දීර්ඝ වශයෙන් කතා කළා. රටේ පවතින දේශපාලන අස්ථාවරත්වය පිළිබඳව. 13 වෙනිදා හිටපු ජනාධිපතිතුමා අස් වෙනවා. ඒක විහිළුවක් වෙන්නේ නැහැ. තීරණය තීන්දුව , අපිත් ඒකට එකගයි. තමන් තීරණයක් තීන්දුවක් ගත්තා නම්, ඒ දේ වෙන්න ඕන. කල් දාන්නවත් වෙනස් කරන්නවත් මම නං එකග නැහැ. 15 වෙනිදා පාර්ලිමේන්තුව කැඳවලා, එක්කෙනෙක් යෝජනා කර ගන්නවා. 20 වෙනිදා එක්කෙනෙක් ඉදිරිපත් වුනා නම්, ගැටලුවක් නැහැ.  දෙතුන් දෙනෙක් ඉදිරිපත් වුණොත්, ඔබතුමාල දන්නවා මනාප ක්‍රමයකට යාවි. අපි කවුරුත් බලාපොරොත්තු වෙනවා. සජිත් ප්‍රේමදාස මහත්තයා ඉදිරිපත් වෙයි කියලා. අනුර කුමාර මහත්තයත්, ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමාත් ඉදිරිපත් වෙනවා කියලා ආරංචියක් තියෙනවා. කතානායකවරයා යටතේ එතුමා ජනාධිපතිවරයා බවට පත්වෙලා, රනිල් මහත්තයා ඉවත් වුනොත්, කතානායකවරයාට බලය පැවරෙනවා. රනිල් මහත්තයා ඉවත් වුනොත්, ඉවත් වෙන්නේ ආණ්ඩුවක් හැදුවට පස්සේ. රට කරගෙන යාමේදී ගෝඨාභය මහත්තයා, කවුරුහරි කියනවා නම්, එතුමා නිකම්ම නිකං ජනාධිපතිවරයෙක් කියලා, එතුමා දේශපාලන පක්ෂයෙන් ආවා කිව්වට මම පිළිගන්න කැමති නැහැ. මොකද එතුමා දේශපාලන පක්ෂයකින් ආවේ නැහැ. පක්ෂයේ ජයග්‍රහණය සඳහා එතුමාව නම් කලා. අපටත් ඔහු මහා ජයග්‍රාහකයෙක් වුණා. එතුමාව අප පිළිගත්තා. ඊට පස්සේ එතුමා ජනාධිපති වුණා. පටන් ගත්ත දවසේ ඉඳන් මෙතුමාට ගැටලු ආණ්ඩු විරෝධී, ජනතා විරෝධී උද්ඝෝෂන මොන තරම් මේ රටේ තිබුණ ද? රටේ කොහේ හෝ අස්සක මුල්ලක තිබුණා, මොකක් හෝ ප්‍රශ්නයක් හින්දා උද්ඝෝෂන කරන්න පටන් ගත්තා. එහෙම ගිහිල්ලා තමයි 09 වෙනිදා මේ විශාල ජන අරගලයක් කරන්න පටන් ගත්තේ. ඒ ජන අරගලයත් එක්ක තමයි ජනාධිපතිතුමා ඉවත් වෙන්න තීරණය කලෙ. මම හිතන්නේ එතුමට තිබුණු ප්‍රශ්නය, එතුමා ජනාධිපති වෙන්න කලින් කලින්ම එතුමාගෙ නම ගියා, එතුමා මිලිටරි කාරයෙක් කියලා. හමුදා සේවයේ හිටපු නායකයෙක් නිසා එතුමා මිලිටරි කාරයෙක් කියලයි එතුමාගේ හිතේ තියෙන්න ඇති. ඒ සැකය හා බය ගමේ ග්‍රාම නිලධාරීවරයාටත් බලයක් තියෙනවා. අඩුම ගානේ එවැනි බලයක් වත් මෙතුමා ක්‍රියාත්මක කළේ නැහැ. ඒ පිළිබඳව මම කනගාටු වෙනවා. ඉල්ලා අස්වෙලා නිකන් හිටියා. නමුත් එතුමා කළ දේට, කවද හරි ලෝකෙ ජනතාව ප්‍රශංසා කරයි. අද එවැනි කැරැල්ලක් ආව වෙලාවක, රනිල් වික්‍රමසිංහ මහත්මයා කියන

විදිහට, ඒ කැරැල්ල මර්දනය කරන්න ගන්නාවූ ක්‍රියාමාර්ග පිළිබඳ මතක් කරනවා නම්, මුලින්ම හදිසි නීතිය ගෙනාවා. ඇඳිරි නීතිය ගෙනාවා. කොට්ඨාශවලට ඇතුල් වෙන්න එපා කියලා නියෝග කළා. කඳුලු ගෑස්, ජල ප්‍රහාර ගැහුවා. ඒවායින් නවත්තන්න බැරි වුනහම, ඊළඟට තියෙන්නෙ වෙඩි තියන්න. මේ ගොඩනැගිලි වලට ඇතුළු වන විට වෙන මොනවද කරන්නේ. එයා වෙඩි තිබ්බ නම්, කී දෙනෙකුට වෙඩි තියන්න ද? වෙඩි තියන්න නියෝග දුන්න නම්, 100%ක් නැතත්, 50% ක් හරි ඒ දේ කරනවානෙ. නිල ඇඳුම් ගලවලා තියලා, නිලධාරී කිහිප දෙනෙකුත් දෙපැත්තකට වුනා. නමුත් ඒ 100% ක් එහෙම වෙන්නේ නැහැ. නමුත් ඒ ඉන්න පිරිසෙන්, එය ක්‍රියාත්මක කළා නම්, අද රට ලේ විලක් වෙලා. ඒ විතරක් නෙවෙයි. ගමේ මහජන නියෝජිතයටයි, මරණාධාර සමිතියෙ සභාපතිවරයාටයි, ගමේ හාමුදුරුවන්ටයි, රාජ්‍ය නිලධාරීන්ටයි වෙඩි කන්න වෙනවා. ගෙවල් ගිනි තියාගන්න වෙනවා. මතක තියාගන්න. මේ කැරැල්ල උග්‍ර වෙන්න හේතු සාධක රාශියක් තිබුණා. අද උදේ ඉඳන්ම රූපවාහිනී චැනල් වල සජීව ක්‍රියාත්මක වුණා. දුරකථන මාර්ගයෙන් ක්‍රියාත්මක වුණා. මොනතරම් ක්‍රියාත්මක වුණා ද කියනවා නම්, මිනිස්සු එකතු කරගන්න ඒ විපර්යාසයකට ලක් වුණා. තමුන්නාන්සේලා කොළඹ ගිහිල්ලා, මේ රැස්වීමට සහභාගී වෙලා එනකොට, මමත් එදා විවාහ මංගල්‍යයකට සහභාගි වෙලා, බද්දේගම entrance එකේ හිටියෙ. මිනිස්සු දහස් ගණනක් රැස්වෙලා පොලු තියාගෙන හිටියා. කවුද මේකට සහභාගි වෙලා ඉන්නේ කියලා බලං ඉන්නවා. ගහන්න. මරන්න. තාක්ෂණයේ දියුණුවත් සමග ඒ වගේ තත්වයක් රටේ ඇති වුනා. ඒ නිසා මේ රට අරාජික වෙන්නෙ, මේ ජනාධිපතිවරයා සහ අනෙකුත් නායකයින් නිසා තමයි.

ඊළඟට මේ අභියෝගය මෙහෙම ක්‍රමවේදයක් රටේ ඇතිවෙලා තියෙනවා. මේක මෙතනින් කෙලවර වෙන්නේ නැහැ. මේ අරගලයෙන් රටේ යම් යම් ප්‍රශ්න හා ගැටලුවලට විසඳුම් ලැබෙන්නේ නැහැ. මේ ප්‍රශ්නය ඉවර වෙන්නෙ නැහැ. ඊළඟට ජනාධිපතිවරයෙක් අගමැතිවරයෙක්, පත් වුණත් රටේ යම් ප්‍රශ්නයක් ඇති වුණොත්, කොටසක් පාරට බහිනවා. ඒ වගේම මහජන අරගලයට පිටිපස්සෙ හිටපු අයට, ප්‍රතිවිපාක ලැබෙන්නත් පුළුවන්. මේක හරියට නොකෙරුවොත් ජනතාව මෙහෙම අරගල කරන්න පටන් ගත්තොත්, මේ රට යන්නෙ කොහාටද? ඉදිරි අනාගතයක් ගැන හිතාගන්න බැහැ. මේ ප්‍රජාතන්ත්‍රවාදී සියල්ල විනාශ වෙලා තියෙන්නේ. චම්පික රණවක මැතිතුමා හොඳ කතාවක් කියනවා. ඊයෙ මහජන අරගලයට ඉදිරිපත් වෙච්ච අයට මේ රට කරන්න ඕන නම්, ප්‍රජාතන්ත්‍රවාද ප්‍රවේශයට ඇතුළත් වෙලා, මැතිවරණයට ඉදිරිපත් වෙලා, මේ ක්‍රමයට එන්න. දැන් අළුතෙන් ව්‍යවස්ථාවක් හැදුවත්, මේ ක්‍රමය තමයි කරන්න වෙන්නේ. සිස්ටම් එක වෙනස් කරන්නත්, මේ ව්‍යවස්ථාවට අනුකූල වෙන්න ඕන. ඒ නිසා මම කියන්නේ, මේ ප්‍රජාතන්ත්‍රවාදය මිසක් අපට වෙන ක්‍රමයක් නැහැ. මේ අරගලයට ඇතුළු වෙච්ච අයටත්, මේ ප්‍රජාතන්ත්රවාදය ලෝකෙම යන ක්‍රමවේදයකට තමයි අපට යන්න වෙන්නෙ. ඒ නිසා අපි මේ අවස්ථාවේදී ගොඩක් කරුණු කාරණා කතා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. ඒ වගේම මේ සභාවේ නැවත වරක් රැස්වීමක් තියන්න අවශ්‍ය නැහැ. මම හිතන්නේ මන්ත්‍රීවරු කැමති වුණා. අදහනාගාරය සම්බන්ධව ණය යෝජනා ක්‍රමයකට යන්න. ඒ සම්බන්ධව විරුද්ධත්වයක් තියෙනවා නම්, මේ වෙලාවෙදි ප්‍රකාශ කරන්න. ඒ වගේම තල්ගස්වල වෙළෙඳ සංකීරණයත්, ඒකේ සැලැස්මක් ඇඳල තියෙනව නම්, ඒ කඩ කාමර බදු ක්‍රමයකට යන්න. ඒවා හොඳ නම් මේ සභාවේ අනුමැතිය ගෙන ක්‍රියාත්මක කරන්න කියල ඉල්ලමින්, ඉස්සරහට මේ සම්බන්ධව රැස්වීමක් අවශ්‍ය නොමැති බවත් ප්‍රකාශ කරමින් , ඒ සභාපතිවරයා ගෙනා යෝජනාවම න්‍යාය පත්‍රානුකූලවම ස්ථිර වුණා කියලා, ක්‍රියාත්මක කරන්න ඕන. නැත්නම් තවත් මාසයක් ප්‍රමාද වෙනවා. අනුමැතිය ගන්න කියා ගරු සභාපතිතුමාට මතක් කරමින් ඉදිරි දින කිහිපයේදී රටේ අනාගතය විසඳන විදිහක් ක්‍රියාත්මක වෙයි. රට බාර ගන්න කොටම, රනිල් වික්‍රමසිංහ අගමැතිතුමත්, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා හදපු ආණ්ඩුවෙන් විශාල කාර්යයක් සඳහා, මාස ගානකට ඒ අත්‍යවශ්‍ය භාණ්ඩ ද්‍රව්‍ය ගෙන්නන්න කටයුතු කරල තියෙනවා. ඒවත් එක්ක තමයි අලුත් නායකත්වයට බාර ගන්න වෙන්නේ. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා තව මාස තුනකට පස්සෙ මේවා වෙන්නේ කොහොමද කියල, රට ගොඩ ගන්න කොහොමද, අපි විශ්වාස කරනවා ඉන්න කට්ටිය ඒවට පිළිතුරු සොයා ගනී කියලා. ඒ වගේම තමයි නිරතුරුවම රාජපක්ෂවරුන් හොරු කියලා තමයි මේ ආණ්ඩුව පෙල්ලන්න හදන්නෙ. ඔය හොරු කියන කතාව දැන් අවුරුදු 10- 15 ක් තිස්සෙ කියනවනේ.

නාකියාදෙනිය වත්තත් රාජපක්ෂ කෙනෙක්ගෙ ලු. රත්තරං අශ්වයෙක් තිබුනලු. රටවල් වල ගෙවල් තිබුනලු. හැබැයි ඕවා හැමදාම හංගං ඉන්න බැහැ. මම කියන්නේ ඊළඟ රජයක් පත්වුනාම, රාජපක්ෂවරු හොඳද? නැද්ද කියන එක පිළිබඳව පෙන්වන්න. අවසාන වශයෙන් අජිත් මන්ත්‍රිතුමා කිව්වා වගේ, තව අවුරුදු දහයක් ගියත්, ඔය බෝලෙ උඩට එන්න පුලුවන්. ඒ නිසා දැන්මම නායකයෝ පත්කර ගන්නත්, අරගලයට ගිහිපු අයටත් මුලින්ම කරන්න ඕන, පසුගිය ආණ්ඩුවෙ රාජපක්ෂවරු හොරු ද නැද්ද කියන එක පිළිබඳව සොයා බලලා ඔප්පු කරන්න කියල ඉල්ලා සිටිනවා. ස්තුතියි.

**ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව**

ගරු උපසභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුන්ගෙන්, මන්ත්‍රීවරියනි, අද ඇත්තටම මන්ත්‍රීවරුන්ගෙන් ඉදිරිපත්වූ අදහස් වටිනා අදහස් හැටියට මා පිළිගන්නවා. මොකද ඒ සියලු දෙනාගේම අදහස් වර්තමාන අර්බුදකාරී තත්ත්වය යටතේ උද්ගතවූ අදහස් ලෙස මම ප්‍රකාශ කරන ගමන්, අද සභාවට පැමිණීමට නොහැකි වූ සුභාෂි මන්ත්‍රීතුමියගේ, එම් එම් දිසානායක මන්ත්‍රීතුමාගේ හා තරංග මන්ත්‍රීතුමාගේ නිවාඩු අනුමත කර දෙන ලෙස යෝජනා කරමි. ඒවගේම අද සභාවේ දී බොහෝ මන්ත්‍රීවරුන් ගෙන් අදහස් ප්‍රකාශ වුණා. වර්තමාන අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ නිවසට, අරගලකාරයින් විසින් ගිනිතබා අලාභහානි කිරීම, මේ අවස්ථාවේදී මම ඒ පිළිබඳව වැඩිදුර යමක් කතා කරන්න අදහස් කරන්නේ නැහැ. ඒ පිළිබඳව පරීක්ෂණ පවත්වන බැවින්. ඒ පිළිබඳව අප සමස්ත සභාවෙම, එම ක්‍රියාව සම්බන්ධව විරෝධය පළ කරනවා. හෙළා දකිනවා.

ඒ සමඟම මම ප්‍රකාශ කරන්න ඕන. වනිගරත්න මන්ත්‍රීතුමාගේ බල ප්‍රදේශයේ ක්‍රියාත්මක කළ (ගම සමග පිළිසඳර) ව්‍යාපෘතිය පිළිබඳව. මීට සභා වාර දෙකකට පෙර මෙම ව්‍යාපෘතිය සම්බන්ධ ගෙවීමක්, සභාවට ඉදිරිපත් කළ අවස්ථාවේ, එහි ඇති ගැටලු සහගත තත්ත්වයක් යටතේ එම ගෙවීම් අනුමත නොවීම, එම අවස්ථාවේ එම කාරණය සම්බන්ධ වනිගරත්න මන්ත්‍රීතුමා සභාවේ නොසිටි නිසා, ඒ සම්බන්ධව කරුණු කාරණා සභාව වෙත දැනුම් දෙන්න නොහැකි වුනා. නමුත් මෙම ව්‍යාපෘතිය සභාව සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ගිවිසුම්ගත ව්‍යාපෘතියක්. එම මුදල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ප්‍රතිපූර්ණය වන තුරු, මිලදී ගත් භාණ්ඩ වලට මුදල් ගෙවීමට අපි බැඳී සිටිනවා. ඒ අනුව තමයි, මා පෙර ඉදිරිපත් කළ ගෙවීම් වාර්තාව සභාවට ඉදිරිපත් කළේ. ඒ අනුව අද වනිගරත්න මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ කරුණු, එදින සභාවට පැමිණ කළා නම්, එම ප්‍රශ්නය මේ තරම් දුරට යන්නේ නැහැ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් එම මුදල් ලැබෙන තුරු අදාල කොන්ත්‍රාත් කරුට සභාවෙන් මුදල් ගෙවීම නීති විරෝධී නොවන බව මම ප්‍රකාශ කරන්න කැමතියි.

මන්ත්‍රීවරුනි, ඉදිවන ආදාහනාගාරය පිළිබඳවත් සභාවේ ප්‍රකාශ වූ කරුණු අනුව, එහි වර්තමාන තත්ත්වය මම පැහැදිලි කරන්නම්. ඔබතුමාලා අහනවා. අපි සභාවෙන් පාරට කොයිතරම් මුදලක් වියදම් කළාද? එහි ප්‍රයෝජනය මොනවද කියලා. මම පළමුවෙන්ම කියන්න ඕන. මේ වියදම් කළ සෑම සතයක්ම සභාවේ අනුමැතියට යටත්ව, සභාවේ අනුමැතියට යටත්ව වියදම් කල බව. මගේ පෞද්ගලික ඕනෑ එපාකම් වලට වියදම් කරපුවා නෙවෙයි. දැනට මෙම ආදාහනාගාරය වෙනුවෙන් ලක්ෂ 130ක පමණ මුදලක් වැයකර තිබෙනවා. අවසන් කළ වැඩ වලට, තව ලක්ෂ 400 ක් පමණ වැඩ ඉතිරිව තියෙනවා. මේ වන විට ඉතිරි වැඩ කිරීම සඳහා අවශ්‍ය මුදල් ලබා ගැනීම ප්‍රමාද වී තියෙනවා. වර්තමානයේ ඇති වී ඇති මූල්‍ය අර්බුදය නිසා. මම මේකත් ප්‍රකාශ කළ යුතුයි. ඔබතුමාලා අහවි ඇයි එම මුදල් ප්‍රමාද කියලා. ගරු මන්ත්‍රීවරුනි, අපට මෙම ව්‍යාපෘති සඳහා මුදල් ලැබුණේ 2021 වර්ෂයේ අයවැය මගින්. එම මුදල් 2021 වර්ෂයෙන් අවසන් වන බවයි අපට අමාත්‍යාංශ නිලධාරීන් පවසන්නේ. ඔවුන් කියන්නේ 2022 අලුත් අයවැයෙන් වෙන්කරන මුදල් වලින් තමයි ඉතිරි මුදල් ලබා දෙන්න වෙන්නේ කියලා. නැත්නම් දේශීය ණය අරමුදලින් ණයක්

හරි ලබාගෙන කටයුතු කරන්න කැමැති නම්, ඒ සඳහා සහය දෙන්න සූදානම් කියලා. එවිට මම එතුමන්ලාට ප්‍රකාශ කළා. අප සභාව අඩුආදායම්ලාභී සභාවක්. අපට ලොකු ණයක් අරගෙන ගෙවීමට හැකියාවක් නැහැ කියලා. එවිට එතුමලා කිව්වෙ, කාලය දීර්ඝ කරලා, අඩුම පොලී ප්‍රතිශතයකට ණය ලබාදෙන්න කටයුතු කරන්නම්. එහෙම කැමැත්ත තිබේනම්, සභාවට ඉදිරිපත් කොට, අනුමත කර, ආණ්ඩුකාරතුමා මගින් අමාත්‍යාංශය වෙත අයදුම්පත් එවන්න කියලා. මම මීට ප්‍රථම ගිය සභාවේ දී මේ ගැන දැනුවත් කලහම, ගරු නන්දන මන්ත්‍රීතුමා ප්‍රකාශ කළේ, සභාවේ වෙන කිසිම සංවර්ධනයන් නොකලත්, ණයක් හරි අරගෙන ඉදි කර ගෙන යන ආදාහනාගාරය ඉදිකර අවසන් කරන්න කියලා. ඒ අනුව තමයි, මම මේ පිළිබඳව උනන්දුවෙලා, කොළඹ අමාත්‍යාංශය වෙත ගොස් අදාළ නිලධාරීන් හමුවුණේ. කෙසේ වෙතත් ඔවුන් අපට ණය දෙන්නෙ, අපට ගෙවාගන්න පුළුවන් නම් පමණයි. දැනට ඉදිරි වැඩ සඳහා වර්තමානයේ මිල ගණන් අනුව ඇස්තමේන්තුවක් සකසමින් ඉන්නේ. ප්‍රධානම දේ ගොඩනැගිල්ලේ වැඩ අවසන් කිරීම. පාර සහ වාහන නැවතුම් පල වෙනුවෙන්, යම් මුදල් ප්‍රමාණයක් ලබාගැනීමට, පළාත් සභාවෙන් ඉල්ලීමක් කරනවා. ඇත්තටම ගරු මන්ත්‍රීවරුනි, ඔබ අපි කිසි කෙනෙක් නොසිතපු දේ වර්තමානයේ සිදුවන්නේ. මා මේ සිදුවීම් කලින් දන්නවා නම්, මේ කිසිම දෙයකට අත ගහන්නෙ නැහැ. සභාවේ මුදල් මේ වෙනුවෙන් වියදම් කරන්නෙ නැහැ. කවුද දන්නෙ මෙහෙම කාලයක් ඒවි කියලා. මට මේ අවස්ථාවේ මතක් වෙනවා එච්.ආර් ජෝතිපාල මහත්මයගේ සිංදුව, සිතු දේ නොමවෙයි. නොසිතු දෙයක් වෙයි. ලෝ දම් කැරකෙනවා

නමුත් ගරු මන්ත්‍රීවරුනි, අපි කෙසේ හෝ මෙම ව්‍යාපෘති දෙක ආදාහනාගාරය, තල්ගස්වල වෙළෙඳ සංකීර්ණය ජනතා අයිතියට පත් කිරීමට හැකි ඉක්මනින් කටයුතු කරනවා. එයට ඔබතුමන්ලාගේ පූර්ණ සහය අවශ්‍යයි. එය මට ලබාදෙන්න ගරු මන්ත්‍රීවරුනි. දැන් අපි බලමු වර්තමාන තත්ත්වය දිහා. අපෙ නන්දන මන්ත්‍රීතුමා කිව්වා කෙනෙක් දිහා බලන කොට, ඔහුගේ පැටිකිරිය බලන්න කියලා. ඇත්ත, එතුමා හරි. අපි ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා බලයට පත් කළේ එතුමාගේ අතීත ක්‍රියාකාරකම් දැකලා. එයට සතුටු වෙලා. මොකද එතුමා ආරක්ෂක ලේකම් වෙලා සිටියදී, අපි හිතුව දේ කලා. නගර සංවර්ධනය කලා. ඒක තමයි අපි එතුමා පත් කරන්න 69 ලක්ෂයක් ඡන්දය දුන්නේ. අපේ සමන් මන්ත්‍රිතුමා යම් විරෝධතාවක් දැක්වූවත්, ඔබතුමාගේ ගමට කාපට් දාලා, සේරම කළේ එතුමා ආපු නිසා. වෙනත් ජනාධිපතිවරු නොකල ක්‍රමයකට, අඩු වියදමින් කරන්න ගියා. ඉතින් අපි ඒ ගැන හරි සතුටු වුණා. මේ උඩුගමට ඇවිල්ලා අපට හුඟක් දේවල් ලබා දෙනවා කියලා ගියා. අපිත් බලාපොරොත්තු වුණා. නමුත් අපේ අවාසනාවට, ලෝකෙම වෙලා ගත් කොරෝනා වසංගත තත්ත්වය තුළ තමයි හැම විනාශකාරී දෙයක්ම වුනේ.

ගරු මන්ත්‍රීවරුනි, මා අසා ඇති පරිදි, අප රට විදේශ ණය වශයෙන්, වර්ෂයකට ඩොලර් බිලියන 20 ක් ගෙවීමට සිදුවෙනවා. එය අපි කළමනාකරණය කර ගත්තේ, අපේ විදේශ ශ්‍රමිකයන්ගෙන්, විදේශ සංචාරකයින්ගෙන් සහ අපනයන භාණ්ඩ වලින්. නමුත් කොරෝනා වසංගත තත්ත්වය හමුවේ, මේ සියල්ල අක්‍රමවත් වූ නිසා, වර්තමානයේ ඇති වී ඇති ඩොලර් අර්බුදයට නොසිතු ආකාරයට මුහුණ දෙන්න සිදුවුණා. මෙම කාරණයට, ඍජුවම දේශපාලන ප්‍රජාවට වැරදියි. මෙය දැන දැන සත්‍ය එළි නොකිරීම නිසයි, අපට මේ තත්වෙට එන්න වුනේ. මෙයට 90% ඉහළ අමාත්‍යාංශ නිලධාරීන් ද වගකිව යුතුයි කියලයි මම හිතන්නෙ. උදාහරණයක් විදියට මෙම ආයතනයේ රාජකාරි කරන නිලධාරීන්, තමන්ගේ රාජකාරිය නිසියාකාරව ඉටු නොකළොත්, වැරදි අහන්න සිදුවෙන්නේ සභාපති හැටියට මට.

ගෝඨාභය ජනාධිපතිතුමා හෙට විශ්‍රාම ගියත් අපිට සතුටු වෙන්න නැහැ. මොකද එතුමාට මේ කටයුත්ත කරන්න නොදීම පිළිබඳ කනගාටුවක් තියෙනවා. මොකද යම් දෙයක් එතුමාලා කලා. මහින්ද මහත්තයට අපි ආදරේ මොකද? මේ රට යුද්දෙන් බේරගත්තා. ගෝඨාභය මහත්තයටත් අපි ආදරෙයි. මොකද මේ කොරෝනා වසංගතයෙන් රට මුදා ගන්න විශාල උත්සාහයක් දැරුවා.

අපි තවමත් මේ මාස්ක් දාගෙන ඉන්නේ. එතුමා ඒ පුරුද්ද අපට ඇති කළා. සනීපාරක්ෂාව වෙනුවෙන්. බලන්න ඉන්දියාවේ තවමත් මිනිස්සු කොරෝනා නිසා වැටි වැටි මැරෙනවා. තවමත් අපට මෙහෙම රැකෙන්න පුළුවන් වූ නිසා තමයි, තවමත් ගෝඨාභය මහත්තයට අපි ආදරේ. අපට වුණේ මෙන්න මේකයි. මන්ත්‍රීවරුනි, ඒ අර හාවට වෙච්ච දේ තමයි. අරගල භූමියේ හිටපු අයත් ඒ වගෙයි. නිදාගෙන හිටපු හාවට සද්දයක් ඇහුනා. හාවා නිදාගෙන ඉන්නකොට කොලයකට මොකක්ද වැටිලා, ඒ සද්දයට ලෝකය පෙරලෙනවා කියලා දිව්වා. ඒ වගේම මිනිස්සු සියලුදෙනාම අරගලයට ආවට, මිනිස්සු දන්නෙ නෑ මොකක්ද වුනේ කියලා. අරගලයෙන් මතුවී ආපු සිද්ධීන් හරිම කණගාටුයි. මම හෙළාදකිනවා. මාධ්‍යවේදියෙක් මාත් එක්ක කිව්වා. අරලියගහ මන්දිරයත් ඉවරයි, ජනාධිපති මන්දිරයත් ඉවරයි. ජේ.ආර්. මහත්තයාගේ වාහනයක් තිබුණා. එකෙත් කෑලි ගලවන් ගිහිල්ලා කියලා. මම දන්නෙ නැහැ. නියම ආදරණීය අරගලකරුවන් ඇති. නමුත් විනාශකාරී පිරිසකුත් ඉඳලා තියෙනවා. වලපනේ සුමංගල හිමිට ගැහුවා. විමල් වීරවංශ මහත්තයාට ගහන්න ගියා. අපි දන්නේ නැහැ. හෙට අනිද්දට අනුර කුමාර මහත්තයටත් ගහයිද දන්නෙ නැහැ. මොකද මිනිස්සු හරි අමුතු මානසික මට්ටමකින් ඉන්නේ. මොනම කෙනෙක් රටේ ජනාධිපති වුණත්, අගමැති ධූරය භාර ගත්තත්, රටේ නීතිය තියෙන්න ඕන. නීතිය නැති වුණොත් රටේ ඇතිවන තත්ත්වය හිතාගන්න බැහැ. ගරු මන්ත්‍රීතුමියන්ලාට/ කාන්තාවන්ට පාරේවත් යන්න බැහැ. කාටද කියන්නේ? අපි කවුද කතා කරන්නෙ? මේවට කවුද උත්තර දෙන්නේ? මේ වෙලාවේ සියලුදෙනාම ඇත්ත ඇති සැටියෙන් කතා කරන්න ඕන. තමන්ගේ බලලෝභීත්වයෙන් කටයුතු කරන්න නරකයි. ගෑස් තෙල් පොහොර අර්බුද මේ වර්ජනකාරී රාජ්‍ය සේවකයෝ කියනවා. තෙල් නැතුව වැඩට එන්න බැහැ කියලා. නමුත් රාජ්‍ය සේවකයින්ට එහෙම කියන්න අයිතියක් නැහැ. එයාලා පත්වීම් ගන්නකොට, මට තෙල් නැතුව වැඩට එන්න බැහැ කියලා කියලා නැහැ. රටේ ඕනෑම ප්‍රදේශයක ඉඳලා ඇවිල්ලා, රැකියාව කරන්න එයාල බැඳිලා ඉන්නවා. නමුත් වර්තමාන තත්වය අනුව ඒක වෙනස් වෙලා තියෙනවා. මොකද පොදු ප්‍රවාහන සේවය නොමැති නිසා, ඒවයි වැරැද්දත් මේ පාලකයන්ට යන්න ඕන. මොකද වෙලාවට ප්‍රතිකර්ම යෙදුවෙ නැහැ.

මේ වෙලාවේ මට මතක් වෙනවා ජපන් රට. පසුගියදා රුදුරු මිනිසකුගේ වෙඩි පහරින් මිය ගිය ජපන් අගමැතිතුමා වෙනුවෙන් කනගාටුව පළ කරන ගමන්, එතුමගේ රටේ පොදු ප්‍රවාහන සේවය, ලෝකයේ තියෙන හොඳම ප්‍රවාහන සේවය. තත්පරයක්වත් නොවෙනස්ව වෙලාවට ප්‍රවාහන සේවා පවත්වාගෙන යනවා. එවැනි තත්ත්වයකට යන්න ලංකාවට කවදා හැකි වේදැයි කියා සිතෙනවා. සෞභාග්‍ය දැක්මේ මේ පොදු ප්‍රවාහන සේවා සම්බන්ධව තියෙනවා. ඒවා ඉටු කිරීමට ගෝඨාභය ජනාධිපතිතුමාගේ සිතේ තියෙන්න ඇති. නමුත් කොරෝනාව එයට හරස් වුණා. ගරු වනමල් මන්ත්‍රිතුමාට මම කියනවා. රටේ නායකයන්ට කතා කරන විට ගරු කරන්න ඉගෙන ගන්න කියලා. ඒක තමයි තමන්ගේ මහත්මාකම. ගෝඨාභය ජනාධිපතිතුමාගේ වටිනාකම ඉදිරියේදී තේරේවී.

ඒ වගේම මන්ත්‍රීවරුනි, මේ අර්බුද අස්සෙ හොරකම් වැඩි වෙලා. ඒ පිළිබඳව වැඩි අවධානයකින් පසු වන්න කියලා කියනවා. මේ පසුගිය දිනක, අප සභාවේ, පරණ පාපැදියක් හොරු අරන් ගොස් ඇති බව දැනගත්තා. පරණ පෙර පාසල තිබුණු ගෙයි තිබිලා. පොලීසිය දැනුවත් කළා. නමුත් තවම හොරු සොයා ගැනීමට බැරි වුණා. මේ වන විට රාත්‍රි කාලයේ, ගැටුම්, මංකොල්ලකෑම්, අපචාර ක්‍රියා වැඩි වෙමින් පවතින බව පොලිසියෙන් දැනුම් දී තියෙනවා. ඒ අනුව බල ප්‍රදේශයේ මාර්ගවල ඇති අනාරක්ෂිත ස්ථාන වල වීදි පහන් සවි කිරීම කරන ලෙස මා දැනුවත් කළා. ඒ අනුව ඉදිරියේදී වීදි පහන් කට්ටල මිලදී ගැනීමට කටයුතු කරනවා. ඒ වගේම බයිසිකල් ලියා පදිංචි කිරීම සම්බන්ධව කතා කළ නිසා, ඉදිරියේ දී ඒ පිළිබඳව කටයුතු කරනවා. වර්තමානයේ රු. 4.00 කට තමයි ලියාපදිංචිය සිදු කරන්නේ. එය මීට අවුරුදු ගානකට පෙර සම්මත වූ මුදලක්. වර්තමානයට එය ගැලපෙන්නෙ නැහැ. ඒ සංශෝධනය කොට ඉදිරියේදී ඉදිරිපත් කරමු යැයි ඉල්ලා සිටිනවා. අද දින සභාවට පැමිණි ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයට සහ

ලේකම්තුමියට ස්තුතිවන්ත වෙමින්, සැමට සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරමින්, අද සභාව මෙතනින් අවසන් කරනු ලබනවා. බොහොම ස්තූතියි.

සභාපති,
නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී දිනය:-